ISSN 1391 - 1031
2019 ජුනි
25 වෙළුම 02 කලාපය
ආධාරය රු 40/=

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී

"මාක්ස්වාදය අරාජිකවාදයට වඩා වෙනස්ය. එය සාමාන්‍ය වශයෙන් විප්ලවවාදී අවදියකදී රාජ්‍යයක් හා රාජ්‍ය බලය තිබීමේ අවශ්‍යතාවය, විශෙෂයෙන්ම ධනපති ක්‍රමයේ සිට සමාජවාදයට පරිවර්තනය වීමේ කාල පරිච්ඡේදයේදී එය තිබීමේ අවශ්‍යතාවය පිළිගන්නේය."

**ලෙනින්,**
**තෝ: කෘ: 5 වෙළුම**
**46 පිටුව**

# රටේ සම්පත් බිලිදීම තවදුරටත්

# නැගෙනහිර ජැටියටත් අත තබයි

**කොළඹ වරායේ වැදගත්ම කොටසක් වූද විශාල නැව් පැමිණිය හැකි ලෙසට නවීකරණය කර තිබුණාවූද ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් නැගෙනහිර බහාලුම් පර්යන්තය ඉන්දියාවට සහ ජපානයට පැවරීමට ආණ්ඩුව විසින් පසුගිය 28දා ගිවිසුම් අත්සන් කරනු ලැබ තිබේ.**

මෙම ජැටිය ලංකා බැංකුවේ ඩොලර් මිලියන 80ක ණය මුදලක ආධාරයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් 2015දී නවීකරණය කර තිබූ අතර එහි ඉතිරි වැඩකටයුතු අවසන් කිරීම සඳහා වෘත්තීය සමිති විසින් ආණ්ඩුවට යෝජනාද ඉදිරිපත් කර තිබිණි. කෙසේ වුවද එම යෝජනා නොසලකා හැර තිබූ ආණ්ඩුව හදිසියේම ඉන්දියානු මහකොමසාරිස්වරයා, ජපාන තානාපතිවරයා හා වරාය ඇමතිවරයා අතර අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුමක් මගින් එහි කළමනාකාරිත්වය එම රටවලට පවරා දී ඇත.

මේ වන විට කොළඹ වරායේ 'සවුත් ඒෂියා ගේට්වේ' බහාලුම් පර්යන්තය ජෝන් කීල්ස් සමාගම මගින් පාලනය වන අතර 'කලම්බු ඉන්ටනැෂනල්' බහාලුම් පර්යන්තය චයිනා මර්චන්ට් හෝල්ඩිං සමාගම මගින් පාලනය වේ.

ආණ්ඩුවේ මෙම හදිසි තීරණයේ විශේෂත්වය වන්නේ ඉන්දියානු මැතිවරණයේ ප්‍රතිඵල අනුව මෝදි නැවතත් අගමැති ධුරයට පත්වන බවට ස්ථිර වෙමින් තිබියෙදී ඉන්දියානු බලපෑම මත මෙම ගිවිසුමට එළඹ තිබීමය.

නව ලිබරල්වාදී ආර්ථික ක්‍රමය ඉදිරියට ගෙනයාම හැරෙන්නට වෙනත් විකල්පයක් නොමැති මෛත්‍රී - රනිල් ආණ්ඩුව සිදුකරමින් සිටින්නේ කුමන නාමකරණයක් යටතේ හෝ ස්වභාවික සම්පත් සහ රාජ්‍ය දේපළ විකුණා දැමීමය. රාජ්‍ය දේපළක් ලෙස තබාගනිමින් ලාභ ලැබිය හැකිව තිබූ මෙම නැගෙනහිර බහාලුම් පර්යන්තය විදෙස් රටවලට පැවරීමද එහිම දිගුවක් මිස වෙනකක් නොවේ.

මේ පිළිබඳව නියමුවා කරන ලද විමසුමකට පිළිතුරු දෙමින් ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික බිමල් රත්නායක සහෝදරයා ප්‍රකාශ කළේ චීනය කොළඹ වරාය ආශ්‍රිතව ස්ථාන ගත වීම නිසා ඉන්දියාවටද එහි ස්ථානගතවීමේ බලවත් වුවමනාවක් තිබූ බවත් ආණ්ඩුව මේ ගිවිසුම මගින් එම අවශ්‍යතාවය ඉටුකර දී ඇති බවත්ය.

**02 වැනි පිටුවට**







'ජාතික සමඟිය ගොඩනගන සම්මන්ත්‍රණ මාලාව'
කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේදී - 2019.05.11


**03 දේශපාලන 'ඔළුබක්කන්...**



සංකීර්ණ සමාජ අර්බුද විසඳීමට තනි පුද්ගල චරිතවලට නොහැක. එවැනි දේ දැකිය හැක්කේ...

**07 අන්තවාදී ප්‍රහාරයෙන්...**



දැනටත් 3.2%ක ආර්ථික වර්ධනයක් පමණක් ඇති ශ්‍රී ලාංකේය ආර්ථිකය සිංහල, දෙමළ, මුස්ලිම් ලෙස බෙදිය...

**09 සමාජවාදී රටක...**



1962දී පමණ සෑම සෝවියට් පවුලක්ම ස්වකීය ආදායමෙන් සෑම රූබල් 100කින්ම රූබල් 4ක් ඉතිරි...

**11 නූතන පවුල හා...**



පවුල පෞද්ගලික දේපළ මත පදනම්ව පවතිනතාක් හා ඒ තුළ ස්ත්‍රියට එරෙහිව පුරුෂයාගේ ආධිපත්‍යය පවත්නාතාක්...

තරුණ.................. 04
සංවාදය.................. 05
ආවර්ජනා.................. 06
ජාත්‍යන්තර.................. 08
කාන්තා.................. 10
කාලීන.................. 12
වේදිකාව.................. 13
විශේෂ.................. 14


**යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!**

## පාලනාධිකාරියට එරෙහිව විදුලි සේවකයෝ කොළඹට



ලංවිම පාලනාධිකාරිය විසින් 2015 වසරේදී සිදු කරනු ලැබූ අත්තනෝමතික වැටුප් වැඩිකිරීම නීති විරෝධී බවට අධිකරණය ලබාදුන් තීන්දුව අතික්‍රමණය කරමින් වර්තමාන පාලනාධිකාරිය කටයුතු කරන්නේයැයි ලංකා විදුලි සේවක සංගමයේ ප්‍රධාන ලේකම් රංජන් ජයලාල් සහෝදරයා පවසයි.

ඔහු මේ බව පැවසුවේ 'සාකච්ඡාවක්, සංවාදයක්, කතිකාවක් - වැටුප් අරගලයට මොකද වෙන්නෙ?' මැයෙන් පසුගියදා කොළඹ මහජන පුස්තකාලයේදී පැවති රැස්වීමකදීය. එහිදී ඔහු පැවසුවේ ලංවිම පාලනාධිකාරියේ නීති විරෝධී වැටුප් වැඩිකිරීම්වල වන්දිය ගෙවීමට සිදුව ඇත්තේ පහළ සේවකයින්ට බවත්, පසුගිය අප්‍රේල් මැයි මාසවල වැටුප නොගෙවා බහුතරයක් වූ කාර්මික ශ්‍රේණියේ සේවකයින්ට 85%ක් පමණක් ගෙවීමට කටයුතු කර ඇති බවත්ය. මෙලෙස නඩු තීන්දුව පවා අතික්‍රමණය කරමින් අනෙක් සියලු සේවකයින් මත එම වැරැද්ද පටවමින් පාලනාධිකාරිය සිදු කරනු ලබන අත්තනෝමතික ක්‍රියාකලාපයට එරෙහිව ඉදිරියේදී රට පුරා සිටින සියලු විදුලි සේවකයින් සමග ක්‍රියාමාර්ගවලට එළඹෙන බවත් මෙහිදී රංජන් ජයලාල් සහෝදරයා ප්‍රකාශ කළේය.

## සාමාජික මුදල් කොල්ලකෑ EDCS අතුරුපාලක මණ්ඩලයට දඬුවම් කරනු



පසුගිය 2009 වර්ෂයේ ලංකා ගුරුසේවා සංගමය මගින් අධ්‍යාපන සමුපකාරයේ පාලන බලය ලබාගැනීමෙන් පසු 2011 මැයි 09 දින එවකට පැවති ආණ්ඩුව නීති විරෝධී හොර අතුරු පාලක මණ්ඩලයක් මගින් පාලනය කිරීමේදී සිදුවූ විශාල වංචාවන් සම්බන්ධයෙන් දඬුවම් ලබාදිය යුතු බව ලංකා ගුරුසේවා සංගමයේ ප්‍රධාන ලේකම් මහින්ද ජයසිංහ සහෝදරයා පවසයි.

මිලියන 11000 ක පමණ ආදායමක් මාසිකව හිමිවන අධ්‍යාපන සමුපකාරයේ 2011 සිට 2015 දක්වා නිකුත් වූ විගණන වාර්තා මගින් විශාල වංචාවක් සිදුවී ඇති බව හෙළිවී ඇතැයි මෙහිදී මහින්ද සහෝදරයා පෙන්වා දුන්නේය. පසුගියදා කොළඹදී පැවති මාධ්‍ය හමුවකදී ඔහු මේ බව පැවසූ අතර එහිදී විගණන වාර්තා උපුටා දක්වමින්, සේවක පුරප්පාඩු නොතිබියේදී ප්‍රධාන කාර්යාලයට සේවකයින් විශාල ලෙස බඳවාගැනීම, ඉඩම් මිලදී ගැනීමේදී නුසුදුසු ඉඩම් මිලදී ගැනීම, වාහනවල ධාවන වාර්තා අතුරුදහන් කරමින් මුදල් කෝටි ගණන් විනාශ කිරීම සිදුව ඇති බව පැවසීය. කොල්ලුපිටියේ ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩමේ ඔප්පුව අතුරුදහන් කර ඇති බවද සමිතියට නීති විරෝධී ආයතන මගින් සැපයුම් ලබා ගෙන ඇති බවද 2013 වර්ෂයේදී එවකට මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් අරලිය ගහ මන්දිරයේදී පැවති ශිෂ්‍යත්ව ප්‍රදානයේදී ආහාර වෙනුවෙන් ලක්ෂ 19ක් වියදම් කර ඇති බවද අත්තනෝමතික ලෙස සේවකයින් සේවයෙන් පහකිරීම නිසා වන්දි ලෙස මිලියන 6ක් ගෙවීමට සමුපකාරයට සිදුව ඇති බවද 2011 සිට වසර 5ක් පුරා අවසන් ගිණුම් සකස් කර නැති බවද මෙහිදී මහින්ද ජයසිංහ සහෝදරයා පෙන්වා දුන්නේය.

මෙම මාධ්‍ය හමුව සඳහා ලංකා ගුරුසේවා සංගමයේ සභාපති දම්මික අලහප්පෙරුම, සංවිධායක ලේකම් ප්‍රියන්ත ලියනගමගේ යන සහෝදරවරුද සම්බන්ධ වී සිටියහ.

## 'ජනතාව භේද කරන අන්තවාදය එපා' වෘත්තිය සමිති එකතුවෙන් වැඩපිළිවෙළක්



අප්‍රේල් 21 පාස්කු ඉරුදින එල්ල වූ අන්තවාදී ප්‍රහාරය හා ඉන් පසු උද්ගතවූ අන්තවාදී භාවිතයන්ට තල්ලුවීමේ පරාජය කිරීම වෙනුවෙන් ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ මෙහෙයවීම යටතේ පැවැත්වූ සාකච්ඡා සභාවේදී වෘත්තීය සමිති නියෝජිතයින් එකතුවී ඉදිරි වැඩපිළිවෙළක් සකස් කිරීමට තීරණය කළ බව ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති වසන්ත සමරසිංහ සහෝදරයා පැවසීය.

'ජනතාව භේද කරන අන්තවාදය එපා' යන තේමාව සහිතව පැවැත්වූ මෙම සාකච්ඡා සභාව සඳහා ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල්කාන්ත, සමාජවාදී වතු සේවක සංගමයේ ලේකම් මහින්ද දේවගේ, රජයේ වෛද්‍ය නිලධාරී සංගමයේ මධ්‍යම කාරක සභික වෛද්‍ය නිශාන්ත සුගුණපාල, ලංකා ප්‍රගති ගුරුසංගමයේ ප්‍රධාන ලේකම් මයුර සමරකෝන්, ජාතික කම්කරු සංගමයේ ලේකම් අමාලි කලුපහන, CMU විධායක සභික ඒ.එම්. මහින්ද, රජයේ දන්ත වෛද්‍ය සංගමයේ සභාපති ආනන්ද රත්නායක, ලංකා කම්කරු සම්මේලනයේ ලේකම් රසිඩීන්, රජයේ ලිපිකරු සේවා සංගමයේ ලේකම් එස්.එස්. අත්තනායක, ශ්‍රී ලංකා දුම්රිය මැදිරි පරීක්ෂකවරුන්ගේ සංගමයේ භාණ්ඩාගාරික කේ.ඩී.එච්. ජගත්, ලංවිම පාරිභෝගික සම්බන්ධීකාරක සංගමයේ සම ලේකම් කේ. මනෝජ් ප්‍රියංකර, ලංවිම අධිකාරී සංගමයේ ප්‍රධාන ලේකම් ඒ.එම්. පත්මසිරි, ලංකා ගුරුසේවා සංගමයේ ප්‍රධාන ලේකම් මහින්ද ජයසිංහ, සමස්ත ලංකා සෞඛ්‍ය වෘත්තීය සමිති සම්මේලනයේ ප්‍රධාන ලේකම් සමන්ත කෝරලේආරච්චි, සමස්ත ලංකා වරාය පොදු සේවක සමිතියේ ප්‍රධාන ලේකම් චන්‍ද්‍රසිරි මහගමගේ, සමස්ත ලංකා දුම්රිය සේවකයින්ගේ පොදු සේවක සංගමයේ ප්‍රධාන ලේකම් එස්.පී. විතානගේ යන වෘත්තීය සමිති නායකයින් ඇතුළු තවත් වෘත්තීය සමිති ගණනාවක නායකයෝ මෙම සාකච්ඡාව සඳහා සම්බන්ධ වූහ.

## අසාධාරණ මාරුකිරීම්වලට එරෙහිව ආයුර්වේද වෛද්‍ය විරෝධතා



පසුගිය 2018 වර්ෂයේ නවක පත්වීම්ලාභීන් වෛද්‍යවරුන් 650කට ආසන්න ප්‍රමාණයක් සාධාරණ හේතුවක් නොමැතිව නැවත ස්ථානගත කිරීමට එරෙහිව ආයුර්වේද වෛද්‍යවරු සෞඛ්‍ය අමාත්‍යාංශය ඉදිරිපිටදී උද්ඝෝෂණයක් පැවැත්වූහ.

ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ 2018 වර්ෂයේ පත්වීම්ලාභී වෛද්‍යවරු 650කගේ ස්ථාන මාරුවීම් ඉතා අවිධිමත් ආකාරයෙන් සිදු කිරීමට සෞඛ්‍ය බලධාරීන් කටයුතු කරගෙන යන බව සමස්ත ලංකා රජයේ ආයුර්වේද වෛද්‍ය නිලධාරී සංගමය සඳහන් කරයි.

ඒ අනුව මෙම අත්තනෝමතික තීරණය හේතුවෙන් වෛද්‍යවරුන් බරපතළ අපහසුතාවයන්ට පත්ව ඇති බවත්, සමස්ත ආයුර්වේද වෛද්‍යවරුන්ගෙන් හතරෙන් එකකට මෙම සිදුවීම දැඩි ලෙස බලපා තිබෙන බවත් එම සංගමයේ සංවිධායක ලේකම් ආයුර්වේද වෛද්‍ය පී.ඩී.එන්.එස්.ජේ. බණ්ඩාර මෙහිදී පවසා සිටියේය.

මේ සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යවරයා සමගින් සාකච්ඡාවක් සිදු කළ බවද, එහිදී සෞඛ්‍ය අමාත්‍යවරයා මෙම මාරුවීම් ලබාදීම නවත්වන ලෙසට කියා සිටියද, එම නියෝගයන් නොසලකා අදාළ බලධාරීන් විසින් මෙලෙස ස්ථාන මාරුවීම් ලබාදීමට කටයුතු කරමින් සිටින බව ඔහු වැඩිදුරටත් සඳහන් කළේය.

අදාළ ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරීම වහාම නතර නොකළහොත් දැඩි වෘත්තීය ක්‍රියාමාර්ගවලට යොමු වන බවට වෛද්‍ය වෘත්තීය සමිති අවධාරණය කරයි.

# එතෙරින්...

## WFDY මහා මණ්ඩලයට SSU



ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනයේ (WFDY) මහා මණ්ඩල රැස්වීම අප්‍රේල් මස 9, 10 සහ 11 දිනවලදී වෙනිසියුලාවේ කැරකාස් නුවරදී පැවැත්විණි. මේ සඳහා සමාජවාදී ශිෂ්‍ය සංගමය නියෝජනය කරමින් ජාතික සංවිධායක රංගන දේවප්‍රිය සහ ප්‍රජාතන්ත්‍රවාදී ලෝක තරුණ සම්මේලනයේ උප සභාපතිනි කල්පනා මධුභාෂිනී සහෝදරියද සහභාගි වූහ. මෙම දිනවලදීම වෙනිසියුලාවේදී පැවැත්වෙන වෙනිසියුලාවට සහාය පළකිරීමේ වැඩසටහන් රැසකට මොවුන් සහභාගි වූ අතර, ශ්‍රී ලංකාවේ සාමය සහ සහයෝගිතාවය (PASOS) සංවිධානය නියෝජනය කරමින් සුදත් අධිකාරි සහෝදරයාද ඊට සම්බන්ධ විය.

## වෙනිසියුලාවට අත නොතබනු! ජ.වි.පෙ. - රෝමයේදී උද්ඝෝෂණයක




වෙනිසියුලානු ජනතාවට එරෙහි සියලු අධිරාජ්‍යවාදී මැදිහත්වීම්වලට එරෙහිව විරෝධතාවය පළකිරීමේ උද්ඝෝෂණයක් පසුගියදා රෝමයේදී පැවැත්විණි. ඉතාලියේ ප්‍රගතිශීලී වාමාංශික සංවිධාන විසින් පැවැත්වූ මෙම උද්ඝෝෂණයට ජ.වි.පෙ. ඉතාලි කමිටුවේ සක්‍රිය මැදිහත්වීමක්ද සිදු කෙරිණි.

## ඕමානයේ තානාපතිගේ සේවය 'එතෙර අපි' ඇගයීමට



ඕමානයේ ශ්‍රී ලංකා තානාපති ලෙස කටයුතු කළ එම්.කේ. පත්මහානන් මහතාගේ සේවා කාලය ඇගයීමේ හමුවක් පසුගියදා ඕමාන තානාපති කාර්යාලයේදී පැවැත්විණි. එතෙර අපි සංවිධානය සමග සුහදතාවයෙන් කටයුතු කරමින් ඕමානයේ සේවය කරන ශ්‍රී ලාංකිකයින්ගේ විවිධ ගැටලු වෙනුවෙන් සිදුකළ විශේෂ මැදිහත් වීම අගය කරමින් සමරු ඵලකයක් භාරදීමද මෙහිදී සිදු කරන ලදී. මෙම අවස්ථාවට ඕමානයේ එතෙර අපි ශාඛාවේ සම්බන්ධීකාරක අසිත මොරෙමඩ සහ චින්තක සිරිවර්ධනද ඕමානයේ ජ.වි.පෙ. සංවිධායිකා නිසංසලා ලක්මාලි සහෝදරියද සහභාගි විය.

## නලින්ද ජෝජියාවේ පාර්ලිමේන්තුවට



ලෝක සෞඛ්‍ය සංවිධානයේ දුම්කොළ සීමා කිරීමේ සම්මුති වැඩසටහන (FCTC) සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) එක්ව පළමු වරට සංවිධානය කළ 'පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වූ දුම්කොළ සීමාකිරීමේ වැඩමුළුව' පසුගියදා ජෝර්ජියාවේ ටිබිලිසි අගනුවර පාර්ලිමේන්තු සංකීර්ණයේදී පැවැත්විණි. ඒ සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නියෝජනය කරමින් වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා සහභාගි වී සිටියේය.

## බංගලාදේශ නියෝජිත හා ජ.වි.පෙ. කම්කරු නායකයින් අතර හමුවක්



බංගලාදේශයේ සමාජවාදී කම්කරු පෙරමුණේ ප්‍රධාන ලේකම් රසකුසාමන් රටන් සහෝදරයා සහ ජ.වි.පෙ. මධ්‍යම කමිටු සාමාජික වසන්ත සමරසිංහ හා ජානක අධිකාරි සහෝදරවරුන් අතර හමුවක් පසුගියදා කොළඹදී පැවැත්විණි. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) වැඩමුළුවක් සඳහා පැමිණි රටන් සහෝදරයා සමග මෙම විශේෂ හමුවේදී කම්කරු සබඳතා මෙන්ම පක්ෂ අතර ඉදිරි කටයුතුද සාකච්ඡාවට ලක්කර ඇත. රටන් සහෝදරයා බංගලාදේශ සමාජවාදී පක්ෂය නියෝජනය කරයි.

## රටේ සම්පත්...

01 වැනි පිටුවෙන්

රටේ ජනතාවගේ අවධානය වෙනත් දිශාවකට යොමු වී ඇති මොහොතක ආණ්ඩුව ජනතාවට රහසෙන් හදිසියේම මෙම ගිවිසුම අත්සන් කර ඇති බව පෙන්වා දුන් බිමල් රත්නායක සහෝදරයා, රටේ සම්පත් විදේශයන්ට පවරා දෙන මෙවැනි ගිවිසුම් පරාජය කර ඒවා නැවත මහජන දේපළක් බවට පත්කර ගැනීම සඳහා රටට සැබෑ ලෙසම ආදරය කරන ජනතාව නොපමාව පෙරට පැමිණිය යුතුව ඇති බව අවධාරණය කළේය.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# ලංකාවේ ජනමාධ්‍ය අනතුරුදායකයි ...! පරිස්සමෙන් පරිහරණය කරන්න

ලංකාවේ ප්‍රධාන ධාරාවේ ජනමාධ්‍යවල හැසිරීම පිළිබඳ සමාජය තුළ විටින් විට විවේචන මතුවූයේ කලෙක සිටය. පසුගිය, අප්‍රේල් 21 දා සිදුවූ බෝම්බ ප්‍රහාරයත් සමග රට තුළ ඇවිලවීමට උත්සාහ කළ හා තවමත් උත්සාහ කරන ජාතිවාදී රැල්ල සඳහා ලංකාවේ සමහර ජනමාධ්‍ය විසින් කරනු ලබන මැදිහත්වීම ඉතාම බරපතළය; භයානකය.

ලංකාවේ ජනමාධ්‍ය ප්‍රධාන වර්ග දෙකකි. එක් කොටසක් රජයට අයිති රාජ්‍ය ජනමාධ්‍ය වන අතර, අනෙක් කොටස පෞද්ගලික ජනමාධ්‍ය වේ. අප දන්නා කලෙක සිට රජයේ ජනමාධ්‍යයන් හැසිරෙන්නේ රජයට පක්ෂපාතී ලෙසය. ඒ නිසා පවතින ආණ්ඩුව රැකීමත් ආණ්ඩුවට වාසිදායක පුවත් නිර්මාණය කිරීම හා එවැනි පුවත් පමණක් ප්‍රචාරණය කිරීමත් රාජ්‍ය මාධ්‍යවල ස්වභාවය වී තිබේ. රටේ කුමන ආණ්ඩුවක් තිබුණත් රාජ්‍ය මාධ්‍ය සිදුකරන්නේ එම ආණ්ඩුවට "කඩේ යාමය."

මේ නිසාම සමාජය තුළ රාජ්‍ය මාධ්‍ය කෙරේ තිබූ විශ්වාසය බිඳවැටුණු අතර ජනතාව පෞද්ගලික හිමිකාරිත්වය සහිත ජනමාධ්‍ය වෙත ආකර්ෂණය විය. දැන් පෞද්ගලික විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය ආයතන රැසක්ම රාජ්‍ය මාධ්‍යවලට වඩා බොරු කියන, වැරදි මත පතුරන, වගකීමක් නොමැතිව කටයුතු කරන හා කුමන හෝ දේශපාලන කඳවුරකට පක්ෂපාතීව කටයුතු කරන ඒවා වී තිබේ.

මෙහි ප්‍රතිඵලය වී ඇත්තේ කුමක්ද? පළමුවැන්න ජනතාවට සත්‍ය තොරතුරු දැනගැනීමට ඇති අයිතිය අහිමි වීමය. දෙවැන්න ජනතාවගේ ඔළු කුහර අසත්‍ය හා අතාර්කික තොරතුරු හා විග්‍රහයන්ගෙන් පිරීයාමය. තෙවැන්න ජනතාවගේ චින්තනය හැසිරවීම ජනමාධ්‍ය විසින් පැහැරගෙන එය තම දේශපාලන අරමුණු වෙනුවෙන් යෙදවීමය.

මේ මොහොත වන විට ලංකාවේ ප්‍රධාන හා ප්‍රබල ජනමාධ්‍ය ආයතන හිමිකරුවෝ පැහැදිලිවම මහින්ද රාජපක්ෂ කණ්ඩායමේ දේශපාලනය වෙනුවෙන් සමාජයේ මත හසුරුවන්නෝ බවට පත්ව සිටිති. තවදුරටත් ඔවුන් 'ස්වාධීන' ජනමාධ්‍ය නොවේ. මේ නිසාම ඔවුන් රාජ්‍ය මාධ්‍ය තරම්වත් සමාජයේ සදාචාරයට ගරුකරන්නේ නැත. ඔවුන්ගේ එකම අරමුණ තම දේශපාලන කඳවුර වෙනුවෙන් ඊට වාසි වන පුවත් මවමින් හා සොයමින් පළ කිරීමය. මෙය පැහැදිලිවම ජනතාවගේ චින්තනය හා බැඳුණු ප්‍රශ්නයක් වේ. ඔවුන් විසින් සිදුකරමින් සිටින්නේ ජනතාවගේ සිතීමේ ශක්තිය නැතිකොට ඔවුන් අතාර්කික පිරිසක් බවට පත්කොට ඔවුනට සාදා නිමකළ :ඍඪහ ජ්‍ෘ* ප්‍රවෘත්ති ගෙඩි පිටින් ඔළුවලට ඇතුළු කිරීමය.

අනෙක් අතට මේ බොහෝ මාධ්‍ය ආයතන කළු සල්ලිවලින් හෝ සාධාරණ ලෙස උපයා නොගත් මුදල්වලින් නඩත්තු වන ආයතනයන්ය. ඔවුන්ට නැවත කළු සල්ලි සෙවීමට, නැවත අසාධාරණ ලෙස මහා පරිමාණයෙන් දේපළ රැස්කිරීමට උදව්කරන පාලනය ගෙන්වා ගත යුතුය. මාධ්‍ය සදාචාරය නොසලකා ඔවුන් මෙලෙස නිරුවතින් හැසිරෙන්නේ ඒ අනුවය.

මෙය සරල ප්‍රශ්නයක් නොවේ. මේ ඔවුන් සිදුකරමින් සිටින්නේ, රටක ජනතාවගේ චින්තනය මොට කිරීමය. ෆිදෙල් වරක් කියූ ලෙසම මෙම මාධ්‍ය මඟින් සිදුකරන බරපතළම අපරාධය 'බොරු' කීම නොවේ. මිනිසුන් තුළ සාවද්‍ය පරාවර්තනයන් ඇති කිරීමය. බොරුව ඍණාත්මක බලපෑමක් කරන්නේ ජනතාවගේ දැනුම මතය. එහෙත් සාවද්‍ය පරාවර්තනය හානිකර බලපෑම් කරන්නේ ජනතාවගේ චින්තනය මතය. එනම් නිවැරදිව හා නිරවුල්ව සිතන ජනතාවක් වෙනුවට ජනමාධ්‍ය මගින් හදාදෙන ඕනෑම බොරුවක් ගෙඩිපිටින් ගිලින අතාර්කික චින්තනයක් සහිත ජනතාවක් නිර්මාණය කිරීමය.


ජන මාධ්‍යවල මෙම හැසිරීම ඉතාම අහිතකරය. මහජනතාවට අයත් විද්‍යුත් සංඛ්‍යාත යොදා ගනිමින් ඔවුන් සිදුකරමින් සිටින්නේ එක් අතකින් මානසික වහලුන් පිරිසක් බිහිකිරීමත්, සමාජයක් නොමඟ යැවීමත් හා සමාජ සාරධර්ම අමු අමුවේ බිඳ දැමීමත්ය. ජනමාධ්‍ය පරිස්සමෙන් පරිහරණය කළ යුත්තේ මේ නිසාය.

මේ වන විට ධනවාදයේ අරාජිකත්වයත්, සමාජයේ පසුගාමීත්වයත් තාක්ෂණික මෙවලම්වල දියුණුවත් නිසා නූතන ජනමාධ්‍ය මුළුමනින්ම මිනිස් සමාජයේ මිනිසාගේ චින්තනය ඔවුන්ගේ ග්‍රහණයට ගෙන තිබේ. මිනිස් චින්තනය හැසිරවීමේ අයිතිය ඔවුන් විසින් තමන් අතට ගෙන තිබේ. සමාජය, සොබාදහම හා මිනිසා අතර, අතරමැදියා වී ඇත්තේ මේ මහා ජනමාධ්‍ය සමාගම්ය. සතුට නිපදවන්නේද ඔවුන්ය. විනෝදය නිපදවන්නේද ඔවුන්ය. තරු බිහිකරන්නේද ඔවුන්ය. එසේම සමාජ මතය පාලනය කොට හසුරුවන්නේද ඔවුන්ය. ජනතාව වෙත වැරදි, බොරු හා මිථ්‍යා මත පොම්ප කරන්නේද ඔවුන්ය. සමාජයක් කන - බොන, අඳින - පළඳින දේවල සිට සිතන ආකාරයද තීරණය කරන්නේ ඔවුන්ය. ප්‍රශ්නය බරපතළ වන්නේ ඒ නිසාය.

මෙම ජනමාධ්‍යවල බලපෑම වර්තමානයේ මීට පෙර කිසිකලෙක නොතිබූ තරම් ප්‍රබලව තිබේ. එසේම පිරිහීමට ලක්ව තිබේ. එබැවින් මෙම වැරදි සදාචාර හා මානව විරෝධී ජනමාධ්‍ය ජාලවල බලපෑමෙන් සමාජයේ මිනිස් චින්තනය ගලවා ගත යුතු යුගය එළඹ තිබේ. ඒ සඳහාද මෙම හැකියාව ඇති උගතුන්, විද්වතුන් හා කලාකරුවන්, සමාජයට මත ගෙනයන්නන්, හොඳ මාධ්‍යවේදීන් පෙරමුණ ගත යුතුය. විකල්ප ජනමාධ්‍ය පෙරට ගත යුතුය. ජනතාවත්, ජනමාධ්‍යත්, ජනමාධ්‍ය ඒකාධිකාරයේ වහල්බවින් මුදාග ැනීම තවදුරටත් ප්‍රමාද කළ යුතු නැත. ජනතාව ජනමාධ්‍ය ඇසුරු කළ යුතුය. එහෙත් පරෙස්සමෙනි. මන්ද ඒවා අනතුරුදායක විය හැකි බැවිනි.

# දේශපාලන 'ඔළුබක්කන්' වෙනුවට...

ලංකාව මේ වන විට තියුණු දේශපාලන අර්බුදයකට මුහුණ දී සිටී. මාක්ස්වාදී ඉගැන්වීම්වලට අනුව ධනවාදයේ අර්බුදය ආරම්භ වන්නේ ආර්ථික අර්බුදයෙනි. මෙම ආර්ථික අර්බුදය පසුව සමාජ අර්බුදයක් දක්වා වර්ධනය වී අවසානයේ දේශපාලන අර්බුදයක් බවට පත්වේ. එය නොවිසඳී දිගු කලක් පවතින්නේ නම් ඉන් හැඟවෙන්නේ ලාංකේය ධනවාදය සමාජ ක්‍රමයක් ලෙස එහි අවසානයට ළඟාවෙමින් තිබෙන බවය. දේශපාලන පක්ෂවල අර්බුදයක් හා අසාර්ථකවීම්ද එම හිඩැස පිරිවීමට දේශපාලන ඔළුබක්කන් වේදිකා මතට පැමිණීමට දරන උත්සාහයන්ද මේ දිනවල අප දකින්නේ මේ අනුවය.



ලංකාවේ මීට පෙරද, විටින් විට දේශපාලන අර්බුද මතුව තිබේ. එහෙත් වත්මන් දේශපාලන අර්බුදය පෙර ඒවාට වඩා වෙනස් එක දිගට පවතින එකකි. මෙම අර්බුදයේ මූලය තිබෙන්නේ, ලංකාවේ ඡන්දදායකයාට පැවති ධනපති පක්ෂ දෙකම ක්‍රමානුකූලව එපා වෙමින් තිබීම තුළය. ඒ නිසා පසුගිය මැතිවරණවලදී කිසිදු පක්ෂයකට බහුතර බලයක් ලැබුණේ නැත. එහි ප්‍රතිඵලය වූයේ දුර්වල ආණ්ඩුවක් බිහිවීමය. එක් අතකින් ආණ්ඩුව සුළුතර ආණ්ඩුවක් වීමත් අනෙක් අතින් ජනාධිපතිවරයා වෙනත් පක්ෂයක (ශ්‍රීල.නි.ප.) නායකයා වීම හා එ.ජා.ප.ය සමග ප්‍රතිවිරෝධයක සිටීමත් නිසා ආණ්ඩුව 'ආණ්ඩු බලයක්' ලෙස ක්‍රියාත්මක වන්නේ නැත. ආණ්ඩුව පෙරළීමට විපක්ෂය උත්සාහ කරද්දී පසුගිය 2019 ඔක්තෝබරයේ ආණ්ඩුව පෙරළීමට කළ කුමන්ත්‍රණයේ මෙහෙයුම්කරු වූයේ ජනාධිපතිවරයාය. එම කුමන්ත්‍රණය පරාජය වුවද ඉන්පසු ආණ්ඩු ක්‍රියාකාරිත්වය දුර්වලව පවතී.

පසුගිය අප්‍රේල් 21 මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරය වළක්වා ගැනීමට හැකියාව තිබියදී එය වළක්වා ගැනීමට නොහැකි වූයේද ආණ්ඩුව 'ආණ්ඩුවක්' ලෙස කටයුතු නොකළ නිසාය. දැනුදු ආණ්ඩුව රට පාලනය කරන්නේ නැත. ඒ නිසා හැමදෙනාම ප්‍රකාශකයෝ වී සිටිති. තමන්ට අයිති වැඩ මෙන්ම බොහෝ දෙනා අයිති නැති වැඩම කරති. ජනාධිපති එක් මතයක් දරන විට අගමැති වෙනත් මතයක් දරයි. ඇමතිවරු තම තමනට අවශ්‍ය දේ ප්‍රසිද්ධියේ පවසති. 'ආණ්ඩුවේ මතය' නමින් මතයක් හෝ එය ප්‍රකාශ කරන්නේ නැත. දැන් හමුදාපතිවරයාද මාධ්‍ය වෙත ප්‍රකාශ ලබාදෙයි.

ඒ අතර දේශපාලන අරමුණු වෙනුවෙන් තම ජනමාධ්‍ය හසුරුවන ජනමාධ්‍ය අයිතිකරුවෝද තම තමන්ගේ න්‍යාය පත්‍රවලට අනුව විවිධ ප්‍රවෘත්ති නිර්මාණය කරති; විග්‍රහ කරති. වැරදි තොරතුරු ජනතාව වෙත සම්ප්‍රේෂණය කරති. ඒවා නිවැරදි කිරීමට හෝ ජනතාවට සත්‍ය තොරතුරු ලබාදීමට ආණ්ඩුවක් නැත. ඒ නිසා 'ලූලා නැතිවලට කණයා පණ්ඩිතයා' කීවා සේ හැමදෙනාම තම තමන්ගේ සීමා ඉක්මවා කටයුතු කරති. ආණ්ඩුව ආණ්ඩු කිරීම හැර අන් හැමදේම කරයි. රට අරාජික වී තිබේ. සමහර විට ආගමික නායකයන් ආණ්ඩුවට ඉදිරියෙන් සිටින අවස්ථාද තිබේ. මේ ආණ්ඩුවේ අර්බුදය ප්‍රකාශයට පත්වෙන හැටිය.

සංකීර්ණ සමාජ අර්බුද විසඳීමට තනි පුද්ගල චරිතවලට නොහැක. එවැනි දේ දැකිය හැක්කේ සිනමා පටවලය. තථ්‍ය ලෝකයේ එවැනි දේ කළ නොහැක. අර්බුදයට පත් ලාංකේය සමාජය විසින් දැන් සැබැවින්ම ඉල්ලා සිටින්නේ ප්‍රගතිශීලී වෙනසකි; සමාජවාදය දෙසට වන වෙනසකි. එය ප්‍රමාදවීම විසින් සිදුකරන්නේ ජනතා පීඩනය ජාතිවාදී හෝ ආගමික අන්තවාදී අන්තයන්ගෙන් පුපුරා යාමය.

ඒ අතර දේශපාලන පක්ෂද අර්බුදයට ගොස් තිබේ. එ.ජා.ප.ය රනිල්ගේ නායකත්වය තුළ දිරාපත් වෙමින් තිබේ. එහෙත් ඔවුනට ඒ වෙනුවට බලපෑමක් කළ හැකි අනුභස් සහිත නායකයෙක් නැත. සජිත්ගෙන් සැහීමකට පත්වීමට සිදුව තිබෙන්නේ ඒ නිසාය. පසුගිය දිනවල එ.ජා.ප. ප්‍රබලයන් කිහිපදෙනෙක් එක්වී නායකත්වයෙන් ඉවත්වන ලෙස රනිල්ගෙන් ඉල්ලීමට තීරණයක් ගත් බවද වාර්තා විය. ඉදිරි ජනාධිපතිවරණය එන්නේ නම්, එවිටද එ.ජා.ප. ජනාධිපති අපේක්ෂකයා පිළිබඳ ප්‍රශ්නය යළි මතුවනු ඇත. 2010, 2015 ජනාධිපතිවරණ දෙකම රනිල් මඟහැර ගියේ පොදු අපේක්ෂකයන්ගේ පිහිටෙනි. එහෙත් මෙවර එවැන්නක් පහසු නැත. එ.ජා.ප.ය මේ වන විට බිම් මට්ටමෙන්ද අක්‍රියව පවතී. ඒ අනුව ලංකාවේ පැරණිම ධනපති පක්ෂය දැන් පසුවන්නේ දුබල වෙමිනි.

අනෙක් අතට ශ්‍රීල.නි.ප.යද දෙකඩ වී තිබේ. කොටස කුඩා වුවත් මෛත්‍රී ශ්‍රීල.නි.ප. නායකත්වය තමා වෙත තබාගෙන සිටී. මෛත්‍රීගේ ඉදිරි දේශපාලන ගමනද අපැහැදිලිය. ඔහුට යළි බලය ගැනීමට ජේනතෙක් මානයක ඉඩක් හෝ හැකියාවක් නැත. දැනට පොදු ජන පක්ෂය ලෙස කටයුතු කරන මහින්ද පිල තුළද ගැටලු පවතී.

එක් අතකින් බලය ලබා ගැනීමට යයි කියමින් පසුගිය කාලය පුරා මහින්ද කණ්ඩායම සිදුකළ සියලු ක්‍රියා (පාගමන්, රැලි, කොළඹ වටලෑම ආදී) ප්‍රතිඵලයක් නැතිවම අවසන් විය. පසුගිය ඔක්තෝබර් කුමන්ත්‍රණයෙන්ද මහින්ද පරාජය වූයේ අපකීර්තියක්ද ලබාගනිමිනි. දැන් ඉදිරි ජනාධිපතිවරණය පදනම් කරගෙන ඒ තුළද ගැටලු මතුව තිබේ. ඉදිරි ජනාධිපතිවරණයට තරග වැදීමට මහින්දට නොහැක. මහින්ද කැමති වෙනත් කෙනෙක්ද නැත. ඒ නාමල්ට වයස මදි නිසාවෙනි. ගෝඨාභය ගෙන ඒමට පිරිසක් උත්සාහ කළත් මහින්ද තවමත් එය නිල ලෙස පිළිගන්නේ නැත. මීළඟට බලය ගැනීමට සැරසෙන ඔවුන්ට ජනාධිපතිවරණයට මාස 4ක් පමණක් තිබියෙදීත් තවමත් අපේක්ෂකයෙක් නම්කර ගැනීමට නොහැකිවීම ඔවුන් මුහුණපා සිටින අර්බුදයේ ප්‍රමාණය පෙන්වයි.

මෙම සියලු සාධකත්, වසර 71ක් තිස්සේ මාරුවෙන් මාරුවට ආණ්ඩු පිහිටුවා අසාර්ථක වීම නිසා සමාජය තුළ ඇතිකර තිබෙන මතයන් නිසා, දැන් ක්‍රමානුකූලව පැරණි පක්ෂ අභාවයට යමින් තිබෙන තත්වයන් මතුව තිබේ. මේ නිසා එක් අතකින් පක්ෂ වෙනුවට පුද්ගලයන් ඉස්මතු වීමත්, පුද්ගල චරිත කෙරේ විශ්වාස තැබීමේ ප්‍රවණතාවයකුත් සමාජය තුළ මතුව තිබේ. අනෙක් අතට එහිම දිගුවක් ලෙස ප්‍රධාන පක්ෂ දෙකට පිටින් විකල්ප පුද්ගල චරිත මතුවීමේ ප්‍රවණතාවයක්ද මතුව තිබේ. ඉන් කියැවෙන්නේ ද ලංකාවේ සම්ප්‍රදායික දේශපාලනයේ අවසානයට පැමිණෙමින් තිබෙන බවය.

ලංකාවේ ධනපති ක්‍රමයත් ධනේශ්වර පක්ෂත් අර්බුදයට යාම නිසා හා එම පක්ෂවල සමාජමය බලපෑම අඩුවීම නිසා සමාජය තුළ වම මූලිකකරගත් විකල්ප බලවේගයකට අවස්ථාව විවර වෙමින් තිබේ. එහෙත් ධනේශ්වර ක්‍රමය, ධනේශ්වර බලවේග හා සමාජය තුළ පවතින ධනේශ්වර චින්තනය ඊට කැමති නැත. ඒ නිසා සම්ප්‍රදායික

15 වැනි පිටුවට

# ඉතිහාසයෙන් ඉගෙන ගනිමු

වසර මිලියන 35,000 කට පෙර ලෝකයේ ප්‍රථම ඒක සෛල ජීවියා බිහිවිය. එදා සිට මේ දක්වා පරිණාමය වූ එම ජීවියා විවිධ සත්ව කොට්ඨාසයන් බවට වර්ධනය වී ඇත. ඉන් එක් කොට්ඨාසයක් පරිණාමය වීමෙන් නූතන මිනිසා බිහිවිය. ඔහු කළු ලෙසද, සුදු ලෙසද, තලෙළු ලෙසද සමේ වර්ණය අනුව බෙදා ගත්තේය. එපමණක් නොව සංස්කෘතීන් අනුව, ආගම අනුව භාෂා අනුව රට රටවල් අනුවද බෙදාගත්තේය.

විටෙක ඔවුන් ජාතිකත්ව ලෙසද කුල ලෙසද රටවල් ලෙස පමණක් නොව ආගම් ලෙසද භේදභින්න වීම් ඇතිකර ගත්තේය. පසුව මේ භේදයන් මත ඇති වූ මහ විනාශකාරී යුද්ධවලින් විශාල මිනිස් සම්පතක් ලොවට අහිමි වී ඇත. එහි අත්දැකීම් ශ්‍රී ලාංකිකයන් ලෙස අපිදු අත්විඳ ඇත්තෙමු.

පසුගිය 30ක අවුරුදු යුද්ධයක් නිමවී යාන්තම් හුස්මක් ගත්තා පමණි. නැවතත් අපි ඉතිහාසයේ පිටුපසට ගමන් කරමින් සිටිමු. ඒ පසුගිය අප්‍රේල් 21 පාස්කු ඉරිදා එල්ල වූ ප්‍රහාරයත් සමඟිනි. 30 අවුරුදු යුද්ධය වර්ධනය කළේ 83 තුනේ කළු ජූලියයි. එම අත්දැකීම් ලැබූ අප යළිත් එවැනි යුගයක් ප්‍රාර්ථනා නොකරන්නෙමු. අප පසුගිය කාලයේ "කළු ජූලියක් නැවතත් එපා!" යනුවෙන් හඬ නැගුවේ එහි ඛේදවාචකය හොඳාකාරවම දන්නා මිනිසුන් නිසාවෙනි.

නමුත් ඒ වැරැද්ද යළිත් වේවිදෝ යන සැක සංකා දළුලන්නට වූයේ පසුගිය 4/21 ප්‍රහාරයත් සමඟයි. ඉදින් එවැනි වටපිටාවක් තුළ 83 කළු ජූලියේ අත්දැකීම් වෙත ආපසු හැරී බැලීම ප්‍රයෝජනවත්යැයි සිතමු. අප ඔබ සමග බෙදා ගන්නට උත්සහ දරන්නේ 1983 කළු ජූලිය සමයේ අපේ රටේ පුවත්පත්වලින් පළවූ තොරතුරු මත පදනම්ව ගොඩ නැගුණු අත්දැකීම් කිහිපයකටයි.


1983 සිදු වූ කළු ජූලියට ආසන්නතම සිදුවීම වූයේ එවකට අප්‍රකට සන්නද්ධ දෙමළ තරුණ කණ්ඩායමක් වූ දෙමළ විමුක්ති කොටි සංවිධානය විසින් යාපනයේදී එල්ල කළ ප්‍රහාරයකින් ශ්‍රී ලංකා හමුදාවේ 13 දෙනෙකු ජීවිතක්ෂයට පත්වීමේ සිදුවීමයි. පැවැති එ.ජා.ප. ආණ්ඩුව මෙම සිදුවීම තම ආණ්ඩුවේ නොහැකියාව හා අර්බුදය වසාගැනීමට පාවිච්චි කර ගත්තේය. ඒ සඳහා මෙම මරණවලින් පසු රට තුළ වර්ධනය වූ ජාතිවාදී හැඟීම් හොඳම ආයුධය බවට පාලකයෝ කල්පනා කළහ. එම නිසා සිංහල සමාජය තුළ මෙම සිදුවීම ජාතිවාදී ගැටුමක් දක්වා වර්ධනය වීමට පරිසරය සැකසූහ. එහි ප්‍රතිඵලයක් ලෙස ඉතිහාසයේ කළු පැල්ලමක් වූ කළු ජූලිය ඇරඹුණි.

එවක පැවැති ලංකාදීප පුවත්පතේ මෙම සිදුවීම සම්බන්ධව පළවූ ප්‍රවෘත්ති කිහිපයක් මාතෘකා කිහිපයක් යටතේ පෙළගස්වමු.

## බලය වෙනුවෙන් ජාතිවාදය

"වැලිකඩ දෙමළුන් 35 දෙනාගේ මරණ මිනීමැරුම් " ලෙස ජූලි 29 දින පුවත්පතේ සිරස්තලය පළවූ ආකාරයයි. එහි වැඩිදුරටත් සඳහන් කර තිබුණේ මෙසේය.

"කොළඹ බන්ධනාගාරයක රඳවා සිටි දෙමළ සිරකරුවන් 35 දෙනෙක් යකඩ පොලු සහ පිහියාවලින් සන්නද්ධ



වැලිකඩදෙමළුන් 35 දෙනාගේ මරණ මිනීමැරුම්


වූ පිරිසක් පහරදී ඝාතනය කර ඇති බව පශ්චාත් මරණ පරීක්ෂණවලදී හෙළි වී ඇත. හදිසි නීති ප්‍රකාශයට පත්කර ඇති අවස්ථාවක මෙම මිනිස් ඝාතන සිදුවී ඇත. මේ පිටුපස සංවිධානාත්මක බලවේගයක් සිටින බව අවධාරණය කරයි."

මෙම ප්‍රවෘත්ති සිරස්තලයේ දෙමළ ජනයා හැඳින්වීමට යොදා ඇත්තේ "දෙමළුන්" යන වචනයයි. එම වචනය භාවිතා කිරීමෙන් එම ජනතාවට අපහාසාත්මක ලෙස ආමන්ත්‍රණය කළ බව පැහැදිලිය. එසේම එහි සිංහල ජාතිවාදය ගැබ්වී ඇති අතර සිංහල ජාතිවාදීන් සතුටු කරන්නට උත්සාහ දරා ඇති බව ඉතා පැහැදිලිය.

මාධ්‍යයක් ලෙස එම පුවත්පත තම වගකීම් පැහැර ඇති බවත් ජාතිවාදීන්ට උඩගෙඩි දෙමින් ඒක පාර්ශ්වීය කටයුතු කර ඇති බව පෙනීයයි.

එසේම එම 35 දෙනා ඝාතනය කර ඇත්තේ වැලිකඩ බන්ධනාගාරයේ සිරකරුවන් ලෙස සිටිය දීය. ඔවුන් ඝාතනය ලක් වූයේ මෙම කෝලාහලය ඇරඹී දවස් 4කට පසුවය. සිරභාරයේ සිටි පුද්ගලයින් ඝාතනයට ලක් වූයේ නම් එහි වගඋත්තරකරුවා වන්නේ එවක පැවැති රජයයි. කෙසේ වෙතත් මින් පැහැදිලි වන්නේ මෙම මිනීමැරුම් සඳහා රජයේ මැදිහත්වීමක් සිදුවී ඇති බවය. එසේම හදිසි නීතිය ඇති විටක මෙම ඝාතන සිදුවීමෙන් පෙනීයන්නේ ජාතිවාදීන්ට අවස්ථාව සලසාදී ආණ්ඩුව අත්බැඳ සිටි ඇති බවය.

එහි තවත් පුවත්පතක සිරස්තලයක් වූයේ "වැලිකඩ හිරේ අරගලයකින් තවත් දෙමළු 17ක් නසිති" යනුවෙනි. එහි වැඩිදුරටත් සඳහන් කර තිබුණේ "පසුගිය 27 වන දා 35 දෙනෙකු ඝාතනයෙන් පසු එහි රඳවා සිටින සිරකරුවන් වෙනත් සිරගෙදරකට මාරුකර යැවීමට තිබියෙදී යළි 17 දෙනෙක් ඝාතනය කර ඇති බව අධිකරණ අමාත්‍යවරයා පවසයි"



පදනම් රහිත කට-කතා විශ්වාස කරන්න එපා!

යන්නයි. දෙමළ මිනිසුන් 35 දෙනෙකු සිරගෙදර දී ඝාතනයට ලක්කිරීමට ඉඩ සැලසූ එ.ජා.ප. ආණ්ඩුව යළිත් එවැනිම ඝාතනයක් කිරීමට ඉඩ සලස්වා ඇත. වගකිව යුතු ආණ්ඩුවක් නම් පළමු සිදුවීමෙන් පසු එවැනි සිදුවීමක් වැළක්වීමට කටයුතු සකස් කළ යුතුය. නමුත් තම බල වුවමනාව වෙනුවෙන් ඕනෑම ම්ලේච්ඡ ක්‍රියාවකට අනුබල දී තිබූ බව මෙමගින් ඉතා පැහැදිලි වේ.

ජූලි 27 ලංකාදීප පුවත්පතේ සටහන් වූ සිරස්තලයක්වෙත අවධානය යොමු කරමු.

'යාපනයේ හර්තාල් නොනවතී, බස් 3කට ගිනි, ජීප් 2ක් පන්නයි' ලෙස වාර්තා කර තිබුණි. වැඩි විස්තර ලෙස සටහන් කර තිබුණේ 'යාපනයේ ආරම්භ කර ඇති හර්තාලය දැන් දිගටම පවත්වාගෙන යන අතර ගල් ගැසීමෙන් හා ගිනි තැබීමෙන් රජයට අයත් බස් රථ 3ක් විනාශ කර



කෝටි 20 ක කොල්ල කෑ බඩු අල්ලයි
හිමිකරුවන් නැති බඩු වෙන්දේසියේ
ආදායම පුනරුත්ථාන අරමුදලට

තිබේ. රජයේ ජීප් රථ 2ක් සොරාගෙන ඇත.'

යාපනයේ හර්තාලය ආරම්භ වූයේ වැලිකඩ සිරගෙදර සිටි දෙමළ සිරකරුවන් 35 දෙනෙකු ඝාතනය කිරීම පිළිබඳවයි. මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් කර නැගී එන ගිනිදැල් නිවාලීමට කටයුතු කිරීම රජය සතු වගකීම වී තිබිණි. නමුත් දකුණේ සිංහල ජාතිවාදයට ඉඩ සැලසූ ආණ්ඩුව උතුරේ ජාතිවාදී ගින්දරට තව තවත් අවුළුවීමට කටයුතු කළේය. ඒ තවත් දෙමළ සිරකරුවන් 17 දෙනෙකු ඝාතනය කිරීමට අවස්ථාව සලසමිනි. එම නිසා දෙමළ ජනයා තව තවත් කෝපයට පත්වනු හා ජාතිවාදයට තල්ලුකරනු හැරෙන්නට වෙන යමක් සිදුවන්නේ නැත. පසුව එම හර්තාලය උත්සන්න වූ අතර එය රාජ්‍ය විරෝධී එකක් බව රජය පවසා ඇත. සැබැවින්ම රජයට අවශ්‍ය වූයේ දකුණේ සිංහල ජාතිවාදයත් උතුරේ දෙමළ ජාතිවාදයත් උත්සන්න කිරීම බව ඉතා පැහැදිලි කරුණකි.

## කට කතා පැතිරීම

"යාපනයේ නාග විහාරාධිපති නනාදාරාම ස්වාමීන්වහන්සේට හෝ වෙනත් භික්ෂුවකට පහරදී නැතැයි අවධාරණය කරයි." "කොළඹ නල ජලයට වස මිශ්‍රකර ඇති බවට පවතින කටකතා මුළුමනින්ම අසත්‍ය බව රජය අනාවරණය කරයි." " උතුරේ ත්‍රස්තවාදීන් කොළඹ පැමිණ සන්නද්ධ හමුදා සමඟ උග්‍ර සටනක යෙදී සිටී." ඒ ජූලි 30 ලංකාදීප පුවත්පතේ පළවූ ප්‍රවෘත්ති කිහිපයකි. මෙවැනි අර්බුදකාරී අවස්ථාවක අසත්‍ය කටකතා පැතිරීම ඉතා වේගයෙන් සිදුවේ. අසත්‍ය තොරතුරු සමාජගත කර සාමාන්‍ය ජනය බියට පත්කිරීම හා ප්‍රකෝපකාරී කිරීම ජාතිවාදීන්ගේ වුවමනාවයි. ඉහත පළමු කටකතාවෙන් පැහැදිලි වන්නේ සිංහල බෞද්ධ බලවේගයන් ප්‍රකෝප කිරීමයි. දෙවැන්න හා තුන්වැන්නෙන් රටේ ජනයා තුළ අවිශ්වාසය, බිය ඇති කිරීමට ගත් උත්සාහයකි.

## කොල්ලකෑම් ව්‍යාප්තිය

කොල්ලකෑමට මරණ දඬුවම - ජූලි 26

ඇඳිරිනීතිය පැවැති අවස්ථාවේදී මහනුවර, ගම්පොල දී කැරලිගැසීම් හා මංකොල්ලාකෑම් - ජූලි 28

කෝටි 20ක කොල්ල කෑ බඩු අල්ලයි. හිමිකරුවන් නැති බඩු වෙන්දේසියේ - අගෝස්තු 09

ඉහත ප්‍රවෘත්ති එම දිනයන්හි ලංකාදීප පුවත්පතේ පළ වූ සිරස්තලයන්ය. සිංහල හා දෙමළ ජාතිවාදය පදනමින් ඇති වූ මෙම ගැටුමට මුවා වී අරසණභාවයට පත්වූවන්ගේ දේපළ හා මුදල් ජාතිවාදීන් විසින් කොල්ලකෑ බවට ඉහත සිරස්තල මගින් සාක්ෂි දරයි. යම් කෙනෙක් අසරණ වූ මොහොතක ඔවුන් සතු වස්තුව මංකොල්ලකෑමට තරම් මිනිසුන් අමනුෂ්‍ය වීම ඉතා ඛේදනීය තත්වයකි. මංකොල්ලකරුවන්ට ජාතියද ආගමද වැදගත් නැත. ඔවුන්ට වැදගත් වී ඇත්තේ භාණ්ඩ හා මිල මුදල්ය. එය පැහැදිලි වන්නේ කෝටි 20 පමණ විශාල භාණ්ඩ තොගයක් කොල්ලකෑමට මොවුන් සමත්වීමෙනි. නමුත් ඒ සොයාගත් භාණ්ඩ පමණි. ගණනය නොවූ භාණ්ඩ, දෙපළවල වටිනාකම් කෙතරම්ද යන්න කාහට කිව හැකිද? එසේම මංකොල්ලකෑමට ලක් වූයේ දෙමළ ජනයාගේ දේපළ වන අතර ඛේදනීය කරුණ වන්නේ දෙමළ මංකොල්ලකරුවන්ද ඒ අතර සිටීමය.

"වැඩිමිලට බඩුවක් වික්කොත් බලාගෙනයි" - ජූලි 28

ඉහත සිරස්තලය දෙස අවධානය යොමුකරමු. මෙහි යටි අදහස් ඇත. මෙහි වැඩි විස්තර ලෙස සඳහන් වූයේ පහත පරිදිය. "ඇතැම් පෞද්ගලික වෙළඳුන් පසුගිය දින කිහිපය තුළ ඇති වූ කලබලකාරී සිද්ධිවලට මුවා වී භාණ්ඩ මිල ඉහළ දමා අලෙවි කරමින් සිටි. ඊට අමතර අඩු බර සහිත බඩු අලෙවි වන බව තොරතුරු හෙළිවේ." මෙයින් පැහැදිලි වෙන්නේ බොරදියේ මාළුබාන තත්වයකි. රට ඛේදනීය තත්වයකට පත්ව ඇති මොහොතක ඒ අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීමට කූට වෙළඳුන් උත්සහා දරා ඇති ආකාරයයි. මෙයින්ද ගම්‍ය වන්නේ අන් සියල්ල පරයා මුදල් සාධකය ඉදිරියට පැමිණි ආකාරයයි.



වැඩිමිලට කිසිම බඩුවක් වික්කොත් බලාගෙනයි!

## සැබෑ වමට කුරුමාණම

කොළඹ කැරලි ගැසීම් සංවිධානාත්මක වැඩක් - ජූලි 28

"කොළඹ නගරයේ සිදු වූ කැරලි ගැසීම් හා කොල්ලකෑම් සංවිධානාත්මක කණ්ඩායමක් විසින් කලින් සැලසුම් කොට ක්‍රියාත්මක කරන ලද්දක් බව ආණ්ඩුවට ඒත්තු ගොස් ඇත."

"තහනම් පක්ෂ තුන කෙලින්ම ප්‍රකෝපකාරී වැඩට හවුල්" - ජූලි 28

ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ හා නව සමසමාජ පක්ෂය හදිසි



තහනම් පක්ෂ තුන කෙලින්ම ප්‍රකෝපකාරී වැඩට හවුල්!
මංකොල්ලෙට මරණ දඬුවම

නීතිය යටතේ තහනම් කරයි. - රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් ඩග්ලස් ලියනගේ මහතා ප්‍රකාශ කරයි.

ඉහත ප්‍රවෘත්ති සිරස්තල දෙස මදක් අවධානය යොමු කළොත් පෙනී යන්නේ ආණ්ඩුව වාමාංශික පක්ෂ කිහිපයක් මෙම සිදුවීමට වරදකරුවන් කර ඔවුන් අතපිසදාගැනීමට සැරසෙන ආකාරයයි. ජූලි 28 දින සිරස්තලයෙන් පෙනී යන්නේ උපක්‍රමශීලි ලෙස මෙය සංවිධානාත්මක වැඩක් ලෙස මතයක් සමාජගත කිරීමට උත්සාහ දැරීමය. පසුව ජ.වි.පෙ. ඇතුළු වාමාංශික පක්ෂ තුනක් මෙම සිදුවීමට වරදකරු කරමින් එම පක්ෂ තුන තහනම කළේය. එම අවස්ථාවේ පැවැති මාධ්‍ය හමුවේදී මාධ්‍යවේදියෙකුට ආරක්ෂක රාජ්‍ය අමාත්‍යංශ ලේකම්වරයා පවසා ඇත්තේ මෙසේය. "දෙමළ එක්සත් විමුක්ති පෙරමුණ මේ ආකාරයෙන් තහනම් නොකළේ ඇයි?" ඔහුගේ පිළිතුර වූයේ රටේ සාමය පවත්වාගෙන යෑමට එම සංවිධානය කිසිදු බාධාවක් නොවූ බවයි.

එපමණක් නොව එම වාමාංශික පක්ෂ තහනම් කර ඔවුන්ගේ සියලු දේපළ තහනම් කෙරිණි. ඒ බව ජූලි 28 ලංකාදීප පුවත්පතේ සඳහන් වූයේ "මුද්‍රණාල 4ක් සීල් තබයි" යනුවෙනි.

"මින් මතු රට බෙදෙන කතා බෑ, සාමකාමී වන්න ඉටා ගන්න." - අගමැති ප්‍රේමදාස ජූලි 28

"මහජන ඡන්දයෙන් බලය ලබාගත නොහැකි වූවන් බොරු කටකතා යවමින් රට මහත් විනාශයකට ඇද දමනවා." - ප්‍රේමදාස අගමැතිවරයා

ඉහත ප්‍රවෘත්තියෙන්ද පෙනී යන්නේ පැවැති එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව එක ගලෙන් කුරුල්ලන් දෙදෙනෙක් දඩයම් කිරීමට සැරසූ ආකාරයයි. ධනේශ්වර පාලක පංතියට හිසරදයක් වන වාමාංශික ව්‍යාපාර දඩයමද මෙම ජාතිවාදී කොහොලාහයෙන් පසු බොරු චෝදනා ඉදිරිපත් කරමින් සිදු කරගන්නා ලදී. එක් පැත්තකින් වාමාංශික ව්‍යාපාර තහනම් කරමින්ද අනෙක් පැත්තෙන් ජාතිකත්ව හා ආගම් පදනමින් ලාංකේය ජනයා භේද බින්න කරමින් තම දේශපාලන පැවැත්ම තහවුරු කරගැනීමට උත්සාහ කිරීම මෙයට හොඳම නිදසුනිකි.

## ජාතිවාදී ගැටුමේ ප්‍රතිඵල

රෙදිපිළි හා ඇඳුම් නිෂ්පාදනයට සහ අපනයනට සම්බන්ධ කර්මාන්ත ශාලවල සේවය කළ සේවකයෝ 6000කට පමණ රැකියා අහිමි වී ඇති බව රාජ්‍ය අමාත්‍ය ලේකම්වරයා පවසයි. - ජුනි 29

මෙය එක් ආයතනයකට සිදුවීමක් පමණි. මෙවැනි රැකියා අහිමිවීම් කොපමණ සිදුවීද? එයින් රටේ ආර්ථිකයට වූ හානිය ගණන් කළ හැකි වීද? එපමණක් නොව ආර්ථික අර්බුදය සෑම පැත්තකටම ගලායෑම වැළැක්විය නොහැක. ගොවියාගේ සිට ව්‍යාපාරිකයන් දක්වාත්, කුලීකරුවා සිට රාජ්‍ය සේවකයාට දක්වාත් මෙම ආර්ථික අර්බුදය ගලා ගියේය.

ඉහත තොරතුරු එක්කොට බැලුවොත් පෙනී යන්නේ ජාතිවාදය සේවය කරන්නේ රටේ පාලක පංතියේ බලය පවත්වා ගැනීමට විනා සමස්ත පොදු ජනතාවගේ යහපත තකා නොවන බවයි. මිනිසුන් ලෙස අප හැකිතාක් බෙදා වෙන් කිරීමෙන් පාලක පංතියේ දේශපාලන අර්බුදය වසා ගැනීමට ඔවුහු සමත්වෙති. 1983 කළු ජූලියෙන් ආරම්භ වූ ඒ අමිහිරි අත්දැකීම් අප අදටද අත්විඳිමින් සිටිමු. ඒ යුගයේ අත්දැකීම්වලින් අප පාඩම් ඉගෙන ගතයුතු කාලයයි මේ.

# රටේ අභියෝග ජයගත හැකි විකල්ප දේශපාලන ව්‍යාපාරයක් අවශ්‍යයි



ජනතා විමුක්ති පෙරමුණේ නායක
**අනුර දිසානායක සහෝදරයා**

***නියමුවා:- පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරයෙන් පසුව රටේ දේශපාලන සංවාදයේ මාතෘකාව වෙනස් වී තිබෙනවා. මෙය දේශපාලනයේ හැරවුම් ලක්ෂයක් වෙයිද?***

***අනුර දිසානායක සහෝදරයා:-*** පාස්කු ඉරිදා ප්‍රහාරය දක්වා අපේ රටේ දේශපාලන කතිකාවත ඉතා වැදගත් සාධනීය දිශාවකට යොමුවෙලා තිබුණා. විශේෂයෙන් මේ පක්ෂ දෙක අනුගමනය කරමින් තිබුණු විනාශකාරී නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්ති ඉතා හොඳින් ජනතාවට හෙළිදරව් වෙමින් තිබුණා. ඔවුන්ගේ දේශපාලනය ඉතා අශිෂ්ට දේශපාලන ව්‍යාපාරයක් බව සමාජයේ තහවුරු වී තිබුණා. ඒ වගේම ප්‍රජාතන්ත්‍රවාදය, යහපත් ආණ්ඩුකරණය, ශක්තිමත් විදෙස් ප්‍රතිපත්තියක් පිළිබඳ විධිමත් සාකච්ඡාවක් සමාජය තුළ ගොඩනැගෙමින් තිබුණා. ඒ වගේම රටත් ජනතාවත් ඉදිරියට ගෙනයාම සඳහා අවශ්‍ය වන සාධනීය දේශපාලන සාකච්ඡාවක් රට තුළ පැවතුණා. විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණ ලෙස අපි එම දේශපාලන සාකච්ඡාව තුළ ඉතාම සක්‍රීයව දායක වුණා. මේ සමාජය පරිවර්තනය කිරීම සඳහා අවශ්‍යවන දැක්මක් සහ වැඩපිළිවෙළක් සහිතව අපි සමාජයත් සමග සාකච්ඡාවක හිටියා.

නමුත් අප්‍රේල් 21 දායින් පසුව දේශපාලන කරළිය වෙනස් වෙලා තිබෙනවා. මහජන ආරක්ෂාව කියන කරුණත් වඩාත් වේගයෙන් ඉදිරියට ඇවිල්ලා තිබෙනවා. නමුත් අපි දකින්නේ එය මේ සමාජ ආර්ථික ක්‍රමය තුළ පවතින අර්බුදයේම දිගුවක්. අපි විශ්වාස කරන්නේ, ආර්ථිකය තුළ අසාර්ථක වූවා වගේම මහජන ආරක්ෂාව ගොඩනැගීමටත් මේ පාලක කණ්ඩායම්වලට නොහැකි බව. විශේෂයෙන් මේ අය අවුරුදු 30ක යුද්ධයක් අවසන් වෙලා අවුරුදු 10ක්වත් සාමකාමී තත්වයක් රට තුළ නිර්මාණය කරගන්න බැරි වුණු අසමත් පාලකයන්. ඒ නිසා අපි විශ්වාස කරනවා, මහජන ආරක්ෂාව පිළිබඳ දේශපාලන කතිකාවත තුළත් මේ පාලකයන් අසමත් බව. ඒ වගේම දැනට රටේ පවතින ආර්ථික අර්බුදය මේ සිදුවීමෙන් පසුව තවත් තීව්‍ර වන බව පේනවා.

මේ තත්වය තුළ තව තවත් තහවුරු වන්නේ, ජනතාව පෙළන සියලු ගැටලු විසඳන සහ රට ඉදිරියේ ඇති අභියෝග ජයගත හැකි විකල්ප දේශපාලන දැක්මක් සහිත ව්‍යාපාරයක් අවශ්‍ය බවයි.

***නියමුවා:- ජ.වි.පෙ. ආණ්ඩුවට එරෙහිව විශ්වාසභංග යෝජනාවක් කථානායකවරයාට භාර දුන්නා. මෙම විශ්වාසභංගය භාරදීම ගැන ආණ්ඩුවටත් වඩා විපක්ෂයේ ඇතැමුන් කලබල වනු දැකගත හැකි වුණා. ඒ ඇයි?***

***අනුර දිසානායක සහෝදරයා:-*** විශේෂයෙන්ම අපි ආණ්ඩුවට එරෙහිව විශ්වාසභංග යෝජනාව ඉදිරිපත් කළේ බොහෝ කරුණු සලකා බලමිනුයි. මෙම අප්‍රේල් 21 ප්‍රහාරයත් සමගම මිනිස් ජීවිත විශාල ප්‍රමාණයක්, දේපළ විශාල ප්‍රමාණයක් විනාශ වුණා. ඒ වගේම පොදුවේ සමාජ අනාරක්ෂිතභාවයක් සහ බොහෝ ව්‍යාපාරවලට ඉතාමත් අහිතකර තත්වයක් ඇතිවී තිබෙනවා. ඒ වගේම සිංහල, දෙමළ, මුස්ලිම් ජනයා අතර, සැකය, අවිශ්වාසය, වෛරය වර්ධනය වුණු තත්වයක් නිර්මාණය වී තිබෙනවා. මෙය අපේ රටට කිසිසේත්ම ඉදිරියට ගෙනයාමට නොහැකි ස්වරූපයේ විශාල ප්‍රතිවිරෝධයක්.

මෙම ප්‍රතිවිරෝධී තත්වය ඉස්ලාම් අන්තවාදී උමතු ත්‍රස්තවාදී කණ්ඩායමේ ප්‍රතිඵලයක්ම නෙමෙයි. ඔවුන් ඒ කටයුත්තේ නියැලුණා වගේම එවැනි ප්‍රහාරයන් එල්ල කිරීමට සමත් වෙන වටපිටාවක් නිර්මාණය කළේ පාලකයන් විසිනුයි. විශේෂයෙන්ම දෙස් විදෙස් බුද්ධි අංශ තොරතුරු, මහජනයාගේ පැමිණිලි නොසලකා හැරීම, ඒ වගේම සමහර සිදුවීම්වල පරීක්ෂණ ඉදිරියට ගෙන නොයෑම ආදී ආණ්ඩුව විසින් මහජනයාගේ ආරක්ෂාව පිළිබඳ ඇති වගවීම අත්හැරීම හේතුකොටගෙන තමයි මෙම ප්‍රහාරය දියත් වෙන්න හේතුව වුණේ. මේ ප්‍රහාරය වළක්වා ගත හැකිව තිබූ ප්‍රහාරයක්. ඒ නිසා මේ ප්‍රහාරයට හවුල් වූ ඝාතකයන් වගේම මේ ආණ්ඩුවත් මෙම ඝාතනයන්ට වගකිව යුතු අපරාධකරුවන් බව අපි දන්නවා.

ඒ වගේම අප්‍රේල් 21දායින් පසුව සමාජයේ ඇතිවෙන අනාරක්ෂිත ස්වභාවය මැඩපත්වන්න පාලකයන් අසමත් වුණා. තමන් විශ්වාසවන්ත ආරක්ෂකයන් බවට ජනතාවට සහතිකයක් දෙන්න ආණ්ඩුව අසමත් වුණා. ජනාධිපතිවරයා, අග්‍රාමාත්‍යවරයා සුපුරුදු විදිහට එකිනෙකාට වරද පටවන ස්වභාවයත්, අමාත්‍යවරුන්ගේ විසුළු සහගත අපරිණත හැසිරීමත් නිසා රට තුළ තවදුරටත් අනාරක්ෂිත බව වර්ධනය වුණා. ඒ වගේම දින 21කට පසුව මුස්ලිම් ජනයා ඉලක්ක කර ගත්තු ඔවුන්ගේ දේපොළ විනාශ කිරීමේ ප්‍රහාරයන් දක්වා වර්ධනය වුණා. ඒ නිසා මේ සියල්ලෙන්ම පෙන්නුම් කරමින් තිබෙන්නේ ආණ්ඩුවේ අසාර්ථකභාවයයි. මේ සියල්ල සලකා අපි මේ ආණ්ඩුවට එරෙහිව විශ්වාසභංග යක් ඉදිරිපත් කිරීමට කටයුතු කර තිබෙනවා.

නමුත් ඒකට විශේෂයෙන්ම රාජපක්ෂ කණ්ඩායම කලබල වෙලා තියෙනවා. ඔවුන් මුග්ධ ජාතිවාදී දේශපාලනයක නිරත වෙමින් සිටිනවා. ආණ්ඩුව මේකට වරදකරුවන් බවට පත්කරන්න ඔවුන් කැමති නැහැ. ඒ මන්ද ජනාධිපතිවරයා ඔවුන්ගේ පිලේ. ජනාධිපතිවරයා තමයි ආරක්ෂක අමාත්‍යවරයා. බොහෝ අය ජනාධිපතිවරයා මගින් තමයි නඩු බේරගෙන තිබෙන්නේ. පොලිසියේ අත්අඩංගුවෙන් බේරගෙන තිබෙන්නේ. ඒනිසා ආණ්ඩුවට එරෙහි විශ්වාසභංගයක් ඇතුළේ වළක්වන්න බැරි විදිහට ජනාධිපතිවරයා විවේචනයට භාජනය වෙනවා. අන්න ඒ ජනාධිපතිවරයා බේරා ගැනීමත් ඔහුගේ දේශපාලන ව්‍යාපෘතිය වෙනුවෙනුත් තමයි මේ ප්‍රහාර එල්ල කරන්න පටන් අරගෙන තිබෙන්නේ. අනෙක් අතට පසුගිය ඔක්තෝබරයේ ඔවුන්ගේ කඳවුර විසින් දියත් කළ ප්‍රජාතන්ත්‍ර විරෝධී බල කුමන්ත්‍රණය පරාජය වූයේ ජ.වි.පෙ. මැදිහත්වීම නිසා බවට ඔවුන් කේන්තියකින් සිටියා. ඒ වගේම තමන්ගේ බල ව්‍යාපෘතියට අප බාධාවක් බවත් ඔවුන් දන්නවා. මේ සියල්ල විසින් ඔවුන් ජ.වි.පෙ.ට එරෙහි වියරුවකට තල්ලු වී සිටිනවා.

***නියමුවා:- ශ්‍රේෂ්ඨාධිකරණයෙන් වෙනස් තීරණයක් නොලැබුණහොත් මේ වසරේදී ජනාධිපතිවරණයක් එළඹීමට නියමිතයි. මේ සඳහා වන ජ.වි.පෙ. සූදානම කවරේද?***

***අනුර දිසානායක සහෝදරයා:-*** මෙම අවුරුද්ද තුළ ජනාධිපතිවරණයක් පැවැත්විය යුතුව තිබෙනවා. පසුගිය කාලය පුරාවටම මේ රටේ ජනතාව පාලනයන් මාරුකර ගැනීම වෙනුවෙන් විවිධ ජනාධිපතිවරු පත්කර තිබෙනවා. නමුත් ඉතිහාසය පුරාම පෙන්නුම් කර තිබෙන්නේ, පාලකයා පත්කරන කොට ජනතාවගේ තිබුණු අපේක්ෂාවත් පාලකයා පත්වුණාට පසුව කරන වැඩකටයුතුත් අතර පරස්පරතාවයයි. ඒ නිසා අපේ රටට නව දේශපාලනයක් අවශ්‍යයි. ජනතාවගේ අපේක්ෂාවන් හා පාලකයන්ගේ අපේක්ෂාවන් එකතැනකට ගොඩනැගෙන මැතිවරණයක් බවට මේ ජනාධිපතිවරණය පත්කිරීම අපේ අපේක්ෂාවයි. විශේෂයෙන්ම අපි සූදානම් ජනතා විමුක්ති පෙරමුණ සමග අත්වැල් බැඳගත් පුළුල් බලවේගයක් මගින් මේ ජනාධිපතිවරණය සඳහා තරග කරන්න. මොකද අවුරුදු 71ක් මාරුවෙන් මාරුවට රට පාලනය කළ දේශපාලන කඳවුරු දෙක අපේ රට අසාර්ථකත්වයේ පතුළට ගෙන ගොස් තිබෙනවා. ඒ නිසා ඔවුන්ට තවදුරටත් අපේ රට ඉස්සරහට ගෙනියන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා අපේ පාර්ශ්වයෙන් අපි ජනාධිපතිවරණයට තරග වදින්න සූදානමින් සිටිනවා.

> අපේ රටට නව දේශපාලනයක් අවශ්‍යයි. ජනතාවගේ අපේක්ෂාවන් හා පාලකයන්ගේ අපේක්ෂාවන් එකතැනකට ගොඩනැගෙන මැතිවරණයක් බවට මේ ජනාධිපතිවරණය පත්කිරීම අපේ අපේක්ෂාවයි. විශේෂයෙන්ම අපි සූදානම් ජනතා විමුක්ති පෙරමුණ සමග අත්වැල් බැඳගත් පුළුල් බලවේගයක් මගින් මේ ජනාධිපතිවරණය සඳහා තරග කරන්න.

***නියමුවා:- ලාංකේය දේශපාලනය මූලික වශයෙන්ම ධනපති මූලික වශයෙන්ම ධනපති කඳවුරු දෙකක් වටා ධ්‍රැවීකරණය වී තිබෙනවා. මේ මැදින් වමේ හා ප්‍රගතිශීලී බලවේගයන්ගේ දායකත්වය සහ ජ.වි.පෙ. නායකත්වය ඇති පුළුල් විකල්ප මධ්‍යස්ථානයක් ගොඩනැගීමේ වැඩපිළිවෙළෙහි ඉදිරි කටයුතු කවරාකාරද?***

***අනුර දිසානායක සහෝදරයා:-*** ඔව්, විශේෂයෙන්ම අපි දන්නවා අපේ රටේ සාම්ප්‍රදායික දේශපාලන කඳවුරු දෙක වටා තමයි ජනතාව ධ්‍රැවීකරණය වෙලා තිබෙන්නේ. නමුත් ඔවුන්ට විශ්වාසවන්ත තුන්වෙනි කඳවුරක්, බලය ලබාගත හැකි, බලය හැසිරවිය හැකි, ඒ බලය හසුරුවන ආකාරය පිළිබඳව පැහැදිලිකමක් තිබෙන තුන්වෙනි කඳවුරක් නිර්මාණය කරන්න අපි අසමත් වී තිබෙනවා. ඒ අසමත්වීම හේතුකොට ගෙනම එම සාම්ප්‍රදායික කඳවුරු දෙක වටා යම් ජන පිරිසක් එකතුවී තිබෙනවා. ඒක ඇත්ත.

හැබැයි ක්‍රමානුකූලව ගත්තොත් ඒ කඳවුරු දෙකෙන් ජනතාව ඈත්වෙමින් තිබෙනවා. ඒ නිසා අපිට අවශ්‍ය වී තිබෙන්නේ, විශ්වාසවන්ත, බලය ගතහැකි, බලය හෙබවිය හැකි, බලය හොබවන ආකාරය පිළිබඳව යම් විශ්වාසවන්ත සහතිකයක් ගොඩනග න්නයි. එවැනි හැකියාවක් පෙන්විය හැකිනම් අපේ රටේ මේ මතුවෙලා තියෙන දේශපාලන රික්තකය තුළ ජයග්‍රාහී තුන්වෙනි කඳවුරක් ගොඩනැගීම සඳහා අවස්ථාව තිබෙනවා. ඒ සඳහා අපි මූලික පියවර අරන් තිබෙනවා. අපේ රටේ විවිධ බහුජන ව්‍යාපාර, වාමාංශික දේශපාලන ව්‍යාපාර, ප්‍රගතිශීලී ව්‍යාපාර, විකල්ප දේශපාලන ව්‍යාපාර සමග අපි පුළුල් සාකච්ඡාවක යෙදෙමින් සිටිනවා. විවිධ සිවිල් පුරවැසියන්, ඒ වගේම වෘත්තිය සමිති ව්‍යාපාර, ගොවි ව්‍යාපාර ආදී වැඩකරන ජනතාවගේ ව්‍යාපාර මේ ඔක්කොමත් එක්ක අපි පුළුල් සාකච්ඡාවක යෙදෙමින් සිටිනවා. මේ සියල්ල

15 වැනි පිටුවට

# ද්‍රවිඩ සංවිධාන සහ ජ.වි.පෙ. අතර හමුවක්



ජනතා විමුක්ති පෙරමුණ යනු එක් ජාතිකත්වයකට පමණක් සීමා වූ දේශපාලන ව්‍යාපාරයක් නොවේ. මෙරට පවතින ධනවාදී පාලනය හේතුවෙන් පීඩාවට පත්වන සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජනතාව ජ.වි.පෙ.ට සහෝදර ජනකොටස්ය.

පසුගිය බෝම්බ ප්‍රහාරයත් සමග ඇතැම් දේශපාලන පක්ෂ පටු බලලෝභය වෙනුවෙන් තම පාක්ෂිකයන් ජාතිවාදය දෙසට තල්ලු කරද්දිද, ජ.වි.පෙ. නිවැරදි දේශපාලන ස්ථාවරයක සිටිමින් සියලු අන්තවාදයන්ට එරෙහිවද සියලු ජන කොටස් සමග සහෝදරත්වයෙන්ද කටයුතු කරන ලදී. ඒ අනුව පසුගිය මැයි 08වැනිදා මුස්ලිම් සංවිධාන සමගද එයට දින දෙකකට පසු මැයි 10වැනිදා මඩකලපු දිස්ත්‍රික්කයේ දෙමළ සිවිල් සංවිධාන නියෝජිතයින් සමගද ජ.වි.පෙ. නායකත්වය සාකච්ඡාවන්හි නිරත විය. මෙම මඩකලපු දිස්ත්‍රික් සිවිල් සංවිධාන නියෝජිතයෝ නැගෙනහිර පළාතේ ඉඩම්, අධ්‍යාපන, පරිපාලන සහ දේශපාලන ගැටලු පිළිබඳව ජ.වි.පෙ. නියෝජිතයින් සමග සාකච්ඡා කළහ.

මේ අවස්ථාව සඳහා මඩකලපු දිස්ත්‍රික් සිවිල් සංවිධානයේ සභාපති මාමංගරාජා, ලේකම් ආචාර්ය එම්. වර්ණගුලසිංහම් යන මහත්වරුන් සහ එම සංවිධානය නියෝජනය කරමින් විශ්ව විද්‍යාල ආචාර්යවරුන්, විදුහල්පතිවරුන් සහ ගුරුවරුන් ඇතුළු පිරිසක් සහභාගි වී සිටි අතර ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරමින් නායක අනුර දිසානායක, ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහ දේශපාලන මණ්ඩල සභික සුනිල් හඳුන්නෙත්ති යන සහෝදරවරු සහභාගි වී සිටියහ. මෙම හමුව බත්තරමුල්ල, පැලවත්ත පිහිටි ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන කාර්යාලයේදී පැවැත්විණි.

# ජාතිවාදයට එරෙහි ජ.වි.පෙ. කාර්යභාරය

1983 කළු ජූලියේදී දෙමළ ජනයා පහරදී ඝාතනය කිරීමට මෙන්ම ඔවුනගේ දේපළ අත්පත් කර ගැනීමටද ජේ.ආර් ජයවර්ධන සහ ඔහුගේ ඇමති මණ්ඩලය විසින් තම පාක්ෂිකයින් සහ හිතවතුන් මෙහෙය වන ලදී. දෙමළ ජාතිවාදී කණ්ඩායමකගේ ක්‍රියාකාරිත්වයට පිළිතුරු ලෙස දෙමළ ජනතාවට එරෙහිව සිංහල ජාතිවාදය මුදා හැරීම ජයවර්ධනගේ ආදේශය විය. එහි ප්‍රතිඵලය වූයේ වටිනා මිනිස් ජීවිත මෙන්ම දේපළ රාශියක් මෙරටට අහිමි වීම පමණක් නොවේ. දෙමළ බෙදුම්වාදයට ලොව පුරා අනුකම්පාව ලබාදීම සහ කුඩා පිරිසක්ව සිටි බෙදුම්වාදී සංවිධානවල පිරිස් බලය වර්ධනය කිරීමටද එය හේතුවිය.

රාජපක්ෂ පාලනය ක්‍රමානුකූලව ඉස්ලාම් අන්තවාදය මෙන්ම සිංහල ජාතිවාදයද පෝෂණය කරන්නට විය. ඔවුන් එකවර බෞද්ධ අන්තවාදීන්ට සහ ඉස්ලාම් අන්තවාදීන්ට එකම ගිණුමකින් වැටුප් ගෙවා ඇති බවද මේ වන විට තහවුරු වී තිබේ. එකල බේරුවල අලුත්ගම මෙන්ම පසුව මහනුවර තෙල්දෙණිය ආදී ප්‍රදේශවල ඇති වූ ගැටුම්කාරී තත්වයද එහි ප්‍රතිඵලයන් විය.

අද දවසේද පාස්කු ඉරිදා ප්‍රහාරය පදනම් කරගනිමින් මුස්ලිම් ජාතිකයන්ගේ දේපළවලට හානි කරමින් රට ජාතිවාදය දෙසට තල්ලු කර දැමීමට ඔවුන් තම සාමාජිකයින් සහ හිතවතුන් මෙහෙයවමින් සිටිති. කුරුණෑගල හා ගම්පහ සිදුවීම්වලදී මෙම අන්තවාදී ක්‍රියාකාරකම්වලට නායකත්වය දුන්නේ එම පිරිස් බවට මේ වන විට හඳුනාගෙන තිබේ. මේ අතරම එහිම අනෙක් අන්තය ලෙස ඇතැම් මුස්ලිම් දේශපාලඥයින්ද ඉස්ලාම් අන්තවාදී සංවිධාන නඩත්තු කරමින් ජාතිවාදය දෙසට මුස්ලිම් ජනයා යොමු කරමින් සිටියි.

මෙවන් දුෂ්කර පසුබිමක ජනතා විමුක්ති පෙරමුණ තම පාක්ෂිකයින් සහ හිතවතුන් ජාතික සමගිය ගොඩනැංවීමේ දිශාවකට යොමු කරවමින් සිටී. ජාතිවාදයට එරෙහිව පුළුල් ජනමතයක් ගොඩනගමින් ජාතික සමගිය ගොඩනැගීමට උරදීම මේ මොහොතේ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රමුඛ කාර්යය භාරය වී තිබේ. මේ මොහොතේ තම පාක්ෂිකයින් දැනුවත් කිරීමට පියවර ගත් එකම වගකිවයුතු දේශපාලන පක්ෂය වූයේ ජ.වි.පෙ. පමණි.



ඒ අනුව "අන්තවාදය පැරදවීමට, ජාතික සමගිය ගොඩනැගීමට සහ මහජන ආරක්ෂාව තහවුරු කිරීමට අපගේ කාර්යය" යන මැයෙන් දිවයින පුරා සම්මන්ත්‍රණ මාලාවක් ජනතා විමුක්ති පෙරමුණ විසින් සංවිධානය කරන ලදී.

මෙම සම්මන්ත්‍රණ මාලාවේ එක් සම්මන්ත්‍රණයක් පසුගිය මැයි 11වැනිදා අනුරාධපුර සර්වෝදය ශාලාවේදී ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. මෙම අවස්ථාව සඳහා අනුරාධපුර රඹෑව ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුසන්ත කුමාර නවරත්න සහෝදරයා ඇතුළු ජනතා නියෝජිතයෝ, පක්ෂ සාමාජිකයෝ හා හිතවත්තු විශාල පිරිසක් සහභාගි වී සිටියහ.

# මුස්ලිම් සංවිධාන මුණ ගැසීම



"ඉස්ලාම් අන්තවාදය පරාජය කිරීමේ වගකීමෙන් වැඩි කොටසක් මුස්ලිම් සමාජය සතුයි. එය බිහිවන්නේ මුස්ලිම් සමාජය නම් ගර්භාෂයේයි. එම අනතුර මර්දනය කරනවාද වර්ධනය කරනවාද යන්න මුස්ලිම් සමාජය විසින් තීරණය කළ යුතුයි." අනුර දිසානායක සහෝදරයා

පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයෙන් පසු ඇතැම් අන්තවාදී කණ්ඩායම් ප්‍රබල මුස්ලිම් විරෝධයක් රට තුළ අවුළුවමින් සමස්ත මුස්ලිම් ප්‍රජාවම ත්‍රස්තවාදී ගොන්නට තල්ලු කරමින්ද එසේම ජ.වි.පෙ.ට මුස්ලිම් ප්‍රජාව සම්බන්ධ කරමින් විවිධ අවලාද නගමින් සිටින මොහොතකද එම ලාභ දේශපාලනයට යට නොවී ඇති වී තිබෙන මෙම තත්වය සහ එයින් රට ගොඩගැනීම සඳහා මුස්ලිම් ජනතාවගේ පාර්ශ්වයෙන් විය යුතු දේ පිළිබඳ සාකච්ඡාවක් පසුගිය මැයි මස 08වැනිදා ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලදී.

මේ සඳහා ජ.වි.පෙ. නියෝජනය කරමින් නායක අනුර දිසානායක, ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහ මධ්‍යම කාරක සභික වෛද්‍ය නලින්ද ජයතිස්ස යන සහෝදරවරු සහභාගි වූහ. එසේම මුස්ලිම් ප්‍රජාව නියෝජනය කරමින් සමස්ත ලංකා ජමියතුල් උලමා සංවිධානය, ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සිලය, තරුණ මුස්ලිම් සංවිධානය, ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාම් සංවිධානය, මුස්ලිම් නීතිඥයින්ගේ සංවිධානය, මුස්ලිම් වියතුන්ගේ සභාව, ජාතික සූරා සභාව ඇතුළු සංවිධාන කිහිපයක් මේ හමුව සඳහා එක් වී සිටියහ.

# සැබෑ වමට පොත් ගොන්නක්

වාමාංශික දේශපාලන ක්‍රියාකාරිකයෙකු වූ ජයතිලක සිල්වා මහතා ගුරුවරයෙකු මෙන්ම මාධ්‍යවේදියෙකු ලෙසද තම වෘත්තීය ජීවිතය ගත කළ අතර ඒ කිසිදු මොහොතක තම දේශපාලනය වෘත්තීය වෙනුවෙන් යට කළේ නැත. ලේඛකයෙකු, පරිවර්තකයෙකු සහ ගත්කතුවරයෙකු ලෙස ඒ මහතා විසින් වාමාංශික දේශපාලනයට සිදු කළ මිල කළ නොහැකි කාර්යය වනුයේ කාල් මාක්ස්ගේ ප්‍රාග්ධනය කෘතිය සිංහල භාෂාවට පරිවර්තනය කිරීමය.

සෝවියට් ලේඛක නිකලෝයි ඔස්ත්‍රොස්කි "වානේ පන්නරය ලැබූ හැටි" කෘතිය රචනා කරන ලද්දේ ලෙඩ ඇඳේ සිටිමින් නොයෙක් දුෂ්කරතා මධ්‍යයේය. ඒ හා සමානවම ජයතිලක සිල්වා මහතාද ප්‍රාග්ධනය කෘතියේ තුන් වන වෙළුම සිංහල භාෂාවට පරිවර්තනය කරන ලද්දේ දැඩි සේ ගිලන්ව සිටිමිනි.

පැරණි වමේ දේශපාලන ක්‍රියාකාරිකයෙකු වූ ජයතිලක මහතා වමේ සමගිය නිතරම ප්‍රාර්ථනා කළ අයෙකු විය. ඒ මහතාගේ ජීවන ගමනේ අවසන් භාගයේදී ජනතා විමුක්ති පෙරමුණ කෙරෙහි තැබූ දේශපාලන විශ්වාසය මරණය තෙක්ම නොසැලී පැවතුණි.

ඒ අනුව මේ සියලු තත්වයන් සැලකිල්ලට ගත් ජයතිලක මහතාගේ බිරිද සුනිලා නන්දනී මහත්මිය ඇතුළු එම පවුලේ අය එතුමාගේ පෞද්ගලික පුස්තකාලයේ සියලුම පත පොත ජනතා විමුක්ති පෙරමුණට පරිත්‍යාග කිරීමට තීරණය කළහ. පසුගිය මැයි 20වැනිදා රාජගිරියේ පිහිටි ජයතිලක මහතාගේ නිවසේදී එම මහත්මිය විසින් ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයාට මෙම පරිත්‍යාගය සංකේතවත්ව භාරදෙන ලදී.



# අන්තවාදී ප්‍රහාරයෙන් බැටකන ශ්‍රී ලංකා ආර්ථිකයේ හෙට දවස



අප්‍රේල් 21 ප්‍රහාරයේ කඳුළු වේලෙමින් වේදනාවන් දරාගනිමින් සමාජය ඉදිරියට යාමට වෙර දරයි. අන්තවාදීහු හා අවස්ථාවාදී දේශපාලකයෝ දිය බොරකරමින් ජාතිවාදී ඡන්ද ගණන් හදති. තමන්ට අහිමි වෙමින් ඇති ඡන්දවල ජාතිවාදී සංකේත, සලකුණු කිරීමට කොළ පාට, නිල් පාට, ගුරු පාට ධනවාදී දේශපාලන කල්ලි දඟලමින් සිටියි. රනිල් වික්‍රමසිංහ, රිෂාඩ් බදුර්දීන්ගේ ආරක්ෂකයා වන විට මෛත්‍රීපාල තමන්ට ආරක්ෂකයකු කර ගැනීමට ඥාණසාර හාමුදුරුවන්ට අභයදානය පිරිනමයි. ජාතිවාදී ඡන්ද ඇහිඳීමට රාජපක්ෂ කණ්ඩායමද ඇටවූ උගුල තද කරමින් සිටී. මේ දේශපාලන බලපොරය අතරේ සහරාන්ලාගේ 4-21 ප්‍රහාරයෙන් පසු ලංකාවේ ආර්ථිකයට කුමක් වේද? කවුරුත් කතා නොකර මඟහරින එහෙත් යථාර්ථයේදී මුහුණදිය යුතු බැරෑරුම් ප්‍රශ්න එයයි.

### වෙළඳාම වර්ජනය උත්තරයක්ද?

සහරාන්ලාගේ ම්ලේච්ඡ ආගමික අන්තවාදයේ ප්‍රතිඵල ලෙස රටට අහිමි වූයේ ජීවිත 250කට වැඩි ප්‍රමාණයක් හා ඒ බෝම්බ ප්‍රහාරයෙන්ගෙන් හානියට පත් දේපළ හා තුවාලකරුවන් පමණක් නොවේ. 30 වසරක යුද්ධයෙන් පසු අනතුරුදායක රටක් ලෙස හා අනාරක්ෂිත රටක් ලෙස පැවැති තත්වයෙන් ක්‍රමිකව වෙනස් වෙමින් පැවැති ලංකාව යළිත් මොහොතකින් අනාරක්ෂිත ලැයිස්තුවට ඇද වැටුණි. දසවසරකට පසු යුද තුවාල මකා ගනිමින් හිස ඔසවන්නට උත්සාහ කළ සංචාරක කර්මාන්තය මුළුමනින්ම ඇද වැටුණි. විදේශ සංචාරකයෝ එක රැයින් රටින් පිටවූහ. ඉබි ගමනින් හෝ කැඳවමින් තිබූ විදේශ ආයෝජන නතර විය. හදිසි නීතිය පැනවීමත් සමග භාණ්ඩ ප්‍රවාහනය පරීක්ෂාවට ලක්වීම ඇරඹිණි. කෝච්චියෙන් මල් ප්‍රවාහනය කළ මල් ව්‍යාපාරිකයාගේ සිට බොහෝ දෙනාගේ ආර්ථිකයන්ට කණකොකා හඬා අවසන්ය. හදිසි නීතියේ නීති පොත අනුව කළුගල් කැඩීමට වෙඩි බෙහෙත් නිකුත් කිරීම නතර කිරීමත් සමග කුලියට කළුගල් කඩන්නාගේ ජීවිකාව පවා අද වන විට අර්බුදයට ගොස් ඇත. ගහෙන් වැටුණු මිනිහාට ගොනා ඇන්නා සේ, දැන් වැටුණු ආර්ථිකය ඇතුළේ මුස්ලිම් ව්‍යාපාරිකයාගේ කෑම-බීම, බඩු-මුට්ටු වර්ජනයක්ද අරඹා ඇත. ඒ නිසා මුස්ලිම් ව්‍යාපාරිකයාගේ කෑම කඩයට, කංකුන් මිටියක් විකුණාගෙන ජීවත් වූ සිංහලයාගේ ආදායමට කණකොකා හඬා ඇත. ඊළඟට තවත් සිදුවීමට ඉතිරිව ඇත්තේ මුස්ලිම්-සිංහල "ජාතිප්‍රේමී විරෝධයේ" ප්‍රතිඵල ලෙස අරාබි රටවල් අපේ බඩු හා ශ්‍රමිකයන් වර්ජනය කිරීමත් ඒ රටවල්වලින් ලංකාවට ඛනිජ තෙල් හා තෙල් ආශ්‍රිත නිෂ්පාදන එවීම නතර කිරීමය. එවිට "සිංහල තෙල්" සෙවීම ඇරඹිය හැකිය. දැනටත් 3.2% ක ආර්ථික වර්ධනයක් පමණක් ඇති ශ්‍රී ලාංකේය ආර්ථිකය සිංහල, දෙමළ, මුස්ලිම් ලෙස බෙදිය නොහැකි බව තේරුම් ගත යුතුව ඇත. හුදු ජාතිවාදී විරෝධයන්ගෙන් සිදුවන්නේ වැටුණු ආර්ථිකය තවත් අගාධයටම වැටීම හැර අන් යහපත් යමක් නොවන බව ලාංකේය ජාතිය ලෙස අප වටහා නොගන්නේ නම් පැදුරෙන් බිමටත් වැටුණු අපට සිදුවන්නේ කුමක්ද?

බ්‍රිතාන්‍ය යටත්විජිත අධිරාජ්‍යය විසින් ලංකාවේ සමාජ ව්‍යුහය සකස් කළේම ජාතිකත්වයන් ලෙස බෙදීම ඉතිරි කරමින් වුවත් ඒ ජාතිකත්වයන් අතර වෙළඳාම/වෙළඳපොළ වෙනුවෙන් බෙදීමකින් තොරව, ජාතිවාදී මනෝභාවයන් පාලනය කරගෙන, එක්වීමේ ඉඩකඩක් (සහජීවනයක්) අඩුතරමේ ආර්ථික ක්‍රියාවලිය තුළ හෝ ලංකාවේ ජනතාව මෙතෙක් ඉතිරි වී තිබිණි. 30 වසරක යුද ක්‍රියාවලිය තුළ පවා වැල්ලවත්තේ සිංහල හා දෙමළ ව්‍යාපාරිකයා වෙළඳ වුවමනාවට හෝ එකට එක්විය. කල්මුණේ ව්‍යාපාරිකයා හා කොළඹ පිටකොටුවේ ව්‍යාපාරිකයින් එක්විය. ප්‍රභාකරන්ටත් කළ නොහැකි වූ ඒ ආර්ථිකය ජාතිවාදී ලෙස හා ආගමික ලෙස බෙදීම අන්තවාදී ආගමික උමතුවෙන් බෝම්බ පුපුරුවා ගත් සහරාන්ලා සහ එකට එකට එක කරමින් සිටින දේශපාලන සහරාන්ලා විසින් සාර්ථක කිරීමට දරන උත්සාහය දැන් කලඑළි බැස ඇත. ජනතාව එය පිළිගන්නේද? ප්‍රතික්ෂේප කරන්නේද? එම තෝරා ගැනීම අනුව රටේ හෙට දවසේ ආර්ථිකයේ ගමන තීරණය වනු ඇත.

1983 කළු ජූලිය වන විට රටේ පැවැති සමස්ත ණය බර රුපියල් කෝටි 9846කි. එවකට මුළු ජනගහනය එක්කෝටි පනස් හතර ලක්ෂයකි. ඒ නිසා එදා එක් පුද්ගලයකු මත වැටුණු ණය බර රුපියල් 6394ක් පමණි. අද වන විට එම ප්‍රමාණය රුපියල් කෝටි දශ ලක්ෂයකි. එක් පුද්ගලයකු ගෙවිය යුතු ණය බර රුපියල් 500,000 ඉක්මවයි. අද මේ අවුලන ජාතිවාදී බෙදීම අවසන් වන විට අනාගත පරම්පරාවන් ගෙවිය යුතු ණය බර කොපමණ විය හැකිද?

### සංචාරක කර්මාන්තය

ලංකාවේ විදේශ විනිමය ඉපයීමේ ප්‍රධාන ආදායම් මාර්ගය ගෘහ සේවය සඳහා රටවල්වලට යන ශ්‍රමිකයන් වන අතර, දෙවන ස්ථානය ඇඟලුම් අපනයනයටත්, ඊළඟට ප්‍රධාන තුන්වන ආදායම් මාර්ගය සංචාරක කර්මාන්තයටත් හිමිය. 2014 සිට 2018 කාල පරිච්ඡේදය තුළ ලංකාවට සංචාරකයන් පැමිණීම ලක්ෂ 15 සිට ලක්ෂ 23 දක්වා වර්ධනය වී තිබිණි. දකුණු ආසියාවේ කැපීපෙනෙනම නගරය ලෙස කොළඹ නගරය නම් කර තිබූ අතර පසුගිය කාලය තුළ සංචාරක ඉපැයීම්වලින් ලබන ආදායමද කැපී පෙනෙන වර්ධනයක් ලබා තිබුණි.

2017 වර්ෂයේදී සංචාරක කර්මාන්තයේ විදේශ විනිමය ඉපැයීම ඇමෙරිකානු ඩොලර් බිලියන 3.9ක්ව තිබූ අතර එය 2018 වසරේදී ඩොලර් බිලියන 4.3ක් දක්වා 11.6%ක වර්ධනයක් අත්පත් කරගෙන තිබුණි.

දැන් "4-21" ප්‍රහාරයෙන් මුළුමනින්ම මෙම සංචාරක කර්මාන්තය අර්බුදයට පත්ව ඇත. ආණ්ඩුව තාවකාලික විසඳුමක් ලෙස සංචාරක හෝටල් විසින් රජයට ගෙවිය යුතු වැට් බදු අඩු කිරීම සහ ණය හා වාරික පොලී ගෙවීමේ වසරක සහන කාලයක් ලබාදී ඇතත් එය මුළු මහත් සංචාරක ක්ෂේත්‍රයම මුහුණ දෙන අර්බුදයට ගැවෙන්නවත් තරම් නොවේ.

හෝටල් ක්ෂේත්‍රයේ මහාපරිමාණ, සුළු පරිමාණ මෙන්ම නේවාසික (Home stay) ලෙස වර්ග කිහිපයක්ම ඇත. නවීන තාක්ෂණය යොදා ගනිමින් අද බහුලව පවතින්නේ තුන්වන මට්ටමේ කුඩා, එමෙන්ම නවාතැන්පළවල සිදුකරන නේවාසික හෝටල් කර්මාන්තයයි. සංචාරක වෙළඳහල්ද ජාතික මට්ටමේ මෙන්ම සංචාරක ප්‍රදේශ අනුව සීගිරිය, හබරණ, පොළොන්නරුව, මහනුවර, වැලිගම, තංගල්ල, ආරුගම්බේ, පාසිකුඩා ආදී ප්‍රදේශ මට්ටමින්ද ක්‍රියාත්මකය. මෙම ප්‍රාදේශීය ලෙස ව්‍යාප්ත සංචාරක කර්මාන්තයේ වෙළඳසැල්වලට විවිධ භාණ්ඩ සැපයීමෙන් යැපෙන කුඩා පරිමාණ ව්‍යවසායකයන්, නිර්මාණකරුවන් විශාල ප්‍රමාණයකි. සංචාරක නියෝජිත ආයතනද එලෙසමය. බුකිංකොම්, ඇගොඩා වැනි ප්‍රධාන පෙළේ සංචාරක නියෝජිත වෙන්කිරීම් ආයතන මෙන්ම සාමාන්‍ය වශයෙන් පරිගණකයක් යොදා ගෙන එම සංචාරකයන්ට වෙන්කිරීම් කරදී කොමිස් මුදලක් ලබාගත් පුද්ගලයින් විශාල ප්‍රමාණයකි. එසේම සංචාරක කර්මාන්තයට බස්රථ, කුලීරථ, හා සෆාරි වාහන සැපයූ වාහන හිමිකරුවන්, රියදුරන්, සංචාරක මඟපෙන්වන්නන් ආදී ලෙස අතුරු කර්මාන්ත සහ අතුරු රැකියාවල නියුක්ත වූවන් විශාල ප්‍රමාණයකගේ ආදායම් මාර්ග අද වන විට මුළුමනින්ම බිඳ වැටී ඇත.

> දැනටත් 3.2%ක ආර්ථික වර්ධනයක් පමණක් ඇති ශ්‍රී ලාංකේය ආර්ථිකය සිංහල, දෙමළ, මුස්ලිම් ලෙස බෙදිය නොහැකි බව තේරුම් ගත යුතුව ඇත. හුදු ජාතිවාදී විරෝධයන්ගෙන් සිදුවන්නේ වැටුණු ආර්ථිකය තවත් අගාධයටම වැටීම හැර අන් යහපත් යමක් නොවන බව ලාංකේය ජාතිය ලෙස අප වටහා නොගන්නේ නම් පැදුරෙන් බිමටත් වැටුණු අපට සිදුවන්නේ කුමක්ද?

ආණ්ඩුව සංචාරක කර්මාන්තයේ බැංකු ණය හා වාරික ගෙවීමට පමණක් අවුරුද්දක සහනයක් ලබාදීමෙන් සංචාරක කර්මාන්තයට ගොඩඒමක් නැත. ස්ථිර ලෙස සංචාරක කර්මාන්තය නඟා සිටුවීමට නම්, පළමු හා අත්‍යවශ්‍ය පියවර වන්නේ යළි සංචාරකයන්ට පැමිණීමේ විශ්වාසය සකස් කිරීමයි. ඒ සඳහා වන ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් ක්‍රියාමාර්ගයන් ගැනීමයි. බලය ගැනීමට අපේක්ෂාවෙන් තමන්ගේම පිරිස් ලවා පාසල් ළඟ පරණ බෝම්බ අටවන පාදඩ දේශපාලන සංස්කෘතියක් තුළ එවැනි ධනාත්මක විශ්වාසයක් ගොඩනැගීමේ ක්‍රියාමාර්ග අපේක්ෂා කළ හැක්කේ කෙසේද? සිංහල බහුතරයේ ඡන්ද ගොඩ කඩා ගැනීමට ඉවක් බවක් නැතිව මාධ්‍ය යොදා ගැනීමෙන් ජාතිවාදය වපුරන දේශපාලකයන්ගෙන් ආර්ථිකයට එවැනි සහතිකයක්, තහවුරු කිරීමක් අපේක්ෂා කිරීම උගහටය.

### අපනයන හා ආනයනය

4-21 ප්‍රහාරයෙන් සති තුනකට පසු හදිස්සියේම මිනුවන්ගොඩ, හෙට්ටිපොළ හා කුලියාපිටිය ඇතුළු ප්‍රදේශ කිහිපයකම කඩ ගිනි තබමින් හදිස්සියේ මතුවූ 'ජාතිප්‍රේමයක්', 'දේශීයත්වයක්' රඟ දක්වනු දැකිය හැකිවිය. ඒ සමගම සමාජජාලා මගින් දේශීය සිංහල කඩ උස්සාගෙන යාමට ව්‍යාපාරයක්ද 'ක්ෂණිකව' (සංවිධානයක් ලෙසටම) බිහිවිය. දේශීය අතරමැදි වෙළඳාමේ බොහෝ කටයුතු මුස්ලිම් ව්‍යාපාරික ප්‍රජාව අතින් සිදුවූ බව නොරහසකි. එය විටෙක දේශීය ඉදිකිරීම් ක්ෂේත්‍රයේ අවශ්‍ය අතරමැදි උපාංග සැපයීම විය. එසේම අපනයන ක්ෂේත්‍රයේ ගම්මිරිස්, කුරුඳු, පුවක් ඇතුළු දේ විය. ගෙවල්වලින් ඉවත් කරන බෝතල් පත්තර සිට අපනයන වෙළඳාමේ විශාල පංගුවක්ද කොළඹ පිටකොටුවේ සහ බොහෝ ප්‍රධාන නගරවල ඉදිකිරීම් උපකරණ වෙළඳාමේදී ඔවුහු ප්‍රධාන අතරමැදියෝ වූහ.

15 වැනි පිටුවට



"සාමාන්‍ය නිද්‍රාශීලී ජීවිතයේදී ජනතාව අවුරුද්දකින් උගෙන ගන්නවාට වඩා දෑ විප්ලවයක් අතරතුර එක් සතියකදී ඔවුහු උගෙන ගනිති. එසේ වන්නේ, මුළු ජනතාවගේම ජීවිතයේ තියුණු වෙනස්වීමක අවස්ථාවේදී, ජනතාවගේ විවිධ පංති අනුගමනය කරන අරමුණුද, ඒවාට ඇති ශක්තියද, ඒවා උපයෝගී කරගන්නා ක්‍රමද, ඉතාමත් පැහැදිලි වන හෙයිනි."

**ලෙනින්**
**තෝ:කෘ: 5 වෙළුම, 198 පිටුව**

# ඉන්දියාව: නැවතත් මෝදි අතටම

ඉන්දීය පාර්ලිමේන්තු මැතිවරණයෙන් බහුතර ආසන සංඛ්‍යාවක් දිනා ගනිමින් භාරතීය ජනතා පක්ෂය ජයග්‍රහණය කර තිබේ. රට පුරා පැතිරුණු විරැකියාව, ඉහළ යන ජීවන වියදම, කුලවාදී, ආගම්වාදී හා ජාතිවාදී ගැටුම් උත්සන්න වීම, හින්දු මූලධර්මවාදී පාලනය, ග්‍රාමීය දුප්පත්කම ආදී බරපතළ ගැටලු එසේම තිබියෙදී හින්දු ජාතිකවාදී භාරතීය ජනතා පක්ෂය මීට පෙර ලබාගත් ජයග්‍රහණයද අභිබවමින් යළි ජයග්‍රහණයක් අත්කරගෙන තිබේ.



ආසන 545කින් යුතු ඉන්දීය පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ආසන 303ක් දිනා ගැනීමට භාරතීය ජනතා පක්ෂය සමත් විය. (බහුතරය සඳහා අවශ්‍ය වන්නේ ආසන 272ක් පමණි.) 2014 මැතිවරණයේදී ඔවුන් ආසන 282ක් ලබාගත් අතර මෙවර එය ආසන 21කින් වැඩිවී ඇත. භාරතීය ජනතා පක්ෂයේ නායකත්වය දෙන ජාතික ප්‍රජාතන්ත්‍රවාදී සන්ධානය ලබාගත් මුළු ආසන සංඛ්‍යාව 353 (45%)කි. මෙහිදී විශේෂය වී ඇත්තේ භාරතීය ජනතා පක්ෂය ජයගත් ආසන අතරින් 224ක්ම ඔවුන් 50%කට වඩා වැඩි ඡන්ද ප්‍රතිශතයක් ලබා ගැනීමයි. පසුගිය මැතිවරණයට වඩා ආසන ප්‍රමාණයත්, ලබාගත් ඡන්ද ප්‍රතිශතයත් ඉහළ දමා ගැනීමට භාරතීය ජනතා පක්ෂයත්, එය නායකත්වය දෙන ජාතික ප්‍රජාතන්ත්‍රවාදී සන්ධානයත් සමත් වී ඇත. මැතිවරණ ප්‍රතිඵල විශ්ලේෂණයන්ට අනුව භාරතීය ජනතා පක්ෂය ඉන්දියාවේ ජනගහනයෙන් 15%ක් වූ මුස්ලිම් ජනතාවගේ ඡන්දවලින් 8%ක් ලබා ගැනීමටත්, සැලකිය යුතු ගොවිජන ඡන්ද ප්‍රමාණයක් හා පළමු වරට ඡන්දය ප්‍රකාශ කරන්නන්ගේ ඡන්ද ප්‍රමාණයකුත් ලබා ගැනීමට සමත්ව ඇත. භාරතීය ජනතා පක්ෂයේ ග්‍රාමීය ඡන්ද පදනම 6.6%කින්ද අර්ධ ග්‍රාමීය ඡන්ද පදනම 3.5%කින්ද නාගරික ඡන්ද පදනම 2.2%කින්ද ඉහළ ගොස් තිබේ.

භාරතීය ජනතා පක්ෂයේ සහ ජාතික ප්‍රජාතන්ත්‍රවාදී සන්ධානයේ ප්‍රධාන ප්‍රතිවාදියා වූ රාවුල් ගාන්ධිගේ නායකත්වයෙන් යුතු ඉන්දීය කොංග්‍රසයට මෙවර මහ මැතිවරණයෙන් ලබාගත හැකි වූයේ ආසන 52 (19.54%)ක් පමණි. 2014දී එය ලබාගත්තේ ආසන 44කි. කොංග්‍රස් පක්ෂය නායකත්වය දෙන එක්සත් ප්‍රගතිශීලී සන්ධානය ආසන 91ක් දිනා ගැනීමට සමත් විය. 2014 මැතිවරණයේදී ඔවුන් ලබා ගත්තේ ආසන 60ක් පමණි. ඉන්දියානු මැතිවරණ නීතියට අනුව නිල විපක්ෂය බවට පත්වීමට නම් සමස්ත ආසනවලින් 10% ක අවමයක් ලබාගත යුතුයි. එනම් ආසන 55ක් ලබාගත යුතුය. එබැවින් මෙවර ඉන්දීය පාර්ලිමේන්තුව තුළ කොංග්‍රස් පක්ෂයට නිල විපක්ෂය ලෙස කටයුතු කළ නොහැකිවනු ඇත.

මෙවර මැතිවරණයේදී අනෙකුත් සියලුම පක්ෂ එකතුව ආසන 98ක් ලබාගෙන තිබේ. ඒ අතරින් ඉන්දීය කොමියුනිස්ට් පක්ෂයට (CPI) ආසන 02ක්ද ඉන්දීය මාක්ස්වාදී කොමියුනිස්ට් පක්ෂයට ආසන 03ක්ද (CPI -M)හිමිව ඇත.

**පසුගිය අවුරුදු 05ක සිය පාලන කාලය තුළදී ඉන්දීය පාලක භාරතීය ජනතා පක්ෂයත් එය නායකත්වය දෙන ජාතික ප්‍රජාතන්ත්‍රවාදී සන්ධානයත් රට තුළ මතුවී ඇති ජනතා ප්‍රශ්න විසඳීමට අසමත් වුවද ජනතාව යළිත් වරක් පෙරට වඩා වැඩි ඡන්ද ප්‍රමාණයකින් ඔවුන් බලයට පත්කර තිබේ.**

ඉන්දියාවේ මෙම මැතිවරණ ප්‍රතිඵලය විසින් පෙන්වා දෙනු ලබන්නේ එක් අතකින් ධනේශ්වර ක්‍රමයේ අර්බුදයත්, එකී අර්බුදයට යම් ආකාරයක හෝ සහනක් ලබාදීමට සාම්ප්‍රදායික ධනේශ්වර දේශපාලන පක්ෂවලට ඇති අසමත්භාවයත්, අනෙක් අතින් ධනේශ්වර ක්‍රමයේ අර්බුදය හමුවේ එහි විකල්පය බවට පත්වීමට වමේ පක්ෂවලට නොහැකිවීමත්‍ය. එහි ප්‍රතිඵලය වී ඇත්තේ අන්ත ජාතිවාදී, ආගම්වාදී, ෆැසිස්ට් පන්නයේ කණ්ඩායම් යළි යළිත් බලයට පත්වෙමින් තිබීමය.

# වෙනිසියුලාව: විපක්ෂයේ කුමන්ත්‍රණය ලත් තැනම ලොප්වී

එක්සත් ජනපද පාලනයත් වෙනිසියුලානු විපක්ෂයත් එක් වී නිකොලොස් මධුරෝගේ පාලනයට එරෙහිව ක්‍රියාත්මක කළ තවත් එක් කුමන්ත්‍රණයත් පරාජය කර දැමුණි. මෙවර කුමන්ත්‍රණය ආරම්භ වූයේ අප්‍රේල් 30 අළුයමය. වෙනිසියුලාවේ ස්වයං ප්‍රකාශික අන්තර් කාලීන ජනාධිපතිවරයා වූ ජුවාන් ගුඅයිඩෝ, හමුදාව හැර ගිය හමුදා සාමාජිකයින් පිරිසක් සමඟ අවුරුදු 13ක සිර දඬුවමක් විඳිමින් සිටින එරට විපක්ෂයේ ප්‍රධානියා වූ ලියෝ පෝල්ඩෝ ලෝපේස් නිවාස අඩස්සියෙන් මුදා එරට අග නගරය වූ කැරකස්හි ප්ලාසා අල්ටමරාහිදී සිය අනුගාමිකයින් අමතා ජනාධිපති නිකොලොස් මධුරෝ පන්නා දැමීම සඳහා පෙරට එන ලෙස ඉල්ලා සිටියේය. ඒ අතරම වෙනිසියුලානු හමුදාවට ආයාචනා කරමින් මධුරෝගේ පාලනයට එරෙහිව කැරලි ගසන ලෙසටද ඉල්ලා සිටියේය.



ඊට ප්‍රතිචාර දක්වමින් සිය ගණනක් වූ ඔහුගේ අනුගාමිකයෝ ජනාධිපති මන්දිරය වෙතට ගමන් ගත් අතර ඒ අතරතුරදී රට සිවිල් ආරක්ෂකයන් සමඟ ගැටුමක් ඇති කර ගත්හ. එහිදී කඳුළු ගෑස් ප්‍රහාරයක් ඔවුන් වෙත එල්ල කරනු ලැබිණි. ඔවුන් ජනාධිපති මන්දිරය වෙත පැමිණෙද්දී එය චාවේස්වාදීන් විසින් රැකවල්ලා තිබූ බැවින් ඔවුන්ට පසු බැසීමට සිදු විය.

මෙම සිදුවීමට සමගාමීව එක්සත්ජනපද ආරක්ෂක ලේකම් පොම්පියෝ සහ එරට ආරක්ෂක උපදේශක ජෝන් බෝල්ටන් මාධ්‍ය හමුවක් පවත්වමින් කියා සිටියේ වෙනිසියුලානු ප්‍රශ්නය විසඳීමට හමුදා මැදිහත්වීමක් අවශ්‍ය නම් තමන් ඊටද සූදානම් බවය. රට පුරා විසිරුණු ජුවාන් ගුඅයිඩෝගේ ආධාරකරුවන් ප්‍රදේශ කිහිපයක වීදිවලට බැස විරෝධතා දැක්වුවද ඒවා විසුරුවා හැරීමට ආරක්ෂක අංශ සමත් විය.

වෙනිසියුලානු ආරක්ෂක අංශ ප්‍රධානීහු තවදුරටත් එරට ජනාධිපති නිකොලාස් මධුරෝට සහය පළ කරමින් ජනාධිපති මන්දිරය ආරක්ෂා කළ අතර රට පුරා ආරක්ෂාවද තහවුරු කිරීමට සමත් වූහ. මේ අතර නිවාස අඩස්සියෙන් නිදහස් වූ ලියෝ පෝල්ඩෝ ලෝපේස් පළමුව චිලී තානාපති කාර්යාලය තුළ රැකවරණය පැතුවද එය ප්‍රතික්ෂේප කරනු ලදී. පසුව ඔහුට දේශපාලන රැකවරණ ලබාදීමට ඉදිරිපත් වූයේ ස්පාඤ්ඤයයි. වෙනිසියුලානු ආරක්ෂක ඇමති එදිනම ප්‍රකාශ කළේ කුමන්ත්‍රණ උත්සාහය මුළුමනින්ම පරාජය කළ බව සහ වෙනිසියුලානු ආරක්ෂක හමුදා දිගටම ජනාධිපති මධුරෝට අවනතව කටයුතු කරන බවය.

**එක්සත් ජනපදයේ අනුදැනුම හා මෙහෙයුම මත මධුරෝ පාලනයට එරෙහිව දියත් කළ තවත් කුමන්ත්‍රණයක් එලෙස පරාජයට පත්කරනු ලැබීම වෙනිසියුලානු විපක්ෂයට පමණක් නොව එක්සත් ජනපදයටද ප්‍රබල පරාජයකි. එක්සත් ජනපදය ඊට ප්‍රතිචාර දැක්වූයේ කියුබාවට එරෙහිව සම්බාධක දැඩි කිරීමෙනි.** කුමන්ත්‍රණය සිදුවූ අප්‍රේල් 30වැනිදා ඩොලඩ් ට්‍රම්ප් ට්විටර් පණිවිඩයක් මගින් ප්‍රකාශ කර තිබුණේ කියුබාව තවදුරටත් වෙනිසියුලාවට සහාය පල කරන්නේ නම් තමන් කියුබාවට අංග සම්පූර්ණ සහ සෑම අතින්ම සම්බාධක පැනවීමට කටයුතු කරන බවය. ඔහු එමගින් තවදුරටත් පවසා තිබුණේ කියුබානු හමුදාව සහ ආරක්ෂක සේවාවන් වෙනිසියුලාව තුළ සිය මෙහෙයුම් නතර නොකළහොත් ඉහළ මට්ටමේ සම්බාධක පනවන බවය.

ට්‍රම්ප්ගේ මෙම ප්‍රකාශයට වහාම පිළිතුරු සැපයූ කියුබානු විදේශ ඇමතිවරයා එකී චෝදනා ප්‍රතික්ෂේප කළ අතර කියුබානු හමුදාව වෙනිසියුලාව තුළ ක්‍රියාත්මක නොවන බවත්, සම්බාධක තර්ජනය පිළිකුලින් හෙළා දකින් බවත් පැවසීය. මේ වන විට කියුබානුවන් 201,000ක් පමණ වෙනිසියුලාව තුළ මානුෂික කටයුතුවල නිරතව සිටී. ඔවුන් අතුරින් බොහෝ පිරිසක් වෛද්‍යවරු සහ සෞඛ්‍ය සේවකයන්ය. එය සිදුවන්නේ 2000 වසරේ දී පමණ දෙරට අත්සන් කළ සහයෝගීතා ගිවිසුමකට අනුවය.

ප්‍රකාශ කළ අන්දමට එක්සත් ජනපදය කියුබාවට එරෙහිව සම්පූර්ණ සම්බාධක පැනවීමට කටයුතු කරන ලදී. එහෙත් ඒ සමඟම යුරෝපා සංගමය ප්‍රකාශ කළේ තමන් ඊට එකඟ නොවන බවත් යුරෝපා සංගමයේ ව්‍යාපාරයන්ට එරෙහිව එක්සත් ජනපදය කටයුතු කළහොත් තමන් ඊට මැදිහත්වන බවය. මේ අතර චීනයත්, රුසියාවත් එක්සත් ජනපදය විසින් සිදුකළ මෙකී මැදිහත්වීමට විරෝධය පළකර තිබුණි.

මේ අනුව පෙනී යන්නේ එක්සත් ජනපදයට වෙනිසියුලාවට හා කියුබාවට එරෙහිව කටයුතු කිරීම එතරම් පහසුදායක වී නැති බවය. ලෝකය තුළ එක්සත් ජනපද බලපෑම දුර්වල වී තිබීමත්, චීනය, රුසියාව වැනි රටවල් ලෝක බලවතුන් ලෙස වර්ධනය වෙමින් තිබීම එයට බලපා ඇති බව පෙනේ.

## චීනය: දරිද්‍රතාව මැඩලීමේ එක් කඩුල්ලක් පැන



චීන කොමියුනිස්ට් පක්ෂයේ පදනම් ප්‍රදේශයක් වන යනාස් ප්‍රදේශය දුප්පත්කම තුරන් කළ ප්‍රදේශයක් බවට ප්‍රකාශයට පත් කෙරිණි. යැන්ඩුආන් සහ මිචුආන් කෝරළ (county) ප්‍රදේශ දෙකෙහි දුප්පත්කම අවසන් වශයෙන් නැතිකල අතර යනාන් ප්‍රදේශයේ දුප්පත්කම තුරන් කල ප්‍රදේශයක් බවට මැයි 07වැනි දා ෂාන්ක්ෂි ප්‍රාදේශීය ආණ්ඩුව විසින් ප්‍රකාශයට පත්කරනු ලැබිණි.

විප්ලවීය අරගලය තුළදී කොමියුනිස්ට් පක්ෂයේ පදනම් ප්‍රදේශයක් වූ මෙම ප්‍රදේශය තුළ 1935 සිට 1948 දක්වා කොමියුනිස්ට් පක්ෂ මූලස්ථානය පිහිටුවා තිබිණි. දැනටමත් එකී ප්‍රදේශය තුළ විප්ලවයට සම්බන්ධ ස්ථාන 350ක් පමණ සුරක්ෂිත කර තිබේ.

මෙම ප්‍රදේශයේ කලක් චීනයේ දුප්පත්ම ප්‍රදේශය බවට පත්ව තිබුණු අතර, දුප්පත්කම තුරන් කිරීමේ වැඩසටහන යටතේ පසුගිය අවුරුදු 04ක කාලය තුළ ඩොලර් මිලියන 920 ක් පමණ මෙම ප්‍රදේශයට යෙදවුණු අතර පක්ෂ නායකයෝ 1784ක් වැඩ කණ්ඩායම් 1546ක් පක්ෂ ක්‍රියාධරයෝ 37,400ක් මේ වෙනුවෙන් අනියුක්ත කරනු ලැබූහ. මෙම මෙහෙයුම අවසානයේදී දුප්පත් ගම්මාන 693ක් සහ පුද්ගලයෝ 195,000ක් දුප්පත්කමින් මුදාගනු ලැබූහ.

## යුරෝපය: හරිත පක්ෂය ඡන්දයෙන් ඉදිරියට





යුරෝපා පාර්ලිමේන්තු මැතිවරණයේදී අන්ත දක්ෂිණාංශික පක්ෂ පසුපසට තල්ලු කරමින් හරිත පක්ෂය සහ සමාජවාදී පක්ෂ ඉදිරියට පැමිණ තිබේ. රටවල් 28 ක් නියෝජනය කරමින් මන්ත්‍රීවරු 751 ක් තෝරා පත්කරගැනීම සඳහා මැයි 23 - 26 දක්වා මෙම මැතිවරණය පැවැත්වුණි. මිලියන 425ක ජනතාවක් ඡන්දය ප්‍රකාශ කිරීමට සුදුසුකම් ලබා සිටියහ. 1994න් පසු වැඩිම ප්‍රතිශතයක් ( 50.5% ) ඡන්දය ප්‍රකාශ කළ මැතිවරණය බවට මෙය පත්වී තිබේ. එතෙක් යුරෝපා පාර්ලිමේන්තුව තුළ බහුතර නියෝජනයක් කළ පාලක දක්ෂිණාෂික පක්ෂ සහ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂවල බහුතරය අහිමිවී ඇත. මෙම මැතිවරණය තවත් විශේෂ කරුණක් වී ඇත්තේ තරුණ සහභාගිත්වය ඉහළ යාම සහ ඔවුන් ප්‍රගතිශීලී දිශානතියක් වෙනුවෙන් ඡන්දය ප්‍රකාශ කර තිබීමය. සමස්ත ප්‍රතිඵලය තුළ අන්ත දක්ෂිණාශික පක්ෂ නියෝජනය 25%කට වඩා අඩු වී ඇති අතර, හරිත පක්ෂ නියෝජනය මන්ත්‍රීවරු 17 සිට 69 දක්වා ඉහළ ගොස් ඇත.

## ප්‍රංශය: මධ්‍යධරණියේ නාවික බලය පතුරවා



ප්‍රංශය හා ස්යිප්‍රස් ආරක්ෂක ඇමතිවරු පසුගියදා සයිප්‍රසයේ ඉමැන්ජිලෝ ෆ්ලෝරානිස් නාවුක හමුදා කඳවුර නවීකරණය සඳහා ගිවිසුමක් අත්සන් කළහ. මධ්‍යධරණි මුහුද තුළ පිහිටා ඇති මෙම නාවුක හමුදා කඳවුර නවීකරණයෙන් පසු විශාල යුද නැව් නවතා තැබීමට හැකිවනු ඇත. මෙය මධ්‍යධරණි මුහුදු ප්‍රදේශය තුළ ප්‍රංශ යුද බලය තවදුරටත් වැඩි කර ගැනීමේ උත්සාහයක් ලෙස සැලකිය හැකිය.

## එක්සත් ජනපදය: වෙළඳ යුද්ධයෙන් ආර්ථික අවපාතයකට



එක්සත් ජනපදය හා චීනය අතර, ආරම්භ වී ඇති වෙළඳ යුද්ධය හේතුවෙන් ඉදිරි දෙවසර තුළ එක්සත් ජනපදය තුළ ආර්ථික අවපාතයක් ඇතිවිය හැකි යැයි අනාවැකි පළ වී තිබේ. රොයිටර් පුවත් සේවය සිදුකළ මත විමසුමකට අනුව ආර්ථික විද්‍යාඥයින් අතරින් 40%ක්ම ඒ බව ප්‍රකාශ කර තිබේ. මේ වන විට එක්සත් ජනපදය හා චීනය තම රටවලට ආනයනය කෙරෙන අනෙකාගේ භාණ්ඩ සඳහා තීරු බදු පනවමින් වෙළඳ යුද්ධයකට පිවිස ඇත.

# සමාජවාදී රටක පවුලක වියදම් රටාව

[ සෝවියට් අත්දැකීම ඇසුරින් ]

සමාජවාදයට එරෙහිව පතුරුවා ඇති අසත්‍ය ප්‍රචාර හේතුවෙන් බොහෝ දෙනෙක් සිතා සිටිනුයේ සමාජවාදී රටක එදිනෙදා ජීවිතය බොහෝ දුෂ්කරතාවයන්ගෙන් පිරීගිය එකක් ලෙසටය. අධික ලෙස වෙහෙසී වැඩකිරීම, භාණ්ඩ හිඟය, වෙනත් අගහිඟකම් අනිවාර්ය උරුමයක් ලෙසටය. එහෙත් සැබෑ තත්වය ඊට හාත්පසින්ම වෙනස්ය. සමාජවාදී රටක සාමාන්‍ය පවුලක වියදම් රටාව කෙසේද යන්න පිළිබඳව මෙවර කලාපයෙන් සාකච්ඡා කිරීමට අපි බලාපොරොත්තුවන්නේ එකී මිථ්‍යාව යම් පමණකට හෝ බිඳහෙළීමේ උත්සාහයක් ලෙසටය.

## පොදු තත්වය

සමාජවාදයේදී, කර්මාන්තයේ, කෘෂිකර්මාන්තයේ හා අනෙකුත් ක්ෂේත්‍රවල අරමුණ හුදු ලාභ ඉපැයීම නොවේ. සමාජවාදය යටතේ සමාජ නිෂ්පාදනයේ ඉහළම අරමුණ වන්නේ ජනතාවගේ වර්ධනය වන ද්‍රව්‍යමය, සංස්කෘතිමය හා අධ්‍යාත්මික අවශ්‍යතාවන් හැකි උපරිම ආකාරයෙන් තෘප්ත කිරීමයි.

ලොව ප්‍රථම සමාජවාදී රාජ්‍යය වූ සෝවියට් දේශය මේ අතින් ඉහළම ආදර්ශයක් සපයා තිබුණි. සමාජවාදී විප්ලවය ජයග්‍රහණයෙන් පසුව එරට ජනතාවගේ ජීවන තත්වය ස්ථාවර ලෙස වර්ධනය විය. 1940ට සාපේක්ෂව 1982 වෙද්දී ජාතික ආදායම 15.1 ගුණයකින් ඉහළ ගියේය. ඒක පුද්ගල මූර්ත ආදායම හය ගුණයකින් ඉහළ ගියේය. සමූහ ගොවිපළවල ගොවීන්ගේ ඒක පුද්ල මූර්ත ආදායම 7.1 ගුණයකින් වැඩිවිය.

ජනතාවගේ වියදම් අඩුකිරීමටද, සමාජවාදී රජය මැදිහත් විය; ඒ අනුව සෝවියට් රජය ප්‍රධාන ආහාර ද්‍රව්‍ය හා හුවමාරු භාණ්ඩවල සිල්ලර මිල ස්ථාවර මට්ටමක රඳවා ගැනීම සඳහා කටයුතු කළේය. සීනි, සමහර බෝතල් කළ ආහාර, සමහර ටින්කළ ආහාර, සමහර මාළු වර්ග, එළවළු තෙල්, ධාන්‍ය පිටි, මැකරෝනි වර්ග, බේකරි නිෂ්පාදන හා පාන් ආදියෙහි මිල 1955 වසරේ සිට වෙනස් නොවුණි. මස් හා කිරි නිෂ්පාදන මිල 1962 වසරේ සිට වෙනස් නොවුණි. රෙදිපිළි, ඇඳුම්, පාවහන් සහ එවැනි එදිනෙදා භාවිතා කරනු ලැබූ බොහෝ භාණ්ඩ වර්ග ප්‍රමාණයක මිල සහ රෙදි සෝදන යන්ත්‍ර, වැකුම් ක්ලීනර්, ශීතකරණ, ටේප් රෙකෝඩර්, ගුවන්විදුලි යන්ත්‍ර, රූපවාහිනී යන්ත්‍ර ආදී භාණ්ඩවල මිල ස්ථාවරව පවත්වාගෙන යනු ලැබිණි.

## සාමාන්‍ය සෝවියට් පවුලක ස්වභාවය

සෝවියට් සමාජ විද්‍යාඥයෝ සෝවියට් පවුලක මාසික වියදම පිළිබඳ සමීක්ෂණයක් සිදු කළහ. ඒ සඳහා පවුල් 62,000ක් සම්බන්ධකර ගත් අතර, 1984 වසරේදී එහි වාර්තාව එළි දක්වනු ලැබිණි.



සෝවියට් සංගමයේ සාමාන්‍ය පවුලකට සැමියාත්, බිරිඳත්, දරුවන් දෙදෙනාත් අයත් වෙති. ඔවුහු රජය විසින් සපයන ලද කාමර තුනකින් යුතු තට්ටු නිවාසයක වාසය කරති. අඹු සැමියන් දෙදෙනා එම නිවසට මඳක් ඈතින් පිහිටි ස්ථානයක රැකියාවෙහි නිරත වූහ. දරුවන් දෙදෙනාගෙන් වැඩිමලා පාසලටද දෙවැන්නා බාලාංශ පංතියකටද යයි.

පවුලේ ආදායම වශයෙන් සැලකෙන්නේ අඹු-සැමියන් දෙදෙනාට ලැබෙන වැටුපය. අඹු-සැමි දෙදෙනාම රක්ෂාව කරන්නේ නම් ඔවුන් හට ලැබෙන සාමාන්‍ය වාර්ෂික වැටුප රූබල් 4000කි. එනම් දළ වශයෙන් මසකට රූබල් 335කි. මෙම මුදලින් අනිවාර්ය බදු හා වෙනත් ගෙවීම් අඩු කළ යුතුවේ. කර්මාන්ත ශාලාවක හෝ කාර්යාලයක හෝ සේවයේ නියුක්ත පුද්ගලයෙකු විසින් ගෙවිය යුතු බදු ප්‍රමාණය පඩියෙන් 8.1%කට වැඩි නොවුණි. (ශ්‍රී ලංකාවේ එක් පුද්ගලයෙකුගේ වැටුපකින් ඍජු බදු ලෙස ගෙවිය යුතු ප්‍රතිශතය 16%කි.) මීට අමතරව වෘත්තීය සමිති සහ පොදු සංවිධානවලට ගෙවිය යුතු මුදලද බදු ගණණය කරන ආදායමෙන් අඩු කළ යුතු වේ.

මේ සියල්ල අඩුකළ පසු සාමාන්‍ය පවුලක ආදායම මසකට රූබල් 280ක් පමණ වේ. මෙම මුදලින් ගෙවල් කුලිය අඩුකළ යුතුය. රජය විසින් ගෙවන සහනාධාර නිසා සෝවියට් වැසියන් ගෙවන ලද්දේ ඉතා අඩු ගෙවල් කුලියකි. එම මුදල රූබල් 20ක් පමණ විය. එනම් සමස්ත වැටුපෙන් 6%කි. ශ්‍රී ලංකාවේ සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ ගණනය කිරීම්වලට අනුව ලාංකිකයෙකුගේ වැටුපෙන් ගෙවල් කුලිය 11.1%ක ප්‍රතිශතයකි. (2016)

අඹු-සැමි දෙදෙනාම රැකියාවට යාම සඳහා වැයවන ගමන් වියදම මසකට රූබල් 6ක් පමණ වේ. එනම් වැටුපෙන් 1.8%කි. දිවා ආහාරය සඳහා එක් අයෙකුට කොපෙක් 75 සිට 80 දක්වා ප්‍රමාණයක් වියදම් වේ. එවිට වැඩ කරන දවස් 22කින් යුතු මාසයකට වැයවන මුළු මුදල රූබල් 35ක් පමණ වේ. බාලාංශ පාසලකට යවන දරුවෙකු සඳහා මසකට වැයවන වැඩිම මුදල රූබල් 12.5කි. මේ සියල්ල එකතු කළ විට මුළු මුදල රූබල් 70ක් පමණ වේ.

> 1962දී පමණ සෑම සෝවියට් පවුලක්ම ස්වකීය ආදායමෙන් සෑම රූබල් 100කින්ම රූබල් 4ක් ඉතිරි කිරීමේ බැංකුවක තැන්පත් කළේය. 1982 වන විට එම මුදල රූබල් 15ක් දක්වා ඉහළ ගොස් තිබුණි. බොහෝ දෙනකු මුදල් ඉතිරි කළේ අරමුණක් ඇතිව නොවේ. සමහරු මුදල් ඉතිරි කළේ අවශ්‍ය වුවහොත් ගන්නටය යන ආකල්පය උඩය. සෝවියට් වැසියන් මුදල් ගැන එතරම් සැලකිල්ලක් නොදැක්වූයේත්, අතමිට දිගහැර වියදම් කළේත් සියලු දෙනාටම රැකියා තිබූ හෙයිනි. 1930 මාර්තු මාසයේ සිට සෝවියට් දේශය තුළ විරැකියාව නොපැවතුණි.

පවුලක අයවැය සකස් කිරීමේදී ගෙදරදී ගන්නා කෑම-බීම සඳහා යන වියදම් ගණන් බැලීම ඉතා වැදගත් සේම ඉතා අමාරු කටයුත්තකි. කෑමබීම පිළියෙල කිරීමට ගතවන කාලය, ආහාරයට ගන්නා කෑම වර්ග, කෑමට ඇති රුචිය ආදිය අනුව වියදම් වෙනස් වෙයි. ඒ සඳහා මසකට රූබල් 130ක් පමණ වැය වෙතැයි සිතිය හැකිය. එනම් වැටුපෙන් 39%කි. රැකියා ස්ථානයේදී ආහාර සඳහා යන වියදමද ඊට එක් කළ විට රූබල් 165ක් පමණ වේ. එනම් වැටුපෙන් 49.5%ක් ආහාර සඳහා වියදම් වේ. (ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පුරවැසියෙකුගේ වැටුපෙන් 65.2%ක්ම වියදම් කරන්නේ ආහාර සඳහාය. - සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ වාර්තාව)

ඉහත සඳහන් කරුණු සඳහා සෑම මාසයක් පාසාම මුදල් වියදම් කළ යුතුය. මේ සියලුම වියදම් අඩුකළ පසු වර්ෂයකට ඉතිරිවන රූබල් 1000ක පමණ මුදල ඇඳුම්, පැළඳුම්, ගෘහ භාණ්ඩ ඇතුළු වෙනත් අවශ්‍ය දෑ ගැනීමටද අවුරුදු නිවාඩුව ගත කිරීමටද වැය වෙයි.

වෛද්‍ය පහසුකම් හා අධ්‍යාපනය සඳහා යන වියදම පවුලේ අයවැයට එකතු නොවිණි. වෛද්‍ය පහසුකම්, අධ්‍යාපනය ඇතුළු තවත් බොහෝ සේවා සෝවියට් රජය සෑම රටවැසියෙකුටම නොමිලයේ සැපයූ හෙයිනි. නිදසුනක් වශයෙන් සෝවියට් සංගමයේ අනිවාර්ය ද්විතියීය අධ්‍යාපනය ආරම්භකොට තිබුණි. ඒ සඳහා රජය වර්ෂයක් පාසා සෑම ශිෂ්‍යයෙකුම වෙනුවෙන් රූබල් 200ක් පමණ වියදම් කළේය. ඒ අතර පෙර පාසල් දරුවන්ගේ ආරක්ෂාව සඳහා පවත්වාගෙන යනු ලබන ආයතන වෙනුවෙන් වැයවන මුදලින් 60%ක් පමණ දැරුවේ රජයයි. තරුණ පුරෝගාමීන් වෙනුවෙන් පවත්වන ග්‍රීෂ්ම හා සීත ඍතුවේ නිවාඩු කඳවුරු නඩත්තුව සඳහා වැයවන මුදලින් අඩක් නොමිලයේය. අනෙක් කොටස් සඳහා අය කළේ අඩු මුදලකි. මව්වරුන් සහ දරුවන් සඳහා ගෙවනු ලැබුවේ විශේෂ අරමුදල්වලිනි. ඒ අරමුදල් සඳහා රටවැසියන්ගේ ශතයක්වත් අය නොකෙරිණි. විශේෂ දීමනා වශයෙන් හතර දෙනෙකුගේ පවුලකට වර්ෂයකට රූබල් 2000ක් පමණ ලැබුණි.

සෝවියට් වැසියන්ගේ ජීවන තත්වය නිරතුරුවම දියුණු විය. ඒක පුද්ගල ආදායම 1957 සිට 1982 දක්වා වසර 25ක් තුළ තුන්ගුණයකින් වැඩිවුවද මූලික භාණ්ඩවල මිල හා සේවා ගාස්තු වැඩි නොවුණි.

සෝවියට් සමාජ විද්‍යාඥයන් බොහෝ කාලයක සිට කරන ලද පර්යේෂණවලට අනුව අඩු ආදායමක් ලබන පවුල් අතරින් අයවැය සටහන් කළේ 17%ක් පමණි. ඒ, සාමාන්‍ය ආදායම් ලබන පවුල් අතරින් 15%කි. හොඳ ආදායමක් ලබන පවුල් අතරින් 8%කි. අනෙක් අය වියහියදම් ගැන සැලකිලිමත් නොවූහ.

## සෝවියට් වැසියන් මුදල් ඉතිරි කළේ කෙසේද?

1962දී පමණ සෑම සෝවියට් පවුලක්ම ස්වකීය ආදායමෙන් සෑම රූබල් 100කින්ම රූබල් 4ක් ඉතිරි කිරීමේ බැංකුවක තැන්පත් කළේය. 1982 වන විට එම මුදල රූබල් 15ක් දක්වා ඉහළ ගොස් තිබුණි. බොහෝ දෙනකු මුදල් ඉතිරි කළේ අරමුණක් ඇතිව නොවේ. සමහරු මුදල් ඉතිරි කළේ අවශ්‍ය වුවහොත් ගන්නටය යන ආකල්පය උඩය. සෝවියට් වැසියන් මුදල් ගැන එතරම් සැලකිල්ලක් නොදැක්වූයේත්, අතමිට දිගහැර වියදම් කළේත් සියලු දෙනාටම රැකියා තිබූ හෙයිනි. 1930 මාර්තු මාසයේ සිට සෝවියට් දේශය තුළ විරැකියාව නොපැවතුණි.

අප විසින් සලකා බැලිය යුතු තවත් ප්‍රශ්නයක් ඇත. එනම් පවුලක වියහියදම් භාරව සිටියේ කවුද යන්නය. විසිවන සියවස ආරම්භයේදී ආර්ථික විශේෂඥයන් රුසියන් අධිරාජ්‍යයේ පළාත් හයක වාසය කළ පවුල්වල අයවැය ගැන විග්‍රහයක් කළහ. එකල පවුලේ මුදල් භාරව සිටියේ සැමියාය. එහෙත් ඔක්තෝබර් විප්ලවයෙන් පසු 1920 ගණන්වල මුල් කාලයේදී කාන්තාව නිදහස ලැබූ පසු පවුල්වලින් 15%ක පමණ මුදල් භාරව සිටියේ බිරිඳය. 1982 පමණ වන විට විවිධ මට්ටමේ ආදායම් ලබන පවුල් අතරින් 88% - 95% දක්වා ප්‍රමාණයක පමණ පවුලේ වියහියදම් භාරව ක්‍රියාකළේ බිරිඳයි. පවුලේ ආදායම වැඩිවූ තරමට මුදල් භාරව ක්‍රියාකිරීමේ වගකීම බිරිඳ මත පැටවිණි.



"අවස්ථාවාදයෙන් තීරණාත්මක ලෙස බිඳී ඉවත්වන්නේ නැතිව, එසේම එහි අනිවාරණීය වියවුල පොදු ජනතාවට පැහැදිලි කර දෙන්නේ නැතිව, සමාජවාදයේ වර්තමාන කාලයේ අරමුණු සපුරාලිය නොහැක. එමෙන්ම කම්කරුවන්ගේ නියම ජාත්‍යන්තර සමගියද ඇති කරගත නොහැක."

**ලෙනින්**
**තෝ.කෘ. 4වැනි වෙළුම, 13 වැනි පිටුව**

# 21 වැනි සියවස සහ පසුගාමී මානසිකත්වය

පිරිමි- අම්මට සිරි දීල තියෙන්නෙ

කාන්තාව - ගහන්න ඕන තම්බින්ට හොඳයි අනේ, ඕක තමයි වෙන්න ඕන, ඕක වෙන්න කල් ගියා වැඩියි.මොනවද අර පාර මැද්දෙ ගහල තියෙන්නෙ

පිරිමි- එනවා, එනවා. වටෙන් එනවා කොහෙන් හරි

කාන්තාව- පාර දිගේ ටොපි, මරු ඈ, මරු කියන්නේ කියල වැඩක් නැහැ

පිරිමි- ආන් අරහේ ගිනි තියලා මොනව හරි - ආන්, ජෙලීලගේ කඩේ ඉවරයි

කාන්තාව - ආ ජෙලීලගේ කඩේට දුන්නනම් හරියට හරි ඕක ගිනිම තියන්න ඕන

පිරිමි- මෙතනින් යන්න පුළුවන්ද නේද

කාන්තාව- යං, යං ඔහොම අපි හෙමිහිට යන් බලාගෙන

පිරිමි- අම්මට සිරි බන් සුපිරි ගේම

කාන්තාව- ආ ඇවිළෙනව, ඇවිළෙනව තව ඇවිළෙනව පල්ලියට මොකද උනේ බලපන්

කාන්තාව- මුන් ගේ අතේ පොලුද බන්

පිරිමි- ඔව්,ඔව් . යකඩ පොලු ඔක්කොම අරන් ඇවිල්ල තියෙන්නෙ, බෝවත්ත, බිංගිරියෙන් ඇවිල්ල තියෙන්නෙ ඔක්කොම

කාන්තාව- හොඳයි එහෙම තමයි වෙන්න ඕන, එහාට ගහන්න ඕන අපේ එවුන් ගිහිල්ල, මේව නිවන්න එන්න දෙන්නෙත් නැහැ කාටවත්

පිරිමි- පැට්‍රෝල් අදිනව බයික් එකේ

කාන්තාව- ඒ ගිනි දාන්න

ඉහතින් දැක්වෙනු ලැබෙන්නේ පසුගිය දා සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ සැරි සැරූ සංවාදයකි. ජාතිවාදී කල්ලි විසින් කඩා දමනු ලදුව ගිනිබත් වෙමින් ඇති කඩ පේළියක් අසලින් ගමන් කරන ලොරි රථයක සිටින එම ප්‍රදේශයේම ජීවත් වන කාන්තාවක සහ පිරිමින් කිහිප දෙනෙකු මේ සිදුවීම සම්බන්ධයෙන් සිදු කළ කතාබහ මේ වීඩියෝ පටයේ සටහන්ව තිබුණි. මේ සංවාදය කණ වැකුණු ඕනෑම කෙනෙකුට හැඟී යන කාරණයක් වන්නේ මෙහිදී ජාතිවාදී ගින්න නිවීමට නොව තවදුරටත් ඇවිළීමට කටයුතු කරන ආකාරයයි. මෙහිදී කාන්තාවන් පුරුෂයන් යනුවෙන් වෙනසක් නොමැති බවත් ඇතැම් විට කාන්තාවන් මෙවනි අවස්ථාවන්හිදී ඉදිරියෙන්ම සිටින බවත් පෙනී යයි.

අප්‍රේල් 21 ප්‍රහාරයට මාස 1 1/2 ක් පමණ ගෙවී ගොස් තිබේ. ගතවූ කාලය තුළ කසකාරයන්, නලා කාරයන් මෙන්ම ගිනි බෝල කරකවන්නන්ද උඩ එමින් යට යමින් අදාල සිදුවීම මත පිනුම් ගසමින් සැරිසරනු අපි දුටිමු. නමුත් මේ අනේකවිධ කරණම්කාරයින්ගේ සංදර්ශනවලින් කුල්මත් වෙමින් දෑස් නිලංකාර කර ගන්නා බොහෝ දෙනාට වැදගත්ම වූ ඇත්ත ප්‍රශ්නය අමතකව ඇති සැටියකි. නොඑසේ නම් සිතා මතා අමතක කර ඇති බවක් පෙනේ.



21 ප්‍රහාරයෙන් සති තුනකට පමණ පසු දේශපාලන නායකත්වයක් යටතේ වඩා සංවිධානාත්මකව ක්‍රියාත්මක කළ කුලියාපිටිය, මිනුවන්ගොඩ, හරහා නිකවැරටිය දක්වාම වූ සිදුවූ ජාතිවාදී සිදුවීම් මාලාව විවිධ පාර්ශවයන්ට විවිධ අයුරින් බලපෑවා වුවද මෙහි වැඩිම බලපෑම සිදුවූයේ දරුවන්ට සහ කාන්තාවන්ට බව අපගේ හැඟීමයි. එය අතිශය මානුෂිය බලපෑමකි. නමුත් රටේ ජනගහනයෙන් බහුතරයක් වූ කාන්තාවන් මෙම තත්වය තේරුම්ගත්තාද යන්න ගැටලුවකි.

මඩකලපුවේ ළමා ගීතිකා කණ්ඩායමේ පටන් සහරාන්ගේ දරුවන් දක්වාම මිය ගිය දරුවන් ඇගේ දරුවන් බව රටේ මව්වරුන්ට හෝ සිතන්නට නොහැකි වූයේ කාගේ වරදකින්ද? තරු පහේ හෝටලය තුළ මියගිය දෙස් විදෙස් කාන්තාවන් ගැන දුක්වෙන අපේ පිරිසිදු කාන්තා චරිත දෙහිවල ලැගුම්හලේ මියගිය තරුණිය අනාචාරයේ හැසිරුන නිසා මැරුණත් කම් නැතයි සිතන්නට තරම් දරදඬු වීම කෙතරම් ඛේදජනකද?

කතෝලික පල්ලිවලට එල්ලවූ ප්‍රහාරයෙන් මියගිය අය ගැන කණගාටු වෙමින් සයින්දමරුදු ප්‍රහාරය සාධාරණීයකරණය කරන්න සුවපහසුවක් ලැබූ හෙළ බොදු ජනයා අතර කාන්තාවන්ද පෙරමුණ ගත් අතර, වයඹ පළාතේ සිදුවූ ප්‍රචණ්ඩ ක්‍රියාවලට නොමසුරු දායකත්වයද සැපයූ බව අපට නොරහසකි.

වරද කොතැනද? අපි උප්පැන්න සහතිකයේ පටන්ම බෙදා වෙන්කෙරුනු ජාතියක් ලෙස අනෙකාට ගරු කරන්නට නොදත් අනෙක් සංස්කෘතීන් පිළිගන්නට තරම් නිහතමානීකමක් නැති, වසර 2500ක ඉතිහාසයකට අයිසින් තවරමින් තලුමරන අමුතුම ජාතියකි. ඒ අනුව කාන්තාව පසුගාමී ආසියාතික සමාජ ලක්ෂණ පෙන්නුම් කරන කැඩපතක් බව නැවත නැවතත් ඔප්පු කරමින් සිටියි.

බොහෝ කටයුතුවලදී පිරිමින් හා කරට කර හිඳිමින් කටයුතු කළා වූ කාන්තාවන් තම අසල්වැසියා ගිනිබත් කරන්නට යන ගමනේදීද පිරිමින්ට පන්දම් දල්වා දෙන භූමිකාවෙන් පිට කිසිවක්ම කරන්නට සමත්වූයේ නැත. පොදු සමාජශීලී කටයුතු සඳහා සම්බන්ධ වීමට ඉඩ නොදී පිරිමියාව ගෙතුලට ඇද ගන්නා කාන්තාවෝ මෙවනි ජාතිවාදී ගැටුම්වලදී පිරිමියාව ඒ සඳහා තල්ලු කරති. මෙය සිංහල,දෙමළ මෙන්ම මුස්ලිම් සමාජයේද පවතින අතිශය ඛේදනීය තත්වයකි.

71 වසරක තට්ටුමාරු දේශපාලනයේ සදාතනික උරුමය මෙය නොවේද? ලෝකයේ ප්‍රථම අගමැතිනිය වැනි නම්බු නාම ලැබුණද, විධායක ජනාධිපති බවට කාන්තාවක් පත් වුවද, සිංහල දෙමළ සහ මුස්ලිම් කාන්තාවන් පාර්ලිමේන්තුව, පළාත් සභා සහ ප්‍රාදේශීය සභා ආදිය නියෝජනය කළද මේ සාම්ප්‍රදායික භූමිකාවේ බැමි ලිහිල් කරගන්නට සමත්වූයේ නැත.

ෆේස්බුක් හරහා කිඹුල් කඳුළු හෙළන්නටත්, ජාතිවාදී ගොඩ වැඩිකරගන්නටත් සියලු ආකාරයේ උත්සාහයන් දරමින් සමාජය සියවස් ගණනාවක් ආපස්සට ඇද දමන කාර්යය ඉතා හොඳින් ඉටුකරන්නට නායකත්වය දෙන්නට නම් වර්තමානයේ ඇය සමත්ව සිටින්නීය.

21 වන සියවසේ මෝස්තරවලින් සැරසී ඇතුලතින් ගෝත්‍රික යුගයේ ජීවත්වන අපේ කාන්තාවන්ට නිසි මඟ පෙන්වීමක් අවශ්‍ය වන්නේ ඇයි? ලාංකේය දේශපාලනයේ (මැතිවරණයක් අවස්ථාවේදී) තීරණාත්මක සාධකයක් වන්නී කාන්තාවයි. ඇය පසුගාමී වන තරමට රටේ පාලකයන්ට වාසි සහගතය. මැද පෙරදිග ගෘහ සේවයේ සිටිමින්ම මුස්ලිම් කඩ වර්ජනය කරන්නට යැයි ෆේස්බුක් හරහා අපට බල කරන්නේද ඒ පසුගාමී බව නිසාමය. ඔවුන් මෙම මානසිකත්වයෙන් මුදා ගැනීම එතරම් පහසු නැති නමුත් අද දවසේ අපේ කාර්යභාරය විය යුත්තේ ඒ අසීරු කර්තවයට උරදෙමින් සමාජයේ කාන්තාවන්ට නිවැරදි මඟ පෙන්වීමක් ලබාදීමයි. පළමු පැයේදී එය අසීරු කටයුත්තක් වුවද "හිරු පායන විට වේලාසනින් අවදිවී සිටිම ප්‍රයෝජනවත් වනු ඇත".

## පාට ගොඩක් එකම රටක්



සත් පාටක්
තැවරුණු දේදුන්න
එතරම් සොඳුරු වෙද ?
තිබුණි නම් එහි එකම
පැහැයක් ....

සැරසෙන්න යැයි ළඳකට
කියාවිද කිසි දින
සැන්දෑ අහස මෙන්
නොමැවුණි නම් එහි
නෙක වන් රටා ....

මෙතරම් ම ලොව වෙද
අනේක මල්වලට,
නොතිබි නම් එහි
නෙක නෙක පැහැයන්
මන්මත් කරන හදවත් ....

එතරම්ම සොඳුරුයි
තිබෙන විට,
එක එක ජාති, ආගම්
හඬවනු පිණිස නොව
හැඩ වෙන්නට රටට ...

## සිව්දෙසින්



### කතරේ පිපි කුසුම්...

2019 මැයි 15 වන දිනට ලොව්ජේන් අල් හත්ලොවුල් සිරගත කොට වසරකි. ඇය කවුද? ඇය සෞදි අරාබියේ කාන්තා අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටි හා ක්‍රියාත්මක වූ ක්‍රියාකාරිනියකි. විසි නව හැවිරිදි ඇය ප්‍රකට වූයේ කාන්තාවන්ට රිය පැදවීමට ඉඩසලසා ගැනීම උදෙසා වූ ව්‍යාපාරයට නායකත්වය දීමෙනි. එසේම ඇය පුරුෂයින්ට කාන්තාවන්ගේ භාරකාරිත්වය පැවරීමට විරෝධතාවය පළකළාය. 2014 වර්ෂයේ දී ඇයව ප්‍රථම වරට අත්අඩංගුවට ගන්නේ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සිට සෞදි අරාබිය වෙත මෝටර් රථයක් පදවාගෙන යාමට උත්සාහ කර කාන්තාවන්ට රිය පැදවීමට තහනම් කර පනවා ඇති නීතිය උල්ලංඝනය කිරීම හේතුවෙනි. එවර ඇය දින 73ක් සිරගත කොට තැබිණි. 2016 වරෂයේදී ඇය සෞදි අරාබියේ රජු වෙත පුරුෂ භාරකාරිත්වය අහෝසි කරන ලෙස ඉල්ලා තවත් 14,000ක් සමග පෙත්සමක් අත්සන් කළාය. දෙවන වරට ඇයව අත්අඩංගුවට ගනු ලබන්නේ 2017 වසරේ ජුනි මාසයේදී වන අතර තෙවන වරට ඇයව සිරගත කරන්නේ 2018 මැයි මස 15වැනි දිනදීය. ඒ සමග තවත් කාන්තාවන් සහ පිරිමින් පිරිසක් අත්අඩංගුවට ගන්නා ලැබූහ. ඒ අතර එමාන් අල් නෆ්ජාන් නම් බ්ලොග් ලේඛිකාවද, අයිෂා අල් මානා, අසීසා අල යූසොෆ් හා මෙදේහා අල් අජ්රොව්ෂ්ද වෙති. මොවුහුද සෞදි අරාබියේ කාන්තාවන්ට අයිතිවාසිකම් ඉල්ලා හඬ නැගූවෝ වූහ. මෙලෙස අත්අඩංගුවට ගත් පිරිසෙන් කිහිපදෙනෙක්




නිදහස් කර තිබුණද ලොව්ජේන් අල් හත්ලොවුල් එතැන් පටන් මේ දක්වා සිරගත කරනු ලැබ ඇත. ඇයගේ සහෝදරිය ප්‍රකාශ කරන්නේ රාජ්‍ය අනුදැනුමද සහිතව තම සොයුරිය 2018 වර්ෂයේ මැයි සිට අගෝස්තු දක්වා කාල සීමාව තුළ ලිංගික අතවරයන්ට, මරණ තර්ජනවලට, විද්‍යුත් කම්පනවලට, පහර දීම් හා තවත් වද හිංසාවලට ලක්ව තිබේ. ඇයගේ දෙමව්පියන් පවසන්නේ ඇය බැලීමට ගිය විට පහරදීම්වලින් ඇතිවූ තැලුම්ද ඇයගේ ශරීරය පාලනය කර ගත නොහැකි ආකාරයට ගැහෙමින්ද තිබූ බවය. 2018 මැයි සිට රඳවා තබාගත් ඇයව උසාවියට ඉදිරිපත් කර ඇත්තේ 2019 මාර්තු මාසයේදීය. එසේම ඇයව දික්කසාද කරන ලෙස ඇගේ සැමියාටද රෙජීමය විසින් බලපෑම් කරන බවට වාර්තා වේ.

කෙසේ නමුදු ලොව්ජේන් ඇතුළු පිරිස සිරගත කිරීම තුළ ඔවුන් නිදහස් කරන ලෙස බලපෑම් කරන ව්‍යාපාර ලොව අනෙකුත් රටවල ක්‍රියාත්මක විය. එසේම මෙයින් පසක් වන තවත් කරුණක් නම් අරාබිකරයේ කාන්තාවන් අතර අධ්‍යාපනය ලැබූ උගත් බුද්ධිමත් කාන්තාවන් තර්ජන නොතකා සිය අයිතිවාසිකම් දිනාගැනීමට හා සමාජයේ ප්‍රගිතිශීලී ප්‍රතිසංස්කරණ උදෙසා ඉදිරියට පැමිණෙන බව සහ ඔවුන් වටා අනෙක් කාන්තාවන් එකරාශී කර ගැනීමට ශක්තිය පවතින බවය. ලොව ප්‍රගතිශීලී ජනතාවගේ සහය හා ආශිර්වාදයද ඔවුන්ට ලැබෙනු ඇත. ලොව්ජේන් ඇතුළු පිරිස සිරගත කොට මසකින් එනම් 2018 ජුනි මාසයේ දී සෞදි කාන්තාවන්ට රිය පැදවීමේ අයිතිය ලබා ගත හැකිවිය. කෙතරම් අසීරු වුවද අයිතීන් දිනා ගැනීමට අරගලය අවැසිම වන බව ඔවුහු නැවතත් ලොවට පසක් කළහ.

### පුළුල් දේශපාලන අධ්‍යාපනයක් ලබා දෙනු!..

නවතම සමීක්ෂණයක්ට අනුව ස්කොට්ලන්තයේ බොහෝ ශිෂ්‍යාවන් හා තරුණ කාන්තාවන්ගේ මතය වන්නේ ඔවුන්ට පුළුල් දේශපාලන අධ්‍යාපනයක් හෝ සමාජ ප්‍රශ්න පිළිබඳ සාකච්ඡා කිරීමට අවස්ථාවක් නොලැබෙන බවය. මෙම අධ්‍යයනය සිදු කර ඇත්තේ ස්කොට්ලන්තයේ තරුණ කාන්තාවන්ගේ ව්‍යාපාරය විසිනි. මෙයට ස්කොට්ලන්තයේ තරුණ කාන්තාවන් 500ක් සහභාගි කරගන්නා ලදී.

මෙය 'ස්කොට්ලන්ත තරුණ කාන්තාවන්ගේ තත්වය' යන වාර්තාවේ තුන්වන කලාපය මගින් විස්තරාත්මකව වාර්තා කර තිබේ. එයට අනුව වත්මන් දේශපාලන ක්‍රමයම තරුණ කාන්තාවන්ගේ දායකත්වය ලබාගත් හැකි ආකාරයෙන් හෝ දිරිමත් කරවන සුළු ආකාරයෙන් සකස් වී නොමැති බවද පාසල් අවදියේ සිටම පුළුල් දේශපාලන හා සාමාජයීය අවබෝධයක් හා සාකච්ඡා කිරීමේ අවස්ථාව ලබා දීමේ වැදගත්කම මෙහිදී පෙන්වා දී තිබේ. එසේම ස්කොට්ලන්ත තරුණ කාන්තාවන්ට දේශපාලනයට පිවිසීමට ඇති අවහිරතා ඉවත්කිරීමට කටයුතු කළ යුතු බවද එම වාර්තාවේ දැක්වේ.




ඉතිහාසයේ කතාව... 10

# නූතන පවුල හා පෞද්ගලික දේපළ



නූතන පවුල, පළමු පංති සමාජයේ සිට මේ දක්වා සමාජ ක්‍රම කිහිපයක් පසුකරමින් වසර දහස් ගණනක් තිස්සේ ක්‍රමිකව පරිණාමය වෙමින් ආ එකකි. කාලයත් සමග, ඒ ඒ සමාජ ක්‍රමවල පැවති දේපළ සබඳතා අනුව හා ඊටම අදාළ සිරිත් විරිත්වලට අනුව පවුලේ කුමන වෙනස්කම් සිදුවුවත් එහි පදනමේ ප්‍රධාන සාධකයන් කිහිපයක් නොවෙනස්ව පවතී. ඉන් ප්‍රධාන සාධක වන්නේ, එක් අතකින් මෙම නූතන පවුල පෞද්ගලික දේපළ මත පදනම්ව තිබීමත් නූතන පවුල තුළ පුරුෂ ආධිපත්‍යය හා ස්ත්‍රිය දෙවැනි පංතියේ පුරවැසියෙක් බවට පත්කර තිබීමත්ය. ඒ නිසාම වර්තමාන පවුල තුළ 'ආදරය', 'සමගිය', 'ආධ්‍යාත්මික බැඳීම' වැනි සංකල්ප හා මනෝභාවයන් කොතෙක් තිබුණද ඊට යටින් ප්‍රබල ප්‍රතිවිරෝධයක්ද තිබේ. ආදරය වැනි මනෝභාවයන් බිඳ වට්ටමින් නිතර පවුල තුළ මතුවන එම ප්‍රතිවිරෝධයේ පදනමද සකසන්නේ පෞද්ගලික දේපළ හා පුරුෂ ආධිපත්‍යයේ බලපෑමය.



"පොරොන්දු වීමත් පොරොන්දු ඉෂ්ට කිරීමත් අතර පරීක්ෂා නොකරන ලද මනුෂ්‍ය ස්වභාවයේ අම්බලම් බොහෝ තිබේ."

**බ්‍රෑනෝ ආපිට්ස්**

### පවුලේ අර්බුදය කොතැනද

මීට පෙර ලිපියකින් අපි සාකච්ඡා කළ පරිදි ප්‍රාථමික පවුලේ විකාශනය තුළ එය අවිචාරවත් ලිංගික සබඳතාවල සිට ලිංගිකත්වය ක්‍රමයෙන් පටුවෙමින් දෙදෙනෙක් එක්ව වාසය කරන 'යුගලන පවුල' දක්වා පරිණාමය වෙමින් තිබිණි. එම වෙනස්කම් සඳහා බලපෑවේ දේපළමය සාධක නොව සමාජ විද්‍යාත්මක සාධකය. එම නිසා එකී වෙනස්වීම් ස්වභාවික විය. එහෙත් සමාජය තුළ දේපළ අවශ්‍යතා මත පෞද්ගලික දේපළ පදනම් කරගත් සමාජයක් බිහිවීමත් සමග එම සමාජයේ දේපළ සබඳතාවයන්ගේ වුවමනාව විසින් වත්මන් පවුල නිර්මාණය කරන ලදී. එවිට එය ස්වභාවික ජීවවිද්‍යාත්මක හෝ සමාජවිද්‍යාත්මක හේතු මත නොව එම සාධක යටපත් කළ දේපළ සාධකයන් මත බිහි වූවක් නිසා, ඒ තුළ ප්‍රතිවිරෝධයන් රැසක්ද ඇති විය. නූතන පවුලේදී මැතක් වනතුරුම පවුල සඳහා දෙදෙනෙක් එකතු කිරීමේ ප්‍රධාන සාධකය වූයේ 'ආදරය' නොව දේපළ, වත්කම, තත්වය, ජාතිය, කුලය, වැනි සාධකයන්ය. අද පවා මෙම සාධක පවුලේ පැවැත්මට විශාල බලපෑමක් සිදුකරමින් සිටී. එබැවින් පවුල පෞද්ගලික දේපළ මත පදනම්ව පවතිනතාක් හා ඒ තුළ ස්ත්‍රියට එරෙහිව පුරුෂයාගේ ආධිපත්‍යය පවත්නාතාක් කල් සහ කාන්තාව ගේදොර පෞද්ගලික කටයුතුවලින් මුදා සමාජමය කාර්යයන්ට දායකවනතාක් හා ඒ සඳහා ගෘහස්ථ පෞද්ගලික කටයුතු සමාජමය කර්මාන්තයක් බවට පත්වෙන තෙක් මෙම ප්‍රතිවිරෝධය පවතිනු ඇත.

### පවුල හා ආදරය

වර්තමාන සමාජයේ ස්ත්‍රී-පුරුෂ දෙපාර්ශ්වය අතර 'ආදරය' නම් මනෝභාවයක් තිබේ. එය නිශ්චිතව හඳුනාගන්නේ නම් පෞද්ගලික ලිංගික ආලය නමැති මානසික හැඟීම ඇතිවී තිබේ. සමාජය තුළ මෙම පෞද්ගලික ලිංගික කැමැත්ත නිර්මාණය වීම ආරම්භ වූයේ ප්‍රාථමික සාමූහික සමාජයේ අවසාන කාලයේ යුගලන පවුල බිහිවන අවධියේය. ඉන්පසු පංති සමාජය තුළ බිහිකළ වත්මන් පවුල තුළද 'ආදරය' ඇතිවිය. ආදරය නමැති බැඳීම ඇතිවී පසුව එය විවාහය මඟින් පවුල දක්වා ගමන් කළ අවස්ථාවලට වඩා ඉතිහාසය පුරාම දැකිය හැක්කේ දේපළ සාධක මත පවුල බිහිකොට පසුව එකිනෙකාට ආදරයෙන් සිටීමට සිදුවූ අවස්ථාය. කෙසේ වුවත් සමාජය තුළ පවුලේ පරිණාමයේදී ලිංගික

පවුල පෞද්ගලික දේපළ මත පදනම්ව පවතිනතාක් හා ඒ තුළ ස්ත්‍රියට එරෙහිව පුරුෂයාගේ ආධිපත්‍යය පවත්නාතාක් කල් සහ කාන්තාව ගේදොර පෞද්ගලික කටයුතුවලින් මුදා සමාජමය කාර්යයන්ට දායකවනතාක් හා ඒ සඳහා ගෘහස්ථ පෞද්ගලික කටයුතු සමාජමය කර්මාන්තයක් බවට පත්වෙන තෙක් මෙම ප්‍රතිවිරෝධය පවතිනු ඇත.

ආලය හෙවත් ආදරය නම් මනෝභාවය ඇතිවීම සාධනීය ලක්ෂණයකි.

අතීත පංති සමාජ ක්‍රමවලදී මෙන්ම බොහෝ විට වර්මානයේදීද ප්‍රභූ පංතියේ හා දේපළ හිමි පංතිවලදී විවාහයන් සිදුකරනු ලැබුයේ දෙමාපියන්ගේ මැදිහත්වීම මතය. එහිදී සැලකූ ප්‍රධානතම සාධක වූයේ දේපළ තත්වය හා කුලයයි. මෙයට වඩා වෙනස් තත්වයන් බොහෝ විට පැවතුණේ නිර්ධන පංති හෝ පීඩිත පවුල්වලය. යුරෝපයේ මධ්‍යතන යුගයේදී පල්ලියේ බලපෑම මත එක්තරා කාලයක් ප්‍රේම සබඳතා මත විවාහවීම වැරැද්දක් ලෙසද සලකා තිබුණි. එහෙත් විවාහ වන දෙදෙනාට පල්ලිය බලකර තිබුණේ එකිනෙකා සමග ප්‍රේමයෙන් සිටින ලෙසය. මේ තත්වය පැහැදිලි කරන එංගල්ස් එහිදී මෙවැනි තර්කයන් මතුකළේය. එනම් 'විවාහ වූ අයගේ පරම යුතුකම එකිනෙකාට ආදරය කිරීම නම්, ආදරවන්තයන්ගේ පරම යුතුකම එකිනෙකා සමග විවාහවීම නොවේද? ' යනුවෙනි.


### පවුල හා සදාචාරය

නූතන පවුලේ සදාචාරය ලෙස සමාජයේ සම්මතයට ලක්ව ඇත්තේ කුමක්ද? ඒ පවුලේ දෙදෙනා එකිනෙකාට ආදරය කිරීමත් එකිනෙකා සමග පමණක් ජීවත්වීමත්ය. එහෙත් පළමු පංති සමාජය වූ වහල් ක්‍රමයේ සිටම විවාහයට පිටින් පවතින ලිංගික සබඳතා විශාල එකක් විය. අනියම් සබඳතා, ගණිකා වෘත්තිය නූතන පවුල සමග අත්වැල් බැඳගත් ගැටලු බවට පත්ව තිබේ. එයට හේතුව පවුල තුළ බොහෝ විට සැබෑ ආදරය නොපැවතීමත් පවුල තුළ වන ප්‍රතිවිරෝධය විවාහ ස්ත්‍රිය හා පිරිමියා යන දෙදෙනාම අතෘප්තියට පත්ව වෙනත් සබඳතා සඳහා යොමුවීමේ ඉඩ පැවතීමත්ය.

අනෙක් අතට දේපළ අවශ්‍යතා මත එනම් තම දේපළ තම දරුවන්ට පමණක් උරුමකර දීමේ වුවමනාව මත පවුල බිහිවුවද රජවරු, ප්‍රභූවරු, දේපළ හිමියන් හා සමාජයේ බලයන් අත්පත් කරගත් අය එක් ගැහැනියක් හා එක් පිරිමියෙක් අතර සම්බන්ධය යන සීමාව රැකෙන්නේ නැත. ඒ වෙනුවට ඔවුහු අතීතයේ පැවති පුළුල් කවයක් හා ලිංගික සබඳතා පැවැත්වීමේ ස්වභාවය වෙනත් ආකාරයකින් පවත්වා ගත්තෝය. රජවරුන් සතුව අන්තඃපුරයක් නිර්මාණය කර ගැනීමත් සමහර රටවල ප්‍රභූවරුන් බිරින්දෑවරු කීපදෙනෙක් ගෙන ඒමේ නෛතික හා සදාචාරමය අයිතිය ලබා ගැනීමත් ගණිකා වෘත්තිය නීතිගතව පවත්වාගෙන යාමත් ඊට නිදසුන්ය. පුරාණ වැඩවසම් චීනය තුළ ප්‍රභූවරුන්ට බිරියන් පහක් හෝ හයක් තබාගත හැකි වූ අතර බොහෝ විට ඔවුන් එම බිරියන් ලබා ගත්තේ දෙමාපියන්ට මුදල් ගෙවීමෙන් හෝ තමන්ට ලැබීමට ඇති ණයවලට හිලව් වශයෙනි. වර්තමානයේ පවා මුස්ලිම් සමාජය තුළ තමන් සතු දේපළ ප්‍රමාණය අනුව බිරින්දෑවරු කීපදෙනෙක් තබා ගැනීමේ අයිතිය පවතී. ඉන් පැහැදිලි වන්නේ පෞද්ගලික දේපළ අවශ්‍යතා මත ගොඩනැගනු ලැබූ පවුල ඔවුනටම පවත්වාගෙන ඒමට නොහැකිවීමකි.

පවුලේ විකාශනය ඉතිහාසය තුළ අධ්‍යයනය කළ යුත්තේ, 'නූතන පවුල ඓතිහාසිකව මෙලෙසම පැවතුණේය', යනුවෙන් වන ඉගැන්වීමේ ඇති අසත්‍යය තේරුම් ගැනීම සඳහාය. පවුල යනු ඉතිහාසය තුළ දෙවියන්ගේ නිර්මාණයක් නොවේ. එසේම පවුල සහ සමාජය බිහිවූ දා සිටම මෙලෙස පවතින්නක්ද නොවේ. පවුල යනු සමාජ පරිණාමයේදී ලිංගික අවශ්‍යතා සඳහා වර්ගයා බෝකිරීමේ ජීවවිද්‍යාත්මක අවශ්‍යතා සඳහා ගැහැනුන් හා පිරිමින් අතර ඇතිවූ සම්බන්ධතාවයන්ගේ පරිණාමයේ ඵලයකි. මෙහි විශේෂය වනුයේ නූතන පවුල පංති සමාජය සමග පෞද්ගලික දේපළමය වුවමනාවක් මත බිහිවූවක් වීමත් ඒ නිසාම එය තුළ ප්‍රතිවිරෝධයන් හා ගැටලු රැසක් පැවතීමත්ය. සමහරවිට පවුල 'හිරගෙයක්' බවට පත්වීම සමාජය තුළ බොහෝවිට දැකිය හැකිය. ඒ නිසාම සමාජ පරිණාමයේදී පංති හා පෞද්ගලික දේපළ වෙනස් කරනු ලබන සමාජවාදී සමාජයකදී පවුලේ වත්මන් ධනපති දේපළ ස්වභාවයද වෙනස් වී පවුලේ සැබෑ අර්ථය හා බැඳීම පමණක් ඉතිරි වන තත්වයක් නිර්මාණය වනු ඇත. ඒ තාක් පවුලේ මේ අර්බුදයන් සහිතව පවතිනු ඇත. අවසාන වශයෙන් කිවයුත්තේ නූතන පවුල සමහරුන් හඳුන්වන පරිදි සදාචාරයේ ප්‍රතිමූර්තිය නොවන බවත් එය 'ශුද්ධවූ පවුලක්' නොවන බවත්ය.

# විල්පත්තුව
# පරිසර හිතකාමීත්වය සහ
# ජාතිවාදය



කාර්මීකරණය මෙන්ම අනෙකුත් ක්‍රියාකාරම් නිසාවෙන් මිනිසා විසින් පරිසරයට සිදු කරනු ලබන බලපෑම දිනෙන් දින ඉහළ යයි. ඇතැම් ශක්‍යවාදීන්ට අනුව එය සාධාරණ වුවත් එසේ සිතීම වත්මන් මිනිසාට පමණක් නොව ඔහුගේ අනාගත පරපුරටද සිදු කරන බලවත් අසාධාරණයක් බව මේ වන විටත් ලෝක ප්‍රජාව පිළිගෙන හමාරය. තිරසාර සංවර්ධනය පිළිබඳ සංකල්පය බිහිවන්නේ ඒ අනුවය.

කෙසේ වෙතත් ශ්‍රී ලංකාව ජෛව විවිධත්වයෙන් පොහොසත් පාරසරික උරුමයක් සහිත රටක් බව අවිවාදිත කරුණකි. මෙම පරිසරයද ආරක්ෂා කරමින් සංවර්ධනය කරා පියමං කිරීම මෙරට පාලකයන්ගේ සේම මහජනතාවගේද වගකීමකි. එහෙත් එම වගකීම පිළිබඳ තිබෙන අවධානය ප්‍රමාණවත්ද යන ප්‍රශ්නය අප සිතට නැගෙන්නේ දිනපතාම පරිසරයට සිදු කෙරෙන හානි සම්බන්ධයෙන් අසන්නට දකින්නට ලැබෙන නිසාය.

මේ සිදු වන සෑම පරිසර විනාශයක් ගැනම අවධානය යොමු විය යුතු වුවද ඒ සියල්ල අභිබවමින් පාස්කු ඉරිදා සිදු වූ ප්‍රහාරයට පෙර සමාජ මාධ්‍ය තුළත්, මාධ්‍ය සාකච්ඡාවලත් ප්‍රධාන මාතෘකාවක් බවට 'විල්පත්තු වන විනාශය' පත් වී තිබුණි. චන්ද්‍රිකා ඡායාරූප, මිනින්දෝරු සිතියම් පවා ඊට සාක්ෂි වශයෙන් ඉදිරිපත් විය. ඒ නිසා මේ කතාව ආරම්භ කළ යුත්තේද එතැනිනි.

විල්පත්තු ජාතික වනෝද්‍යානය පිහිටා ඇත්තේ පුත්තලම සහ අනුරාධපුරය දිස්ත්‍රික්ක දෙකේය. විල්පත්තු ජාතික වනෝද්‍යාන සීමාව මෝදරගං ආරුවෙන් අවසන් වේ. කැලේ කපා ජනතාව පදිංචි කළ බව කියන ප්‍රධානම ගම්මානය වන මරිච්චිකට්ටි ගම්මානය පටන් ගන්නේද එතැනින්ය. ඊට අමතරව විලත්තිකුලම්, වේප්පන්කුලම්, කරඩික්කුලි යන ප්‍රදේශවල පිහිටි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් වනාන්තර විනාශ කරමින් නැවත පදිංචි කිරීම් සිදු කරන බව ඇතැම් පිරිස් මාධ්‍ය මගින් රටට කියති. මෙහි ඇත්ත නැත්ත කුමක්ද?

2001 වසරේ දී ගැසට් පත්‍රයක් මගින් රජයේ කැලෑ සියල්ල වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට පැවරිණි. ඉහතින් කී ගම්මාන පිහිටා ඇත්තේ එසේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතට පැවරුණු රජයේ කැලෑ තුළය. මෙම ප්‍රදේශ අතරින් මරිච්චිකට්ටි, කරඩික්කුලි ප්‍රදේශවල පැරණි ගම්මාන පැවති බවට සාධක ඇත. 1980 ජූලි 21 දින ජාතික ගොඩනැගිලි දෙපාර්තමේන්තුව මගින් ඉදිකරන ලද නිවාස 10ක නටබුන් සහ එම නිවාස යෝජනා ක්‍රමය ආරම්භ කිරීමේ ඵලකය ඊට එක් උදාහරණයකි. මරිච්චිකට්ටි ගම්මානයේ ඇති කැලෑවට යට වූ පැරණි ඉස්ලාම් පල්ලියද එසේමය. වේප්පන්කුලම් ගම්මානයෙන් එවැනි සාධක කිසිවක් හමුවන්නේ නැත. සමස්තයක් ලෙස 1990 සහ 91 කාලයේ ජනශූන්‍ය වූ ප්‍රදේශයක්, එයින් වසර 11කට පසු කැලේට යටවීමෙන් පසු රජයේ කැලෑ බවට පත් වී තිබේ. ඒ අනුව ඒවා 2001 වසරෙන් පසු වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතට පැවරිණි. එහෙත්, ඒ වන විට පැවැති යුදමය තත්වය නිසා තමන්ගේ දෙපාර්තමේන්තුව යටතට පැවරුණද, කිසිදු අවස්ථාවක මේ කැලෑ නිරීක්ෂණය කිරීමක් හෝ ඒවායේ සීමා ලකුණු කිරීමක් සිදු කරන්නට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට හැකියාවක් ලැබී නැත. එයිනුත් වසර 11කට පසු එනම්, මේ ප්‍රදේශය ජනශූන්‍ය වීමෙන් වසර 22කට පසු මෙම කැලෑ සහිත ප්‍රදේශය 2001 රජයේ කැලෑ පැවරීමේ තීරණය ප්‍රකාරව රක්ෂිත තුනක් ලෙස 2012 වසරේ දී ප්‍රකාශයට පත් කර තිබේ.

එසේ ප්‍රකාශයට පත් කරන අවස්ථාවේදීම විලත්තිකුලම් ප්‍රදේශයේ අක්කර 650ක් සහ මරිච්චිකට්ටි, කරඩික්කුලි ප්‍රදේශවල අක්කර 770ක් අවතැන් වූවන් නැවත පදිංචි කිරීම සඳහා වෙන් කර ඇත. ඒ අනුව අදාළ ඉඩම් අක්කර 650 සහ 770 යන කොටස් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ප්‍රාදේශීය ලේකම් භාරයට පත් කර තිබේ. එනම්, එම කොටස් රක්ෂිතවලට අදාළ නැත.

එහෙත් මේ කටයුතු සිදු වී ඇත්තේ ඉතාමත් අවිධිමත් ආකාරයෙනි. මේ සම්බන්ධයෙන් නිකුත් කරන ලද විගණන වාර්තාවට අනුව මෙම ඉඩම් නිදහස් කිරීමේ දී විධිමත් පරිසර ඇගයීම් වාර්තාවක් පවා සකස් කර නැත. මේ ඉඩම් නිදහස් කිරීමෙන් සිදු එමගින් මාවිල්ලු සංරක්ෂිත වනාන්තරයට වන බලපෑම තක්සේරු කළ යුතු බව අදාළ වාර්තාවේ සඳහන් වුවද මෙතෙක් එවැන්නක් කර නැත. අනෙක් අතට මේ ඉඩම් වෙන් කිරීම් සිදු කර ඇත්තේද අවතැන් ජනතාව කොපමණ සිටීද, ප්‍රධාන පවුල් සහ අනු පවුල් කොපමණ සිටීද යන කරුණු පිළිබඳ විධිමත් සමීක්ෂණයකින් තොරවය. එම නිසා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පැවැති කැලෑ ඉඩම් රැසක් අනවශ්‍ය ලෙස රක්ෂිත ගැසට් කිරීමේදී නිදහස් කර ඇත. මෙසේ නිදහස් කරන ලද ඇතැම් ඉඩම් ප්‍රදේශයේ දේශපාලකයන්ගේ සමීපතමයන් අතරේ බෙදාගෙනද තිබේ.

කෙසේ වෙතත් තවදුරටත් නිදහස් කරන ලද අදාළ ඉඩම් කැලෑවට යට වෙමින් තිබී ඇත්තේ අවතැන්වූවන් නොපැමිණීම නිසාය. වේප්පන්කුලම් ඇතුළු ප්‍රදේශ රැසක ජනතාව සතුව මීට අදාළව 2014 වසරේ ඔක්තෝබර් 13 වැනිදා ලබා දුන් ඉඩම් ඔප්පු තිබේ. උතුරු පළාත් ඉඩම් පාලන දෙපාර්තමේන්තුව, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව සහ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය මීට මැදිහත් වී ඇත. ඒවා හඳුන්වා ඇත්තේ ඉඩම් හිමිකම තහවුරු කිරීමේ බලපත්‍ර හෙවත් දීමනා පත්‍ර ලෙසය. එක් දිනක් ඇතුළත පමණක් මෙසේ ලබා දී ඇති බලපත්‍ර සංඛ්‍යාව විසිදහසකි. එනම්, පවුල් විසිදහසකට මේ ප්‍රදේශයේ යළිත් පදිංචි වීම සඳහා රජය විසින් ඉඩම් අයිතිය තහවුරු කර දී ඇත.

කෙසේ වෙතත් මේ අවිධිමත් කටයුතු, මතභේද සහ විවේචන මැද්දේ කල්ගත විය. ඉන්පසු 2017 මාර්තු 24 වැනිදා ඉහත සඳහන් රක්ෂිත තුන එක්කොට, මාවිල්ලු සංරක්ෂිතය ප්‍රකාශයට පත්කරන ලදී. ඊට හෙක්ටයාර් 32,505ක් අයත්ය. ඒ අනුව සංරක්ෂිතය තුළට අවසරයකින් තොරව ඇතුළු වීම පවා අත්අඩංගුවට ගත හැකි වරදකි. මේ සංරක්ෂිතයට, පෙර අවතැන් වූවන් සඳහා නිදහස් කරන ලද ඉඩම් අක්කර 650 සහ 770 අදාළ නොවේ. මේ වන විට යළිත් අදාළ ඉඩම් බලපත්‍ර ලැබුණු ජනතාවගෙන් කොටසක් තම නිවාස ඉදිකිරීම ආරම්භ කර තිබේ. ඒ සඳහා ආධාර ලැබෙන බවත්, රජයෙන් ණය ලැබෙන බවත් එම ජනතාව පවසති. එහෙත් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් සංරක්ෂිත සීමාවේ කිසිදු විනාශයක් සිදු කර නැත. කිසිවකු එම සීමාවේ නැවත පදිංචි වී නැත. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවද එම කරුණු තහවුරු කරයි. ගුවන් හමුදාව මගින් සතිපතා මේ කලාපයේ සිදු කරන ගුවන් නිරීක්ෂණ වාර්තාවල ද අලුතින් කැලෑ එළිකිරීමක් ගැන සඳහන් වන්නේ නැත. විල්පත්තුව පාලනය කරන වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මුල්ලිකුලම් කාර්යාලය මෙන්ම නොච්චියාගම පිහිටි වනෝද්‍යාන භාරකාර කාර්යාලයද එය තහවුරු කරයි.

එසේ තිබියෙදී රිෂාඩ් බදියුදීන් ඇමතිවරයා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් කොටසකින් හෙක්ටයාර් 75ක් ඉල්ලා ඇත. ඒ කර්මාන්ත පුරයක් ඉදිකිරීම සඳහා යැයි පවසමිනි. එසේ ඉල්ලා ඇත්තේ කොන්ඩච්චි ග්‍රාම නිලධාරි කොට්ඨාසයට අයත් භූමියකින් කොටසකි. මුහුදු ප්‍රදේශයට වන්නට පිහිටි මෙම භූමිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් වුව ද, එම ප්‍රදේශයේ මෙතෙක් විධිමත්ව සීමා ලකුණු කර නැත. එසේම එම ප්‍රදේශය රක්ෂිතයක් ලෙස ගැසට් කර නොමැති නිසා සංවර්ධන කටයුතු සඳහා යැයි පවසමින් එම භූමිය ලබා ගැනීමේ බාධාවක් නීතිමය වශයෙන් නැත. එහෙත්, මීට පෙර නිදහස් කරන ලද, ජනතාව පදිංචි නොවූ ඉඩම් අක්කර සිය ගණනක් තිබියෙදී, එම ඉඩම්වල අදාළ ව්‍යාපෘතිය සිදු කිරීමට දේශපාලකයන් එකඟ නොවීම ගැටලුවකි. 2019 පෙබරවාරි 18 වැනිදා මුසලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවැති සාකච්ඡාවක දී රජයේ නිලධාරීන් මේ බව පෙන්වාදී ඇතත් රිෂාඩ් බදියුදීන් ඇමතිවරයාගේ පාර්ශ්වය එය ප්‍රතික්ෂේප කර තිබේ. ඔවුන් පවසා ඇත්තේ අදාළ නිදහස් නොකරන ලද, වන සංරක්ෂණ ඉඩම් කොටසම තමන්ට අවශ්‍ය බවයි.

විල්පත්තුව පෙන්වමින් කෙරෙන කතාවේ ඇතුළාන්තය, බෝම්බ පුපුරන විට තිබුණේ එවැනි තත්ත්වයකය.

විල්පත්තුව අප විසින් රැක ගත යුතු රක්ෂිතයකි. ඒ පිළිබඳ විවාදයක් නැත. ඉහත කී සිදුවීම් තුළ කරන ලද අවිධිමත් කටයුතු නිසා විල්පත්තුවට අත තබා නොතිබුණද ඒ අවට අනවශ්‍ය පරිදි කැලෑ එළි පෙහෙළි කිරීමක් සිදු වී ඇති බවද පැහැදිලිය. ඒ නිසා විල්පත්තුව පමණක් නොව ඒ අවට වනාන්තර විනාශ කරන්නේනම් ඊටද එරෙහි විය යුතුය. එහෙත් මෙහි ඇති ගැටලුවනම් විල්පත්තුව සම්බන්ධයෙන් විරෝධය පළ කරන ඇතැමුන් ඊට විරුද්ධ වන්නේ පාරිසරක ප්‍රශ්නය නිසා නොව ජාතිවාදය නිසා වීමය.

මේ රටේ පවතින එකම රක්ෂිතය විල්පත්තුව නොවේ. එහෙත් අනෙක් රක්ෂිතවල සිදු කරන වන විනාශය, අනවසර සත්ව දඩයම් කිරීම් යනාදිය ගැන මේ පිරිස සංවේදී නැත. යාල රක්ෂිතයට සමීප නිල්ගල කැලය විනාශ කරන බවට මාධ්‍ය මගින් සවිස්තරාත්මකව හෙළිදරව් කොට දැන් අවුරුදු දෙකකට ආසන්නය. එහෙත් ඒ ගැන මහා පරිමාණ සංවාදයක් තියා සුළු කසුකුසුවක් හෝ ඇති වූයේ නැත. ඇතැම් විට ඊට හේතුව චූදිත ඇමතිවරයා හා ඔහුගේ සහචර පිරිස සිංහල වීම නිසා විය හැකිය. සිංහරාජයේ සිදු කරන වන විනාශය පිළිබඳව ඇති වූ කතිකාවද ඉක්මනින්ම යටපත් වී ගියේය.

එක් පසෙකින් හන්තාන ආශ්‍රිතවත්, තවත් පසෙකින් පුත්තලමේ වන්නියාගම ආශ්‍රිතවත් සිදුවන වනාන්තර විනාශ කිරීම් පිළිබඳවද පසුගිය දිනවල තොරතුරු වාර්තා විය. පොලොන්නරුවේ ජල ගැලීම් නිම්න වනෝද්‍යානයේ අක්කර 2000ක් මේ වන විටත් විනාශ කර අවසන්ය. ඒ ගැන ද කිසිදු කතාවක් නැත. වැල්ලවාය ප්‍රදේශයේ හේන් වගා බිම් අත්පත් කරගනිමින් උක් වගාව සඳහා ඒවා ඩෝසර කර දමන ලද්දේ මීට බොහෝ කාලයකට පෙරය. ඒ ජනතාව විඳින දුක් ගැන අදටද කතාබහක් ඇත්තේ නැත. මින්නේරිය රක්ෂිතය මැද්දෙන් අඩි විස්සක පාරක් කිලෝමීටර් 18ක් දුරට කපමින් වනාන්තරය දෙබෑ කරන ලද්දේ මාස කිහිපයකට පෙරය. හම්බන්තොට වරාය සෑදූ පසු රන්න වැනි ප්‍රදේශවල ධීවරයන් පාරම්පරිකව භාවිතා කළ වැල්ලට අද බෝට්ටු දමන්නට බැරිය. අඩි 10ක් පමණ වෙරළ ප්‍රදේශය ඛාදනය වී ඇත. ඒවා ගැන මෙහේ අය තියා එහේ අයවත් කතා කරන්නේ නැත.

ලියනවා නම් මේ ආකාරයේ ලැයිස්තුවක්ම ලිවිය හැකිය. එහෙත් තේරුමක් නැත. පරිසර ඇසින් නොව ජාතිවාදී ඇසින් බලන බොහෝ දෙනෙකුට පේනෙන්නේ විල්පත්තුව පමණකි. ප්‍රශ්නය ඇත්තේ එතැනය.

විල්පත්තු රක්ෂිතය විනාශ කර නොතිබුණද රිෂාඩ් බදියුදීන්ලා කර ඇති පරිසර විනාශයත්, ඊනියා පරිසර හිතකාමීන්ගේ 'පරිසරය සුරැකීම'ත් දෙකම මේ වන විට ජාතිවාදය වැපිරීමට ආයුධක් කර ගනු ලැබ ඇත. එහෙත් සැබෑ ලෙස පරිසරය ආරක්ෂා කරන්නෙකුට පක්ෂයක්, ආගමක්, ජාතියක් වැඩක් නැත. වරදක් වරදක්මය. හානියක් හානියක්මය. එයට පක්ෂයක්, පාටක්, ජාතියක්, ආගමක් තිබිය නොහැක. ගිය ආණ්ඩුවෙන් සිදු කළද මේ ආණ්ඩුවෙන් සිදු කළද වරදක් නම් වරදක්මය.

විල්පත්තුව පමණක් නොව මෙරට රක්ෂිත වනාන්තර සෑම එකකම පාහේ විශාලත්වය ශීඝ්‍රයෙන් අඩුවෙමින් පවතී. ඒ අනවසර මෙන්ම අවසර ලද එළිපෙහෙළි කිරීම් නිසාය. සෑම වන හායනයක්ම පරිසර විනාශයකි. එරෙහි විය යුත්තේ සමස්ත පරිසර විනාශයට විනා එහි කොටසකට නොවේ.

විල්පත්තුව පමණක් නොව මෙරට රක්ෂිත වනාන්තර සෑම එකකම පාහේ විශාලත්වය ශීඝ්‍රයෙන් අඩුවෙමින් පවතී. ඒ අනවසර මෙන්ම අවසර ලද එළිපෙහෙළි කිරීම් නිසාය. සෑම වන හායනයක්ම පරිසර විනාශයකි. එරෙහි විය යුත්තේ සමස්ත පරිසර විනාශයට විනා එහි කොටසකට නොවේ.

ජනතා විමුක්ති පෙරමුණේ මහජන නියෝජිතයින් විසින් පළ කළ අදහස් වෙනුවෙන් නියමුවා වේදිකාව වෙන්වෙයි.

2019 මැයි 21

## පසුගිය 21වැනි දින සිදුවූ ත්‍රස්ත ප්‍රහාරයට ආණ්ඩුව වගකිව යුතු බව ප්‍රකාශ කරමින් ජනතා විමුක්ති පෙරමුණේ පාර්ලිමේන්තු කණ්ඩායම විසින් පසුගිය 21වැනිදා කථානායක වෙත විශ්වාසභංග යෝජනාවක් භාරදෙන ලදී. එම විශ්වාසභංග යෝජනාවේ මෙසේ සඳහන් වේ.

**අග්‍රාමාත්‍යවරයා, අමාත්‍ය මණ්ඩලය ඇතුළු ආණ්ඩුව කෙරෙහි විශ්වාසභංගත්වය**

1. වර්ෂ 2019ක් වූ අප්‍රේල් මස 21 වන පාස්කු ඉරිදා දින කොළඹ, මීගමුව, මඩකලපුව යන ප්‍රදේශවල සිදු වූ මරාගෙන මැරෙන ත්‍රස්ත ප්‍රහාර හේතුවෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් ඇතුළු දෙසිය පනහකට අධික පිරිසක් ඝාතනය විමත්, තවත් පන්සීයයකට ආසන්න පිරිසක් තුවාල ලැබීමත් සහ එකී බෝම්බ ප්‍රහාර හේතුවෙන් වූ දේපළ හානිය සම්බන්ධයෙන් අග්‍රාමාත්‍යවරයා, කැබිනට් මණ්ඩලය සහ ආණ්ඩුව වෙත නිල වශයෙන් නිසි තොරතුරු ලැබී තිබියෙදී සාපරාධී නොසැලකිල්ලෙන් පහත සඳහන් කෙරෙන ක්‍රියාවන් කරමින් හෝ නොකර හැරීමෙන්,

අ) 2019.05.08 වන දින අග්‍රාමාත්‍යවරයා පාර්ලිමේන්තුවේ ප්‍රකාශ කළ පරිදි 2014 වර්ෂයේ සිට අයිඑස්අයිඑස් ජාත්‍යන්තර ඉස්ලාම් අන්තවාදී සංවිධානය සමඟ ශ්‍රී ලංකාවේ පිරිස් විවිධ සබඳතා පැවැත් වූ බවත් විවිධ ක්‍රියාකාරකම්වල යෙදුන බවත් දැන සිටියෙදී ඒ සම්බන්ධයෙන් නිසි පියවර ගැනීමට අපොහොසත් වීම,

ආ) විවිධ ඉස්ලාම් ආගමික අන්තවාදී සංවිධාන මුස්ලිම් සමාජය තුළ ක්‍රියාත්මක වන බවට මුස්ලිම් ප්‍රජාව විසින්ම විවිධාකාරයෙන් ආණ්ඩුව සහ වගකිව යුතු ආයතන දැනුවත් කර තිබියෙදී ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමට අපොහොසත් වීම,

ඇ) කාත්තන්කුඩි ප්‍රදේශයේ ජීවත් වන ජනතාවට විවිධ අවස්ථාවල එල්ල කරන ලද තර්ජන සහ ප්‍රහාර සම්බන්ධයෙන් 2019 අප්‍රේල් මස 21 වන දින බෝම්බ පුපුරවාගෙන මිය ගිය සහරාන් හෂීම් සහ 2019 අප්‍රේල් මස 26 වන දින සයින්දමරුදුහිදී බෝම්බ පුපුරුවාගෙන මිය ගිය ඒ.එල්.එම්. නියාස් යන අයවලුන්ට එරෙහිව අධිකරණය විසින් වරෙන්තු නිකුත් කර තිබියෙදී සහ එකී වරෙන්තුකරුවන් කාත්තන්කුඩි ප්‍රදේශයේ ප්‍රසිද්ධව විවිධ ක්‍රියාකාරකම්වල යෙදී සිටියෙදී ඔවුන් අත්අඩංගුවට ගැනීමට හෝ නිසි ලෙස නීතිය ක්‍රියාත්මක කිරිමට අපොහොසත් වීම,

ඈ) වර්ෂ 2018ක් වූ දෙසැම්බර් මස 24 වන දින මාවනැල්ලේදී බුද්ධ ප්‍රතිමාවන් හානි කිරිම සම්බන්ධයෙන් සහරාන් හෂීම් ප්‍රමුඛ කණ්ඩායමක් සම්බන්ධ බවට ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සලය විසින් ජාතික බුද්ධි අංශය වෙත 2018 දෙසැම්බර් මස 28 වන දින දැනුම් දී තිබියෙදී හා මෙම ප්‍රහාරය සම්බන්ධයෙන්



සැක කරමින් කිහිපදෙනෙකු අත්අඩංගුවට ගෙන තිබියෙදීත් විමර්ශන ඉදිරියට ගෙන යාම වළක්වමින් ඒ සඳහා මැදිහත් වීම් තිබුණු බව ආණ්ඩුවේ අමාත්‍යවරයෙකු විසින්ම ප්‍රකාශ කර තිබීම,

ඉ) මෙම ප්‍රහාරයන්ට සැලකිය යුතු කාලයකට පෙර සිට ශ්‍රී ලංකාව තුළ ඉස්ලාම් අන්තවාදී සංවිධානවල විවිධ ක්‍රියාකාරකම් පිළිබඳව විශේෂයෙන් සැලකිය යුතු ශ්‍රී ලාංකිකයන් ප්‍රමාණයක් අයි.එස්.අයි.එස් සංවිධානය සමඟ බැඳී කටයුතු කිරීම ඇතුළු කරුණු සම්බන්ධයෙන් නීතිමය සහ ආරක්ෂක පියවර ගැනීමට අපොහොසත් වීම,

ඊ) ආරක්ෂක මණ්ඩලයේ සාමාජිකයෙකු වන අගමැතිවරයා ආරක්ෂක මණ්ඩල සභාවාරයන්ට සහභාගි නොවීමෙන් රටවැසියා වෙත ඔහු විසින් ඉටුවිය යුතු මූලික වගකීම් පැහැර හැරීම,

එ) විදේශීය ඔත්තු සේවාවන් විසින් ශ්‍රී ලංකාව තුළ කතෝලික පල්ලි හා හෝටල් ඉලක්ක කරගෙන මරාගෙන මැරෙන ප්‍රහාරයක් දියත් කෙරෙන බවත්, එයට සම්බන්ධ පුද්ගලයන් හා ඔවුන්ගේ දුරකථන අංක, ජාතික හැඳුනුම්පත් අංක ඇතුළු නිශ්චිත තොරතුරු ලබාදී තිබියෙදී එම තොරතුරු මත පදනම්ව කටයුතු කිරීම පැහැර හැරීම,

වැඩිමනත් ලෙස 2019.4.21 වන දින එකී ප්‍රහාරයන්ට පෙර අදාළ විදේශ ඔත්තු සේවාවන් විසින් නැවතත් මෙම ප්‍රහාරයන් සම්බන්ධයෙන් නිශ්චිතව අනතුරු අඟවා තිබියදී ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම පැහැර හැරීම,

ඒ) 2019.04.11 වන දින නියෝජ්‍ය පොලිස්පති විශේෂ ආරක්ෂක දිසාව ප්‍රියලාල් දසනායක මහතා විසින් "Information of an alleged plan attack" යන ශීර්ෂය හා DIG/SPR/126/ 4.19 නැමැති ලිපිය මගින් 2019 අප්‍රේල් 21 වන දින නිශ්චිත ස්ථාන ඉලක්ක කර ගෙන සැලසුම් ගත මරාගෙන මැරෙන ප්‍රහාරයන් එල්ලවන බවට, එනම් "ජාතික තව්හිත් ජමාත් නායක මොහොමඩ් සහරාන් මෙරට මරාගෙන ප්‍රහාරයක් දියත් කිරීමට සැලසුම් කරන ලද බවට තොරතුරක් සම්බන්ධයෙන් රාජ්‍ය බුද්ධි සේවාව මගින් ලබාදී තිබෙන වාර්තාවේ ඇතුළත් කරුණු සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරමින්" යනුවෙන් සඳහන් ලිපිය පහත නම් සඳහන් එනම්,

- අධ්‍යක්ෂක / ඇමති ආරක්ෂක කොට්ඨාසය
- අධ්‍යක්ෂක / අධිකරණ ආරක්ෂක කොට්ඨාසය
- අධ්‍යක්ෂක / විශ්‍රාමික ජනාධිපති කොට්ඨාසය
- වැඩ බලන අධ්‍යක්ෂක/තානාපති ආරක්ෂක කොට්ඨාසය (iv)
- වැඩ බලන අධ්‍යක්ෂක/ විශ්‍රාමික ජනාධිපති ආරක්ෂක කොට්ඨාසය (v)

අයවලුන්ට පූර්වයෙන් ලබා දී තිබීම හා ඒ පිළිබඳ කටයුතු කිරීම පැහැර හැරීම,

යන ඉහත කරුණු අනුව 2019.4.21 වන දින සිවිල් වැසියන් ඉලක්ක කරගනිමින් සිදු වූ ත්‍රස්ත ප්‍රහාරය අවශ්‍යයෙන්ම වළකා ගැනීමට හෝ හානිය අවම කරගත ගත හැකිව තිබූ හෙයින්ද,

2. 2019.04.21 වන දින සිදු කරනු ලැබූ ප්‍රහාර මාලාවෙන් පසුව අගමැතිවරයා සහ අමාත්‍යවරුන් විසින් එකී ප්‍රහාර මාලාව සම්බන්ධයෙන් වූ වගකීම භාර නොගෙන එම වගකීම වෙනත් පාර්ශවයන්ට පැවරීමට උත්සහ කරමින්ද රජයේ අමාත්‍යවරුන් විසින් වගකීම් විරහිත, පරස්පර සහ සාවද්‍ය ප්‍රකාශයන් සිදු කරමින් රටේ සාමාන්‍ය ජනජීවිතය හා මහජන ආරක්ෂාව සම්බන්ධයෙන් ව්‍යාකූලභාවයක් සහ අනාරක්ෂිතභාවයක් ඇති වන පරිදි කටයුතු කර ඇති හෙයින්ද,

3. 2019.04.21 වන දින පාස්කු ඉරිදා දින ප්‍රහාරය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් සැකකරුවන් සම්බන්ධයෙන් විමර්ශන ක්‍රියාවලියට බාධා කරමින් සහ එකී අපරාධයන් සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීමට බාධා කරමින් හෝ වළක්වමින් ආණ්ඩුවේ සමහර අමාත්‍යවරුන් කටයුතු කර ඇති හෙයින්ද,

**4. 2019.04.21 වන දින සිදු වූ ත්‍රස්තවාදී ප්‍රහාර මාලාවෙන් පසුව තවත් එවැනි ප්‍රහාර මාලාවක් ඇති වීම හෝ වෙනත් ආකාරයක ප්‍රචණ්ඩ ක්‍රියාවන් සිදු කිරීම මැඩපැවැත්වීම සඳහා අවශ්‍ය පූර්ණ නීති මාලාවක් රාජ්‍යය සතුව තිබියෙදී 2019.05.13 වන දින ගම්පහ ප්‍රදේශයේ සහ වයඹ පළාතේ සිදු වූ අන්තවාදී ප්‍රචණ්ඩකාරී ක්‍රියා එනම් මනුෂ්‍ය ඝාතන, දේපළ හානි සහ ජනතාව අතර ගැටුම් ඇති වීම වැළැක්වීම සඳහා නිසි අවධානයකින් සහ වගකීමෙන් කටයුතු**

15 වැනි පිටුවට

2019 මැයි 07

# මේ මොහොතේ නිවැරදිම දේශපාලනය ජාතික සමගියයි

(අප්‍රේල් 21 ප්‍රහාරය පිළිබඳ පාර්ලිමේන්තු විවාදයට සහභාගී වෙමින්)

## ජනතා විමුක්ති පෙරමුණේ පාර්ලිමේන්තු කණ්ඩායම් නායක අනුර දිසානායක සහෝදරයා

විශේෂයෙන්ම මෙම ඝාතන සාමාන්‍ය සිදුවීමක් නොවෙයි කියා අපි දන්නවා. මෙය ගංවතුරක් නම්, මෙය සුළි සුළඟක් නම්, මෙය සුනාමියක් නම්, අපි හැමදෙනාටම වළක්වාගත නොහැකි ස්වාභාවික ව්‍යසනයක් නම් අපි ඒ දෙස බැලිය යුත්තේ ස්වාභාවික ව්‍යසන කෝණයකින් තමයි. හැබැයි මෙය ස්වාභාවික ව්‍යසනයක් නොවෙයි. මෙය ඝාතනයක්. මේ ඝාතනය දේශපාලනික ඝාතනයක්. ඒ නිසා මෙය වැළැක්විය නොහැකි ලෙසම මේ තුළ දේශපාලනය ගැබ්වී තිබෙනවා. ඒ නිසා එම දේශපාලනය ගැන කථා කරන්නේ නැත්නම්, එහි ගැබ් වී තිබෙන දේශපාලනය රටට නිරාවරණය කරන්නේ නැත්නම්, අප කාටත් කඳුළු වගුරවා නොගෙන, බඳාගෙන සතුටු සාමීචියෙන් කථා කරන්න පුළුවන්. නමුත් මෙතැන දේශපාලනයක් තිබෙනවා.



මෙය ඉස්ලාම් ආගමික අන්තවාදයේ ම්ලේච්ඡ ප්‍රහාරයක්. මා විශේෂයෙන්ම ඉස්ලාම් භක්තිකයන්ගෙන්; ඒ සැබෑ භක්තිකයන්ගෙන් ඉල්ලීමක් කරනවා. මේ නාමකරණයවත් දෙන්න ඔබ තවමත් සූදානම් නැත්තේ ඇයි? තවමත් සූදානම් නැහැ. මෙය පතුලේ තිබෙන්නේ කුමක්ද? අපි එල්ටීටීඊ සංවිධානයට දුන් නාමකරණය තමයි, 'දෙමළ බෙදුම්වාදී කොටි ත්‍රස්තවාදය' කියන එක. ඒක ඇතුළේ ඒ සංයුතිය තිබුණා. මේක ඇතුළේ ඉස්ලාම් ආගමික මූලධර්මවාදී සංයුතිය තිබෙනවා. ඒකෙන් මේක වෙන් කරන්නේ ඇයි? අපි ඒකෙන් මේක වෙන් කරනවාය කියා කියන්නේම, තවමත් මෙහි සැබෑ ස්වරූපය රටට හෙළිදරවු නොකර සිටින්න උත්සාහ කරමින් සිටිනවාය කියන එකයි.

හැබැයි, අගමැතිතුමා මේ නාමකරණය දෙනවාද? ජනාධිපතිවරයා මේ නාමකරණය දෙනවාද? ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලය නියෝජනය කරන මුස්ලිම් අමාත්‍යවරු මේ නාමකරණය දෙනවාද? ඒ කවුරුවත් එය දෙන්නේ නැහැ. ඕනෑම ප්‍රහාරයක සංයුතියේ ස්වභාවය තේරුම් ගැනීම, එම ප්‍රහාරයට එරෙහිව ක්‍රියාමාර්ග තේරීමේදී අතිශය වැදගත් වෙනවා. මේක හුදු ත්‍රස්තවාදයක් ලෙස අර්ථ කථනය කිරීම පමණක් ප්‍රමාණවත් වෙන්නේ නැහැ. ක්‍රියාව ත්‍රස්තවාදී ක්‍රියාවක් තමයි. හැබැයි, මේ ප්‍රහාරයෙන් සංයුතිය තුළ තිබෙන්නේ ඉස්ලාම් ආගමික අන්තවාදී, ම්ලේච්ඡ, උමතු මතවාදයක්. අන්න ඒක අපි තේරුම් ගන්න ඕනෑ.

> තමන් විසින්ම කැඳවන ලද භූතයා තමන්ටම බෝතලයට දමා ගන්න බැරි තත්වයට තමයි රවුෆ් හකීම් අමාත්‍යවරයාත්, රිසාඩ් බදියුදීන් අමාත්‍යවරයාත් අද පත්වී සිටින්නේ. මේ භූතයා කැඳෙව්වේ තමන්. මේ භූතයාට ආරක්ෂාව දුන්නේ තමන්. මේ භූතයා බෝතලෙයන් එළියට ගත්තේ තමන්. හැබැයි, දැන් තමන්ටත් මේ භූතයා බෝතලයට දමා ගන්න බැහැ. මම අද කියන්නම්. පටන් ගත්තේ කතෝලික, ක්‍රිස්තියානි ජන කොට්ඨාසය ඉලක්ක කරගෙන වෙන්න පුළුවන්. හැබැයි, මේක කෙළවර වන්නේ තමුන්නාන්සේලාත් පොඩි පට්ටම් කරගෙන බව මතක තබා ගන්න.

මේ ඝාතනවලට සම්බන්ධ අපරාධකරුවන් කොටස් දෙකක් ඉන්නවා. එක කොටසක් තමයි, ඒ ඝාතනයට හවුල් වූ අය. දෙවැනි කණ්ඩායම තමයි, නිශ්චිත තොරතුරු ලබා දී තිබියදී එම ඝාතනය වළක්වා ගැනීමට නොහැකි වූ අය. ඔවුනුත් අපරාධකරුවන් බවට පත් වෙනවා. ඒක නොවේය කියා කියන්න පුළුවන්ද? මෙම ඝාතනයට සම්බන්ධ වූවන් අපරාධකරුවන් ලෙස සලකනවා වාගේම, මෙම ඝාතන වළක්වා ගැනීමට නොහැකිවීමත් අපරාධ ක්‍රියාවක්. ඒ අපරාධ ක්‍රියාවට ජනාධිපතිවරයා සම්බන්ධයි; අග්‍රාමාත්‍යවරයාත් සම්බන්ධයි. ඒක නිසා තමයි මම මුලින් කිවුවේ, මේ වැදගත් විවාදයේදී ඊට වගකිවය යුතු අය මේ සභාවේ ඉන්න ඕනෑ බව.

මේ විනාශය වළක්වා ගැනීමට නොහැකි වූයේ දේශපාලනය නිසායි. ආණ්ඩුව පිහිටවපු දවසේ සිට, ඉතා කෙටි කාලයක් ඇතුළත මේ පාර්ශ්ව දෙක විශාල බල පොරයකට ගියා. අගමැති රනිල් වික්‍රමසිංහ මහතා තමන්ට කවදාවත් ඉටු කර ගත නොහැකිවී තිබෙන සිහිනයක - ජනාධිපති පුටුවේ වාඩි වීම සඳහා මනෝරාජික සිහිනයක සිටියා. මෛත්‍රීපාල සිරිසේන මහතා, තමන් මේ පුටුවේ වාඩි වුණේ කෙසේද කියන එක පසෙකලා, නැවත එහි වාඩි විය හැකිය කියන මනෝරාජික සිහිනයක සිටියා. මේ සිහිනය විසින් රටෙහි විශාල අරාජිකත්වයක් නිර්මාණය කළා. පොලිස්පතිවරයා පත්කරන විටත් ඒ පාර්ශ්වයේද, මේ පාර්ශ්වයේද කියා බලනවා හමුදාපතිවරයා පත් කරනකොටත් ඒ පාර්ශ්වයේද, මේ පාර්ශ්වයේද කියා බලනවා. ආණ්ඩුවක් ලෙස තමුන්නාන්සේලාට ජාතික ආරක්ෂාව පිළිබඳව වගකිව යුතු කාර්ය භාරයක් පැවරී තිබුණාට, ජාතික ආරක්ෂාව පිළිබඳව විෂයය මෙහෙයවූයේ රටේ ආරක්ෂාව දෙසට නොවෙයි. ජනාධිපතිවරයා මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට පිළිතුරු දිය යුතුයි. අමාත්‍යවරුන් පස්සේ යන්න බුද්ධි අංශය යෙදවූයේ නැද්ද? බැසිල් රාජපක්ෂ කොහාටද ගියේ. මලික් සමරවික්‍රම කොහාටද ගියේ, කවුද හම්බ වුණේ කියන කාරණා සෙවීම තමයි බුද්ධි අංශයේ ප්‍රධාන කාර්ය භාරයක් බවට පත්වෙලා තිබුණේ.

බල ගැටුම රටේ විශාල අරාජිකත්වයක් නිර්මාණය කළා. ආරක්ෂව පිළිබඳ බලගතු ලිපි, බලගතු තොරතුරු තවදුරටත් වැදගත් නැති තොරතුරු බවට පත්වුණා. වැදගත් ඒවා හිස් ලියවිලි වුණා. හැබැයි, ඒවා තමන්ගේ දේශපාලනය අනතුරකට දමනවා නම් වැදගත් තොරතුරු බවට පත්වෙනවා. හදිසියේ ගිහිල්ලා කවුරු හෝ හම්බ වුණා කියා තොරතුරක් ලැබෙනවා නම් ඒකට වේගවත් ප්‍රතිචාර ලැබෙනවා. ඒ ගැටුම තමයි පසුගිය ඔක්තෝබර් මාසයේ 26වැනිදා පුපුරා ගියේ. මේ ගැටුමේ ප්‍රබලතාව මුළු රටම දැක්කා. ඒ නිසා රට අරාජිකත්වයට ගෙනාවා.

රටක ආණ්ඩුවක ජාතික ආරක්ෂාව, රටක ආණ්ඩුවක මහ ජනයාගේ ආරක්ෂාව න්‍යාය පත්‍රයේ ප්‍රමුඛ කොටස බවට පත්කර ගතත යුතුව තිබුණා. ප්‍රමුඛ කටයුත්ත නොවෙයි, ජාතික ආරක්ෂාව පයට පෑගෙන දූවිල්ලක්

15 වැනි පිටුවට

කවුළුව හැර තබමි

# තවත් බෝම්බකරුවන් එපා!



මිනිස් බෝම්බ බවට පත්වූ ආගමික අන්තවාදීන් පිරිසක් විසින් පසුගියදා සිදුකළ ම්ලේච්ඡ මිනිස් ඝාතනයේ උණුසුම තවමත් ලාංකේය සමාජයෙන් ඉවත්ව ගොස් නොමැත. මිනිස්කම අඳුනන ලොව සියලුම ජනතාව මෙම ප්‍රහාරය දැඩි පිළිකුළෙන් යුතුව හෙළා දුටුවේය.

පිස්සුවලින් දරුණුම පිස්සුව ආගමික පිස්සුව බව එක්තරා විද්වතෙක් විසින් පවසනු ලැබ තිබේ. එයට හේතුවක් ඇත. එනම් ලෝකයේ එතෙක් මෙතෙක් වැඩිම පිරිසක් ඝාතනය වී ඇත්තේ ආගමික යුද්ධ නිසා වීමයි. තමන් අදහන ආගම හැර වෙනත් කිසිදු ආගමක් මිහිපිට නොතිබිය යුතුය සහ වෙනත් ආගම් අදහන අය අමු අමුවේ ඝාතනය කිරීම ස්වර්ග යට යන කෙටිම පාර වන්නේය කියා ඉගැන්වූ ආගමික ශාස්තෘවරයෙක් ගැන අප නම් අසා නැත. කුඩා බිළිඳාගේ පටන් මහල්ලා දක්වා ලේ සයුරක ගිල්වා මරා දැමීමට තරම් ආගමික උන්මත්තකභාවයට මිනිස් පත්වන්නේ ඇයි කියා විමසා බැලීමට පසුගිය ම්ලේච්ඡ මිනිස් බෝම්බකරුවන්ම ප්‍රමාණවත්ය.

ජාතිභේද නැති, ආගම් භේද නැති, කුලමල නැති, වර්ණභේද නැති මිනිස්කම පමණක් රජයන ලෝකයක් ගැන නිකමට හිතා බලන්න. එය මොනතරම් සුන්දර ලෝකයක් වේද? ම්ලේච්ඡත්වයේ සිට ශිෂ්ටත්වය කරා පිය නැගි මිනිසා නැවත ම්ලේච්ඡත්වය කරා ඇදගෙන යන්නේ කුමන හේතූන් නිසාද? එම හේතූන් ඉවත් කිරීමෙන් තොරව ලෝකයට බණ කියූ පමණින් මිනිසා සුවපත් වන්නේ නැත. එතෙක් ආගමික බෝම්බ ජාතිවාදී බෝම්බ කොයි මොහොතේ කොතැනක පුපුරනවාදැයි අපට සිතාගත නොහැක. ආගම සහ ජාතිය මෙතරම් පහසුවෙන් බෝම්බ බවට පත්වන්නේ ඇයි?

මොහොතකට සිතන්න. ජාතියක්, ආගමක් බෝම්බ කරගත් සමාජය කොයි බොහොතේ හෝ පුපුරා යනු නියතය. අවසානයේ එම සමාජයට ඉතිරිවන්නේ ලේ සහ කඳුළු පමණි. ඉදින් මිනිසුන් මේ උමතු අන්තවාදී මතවාද පරාජය කළ හැකි මානවවාදී සමාජයක් එනම් සමාජවාදී සමාජයක් බිහිකරලීම තවත් පමා කළ යුතුද?.

# බෝම්බ අස්සේ තවත් බෝම්බයක්



පසුගිය මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරය මේ රටේ තක්කඩි දේශපාලුවන්ට නම් අලුත් ඉල්ලමක් පාදා දී ඇත. මේ වන විට එය දඩමීමා කරගනිමින් මේ දේශපාලුවෝද ජාතිවාදීහුද සමහර ආගමික නායකයෝද තම තමන්ගේ දේශපාලන න්‍යාය පත්‍ර ශුද්ධපවිත්‍ර කොට කරළියට දමමින් සිටිති. බුදු බණ, දේව වාක්‍යවලින් වසා දැන් ඔවුහු තම තම පෞද්ගලික වුවමනා එපාකම් වෙනුවෙන් දේශපාලන ව්‍යාපෘතිද කරළිගත කරමින් සිටී. හක්කේ බුදුරැස් බොක්කේ දඩමස් කියා අපේ පැරන්නන් කීවේ මේවාටය.

බෝම්බ ප්‍රහාරයෙන් පසුවදාම රටේ අගමැති රනිල් ජාතිය අමතා අපූරු ප්‍රකාශයක් කළේය. එනම් මේවා වැළැක්වීමට 'ප්‍රතිත්‍රස්ත' පනත ඉක්මනින්ම සම්මත කරගත යුතු බවයි. තිබෙන පනත් ප්‍රමාණවත් නොවන බවයි. රනිල් හැසිරුණේ ඉබ්බා දියේ දැම්මා සේය. රනිල්ලා මේ හදන්නේ අයිඑස් ත්‍රස්තයන්ටත් වඩා ත්‍රස්තයක් මේ සමාජය මත මුදාහරින්නටය. එක ගලෙන් කුරුල්ලන් දෙදෙනෙකු නොව කුරුලු රැනක්ම මරා දැමීමටය. බෝම්බය රනිල්ලාටනම් ආශීර්වාදයක් වී ඇති හැඩය. මේ රනිල් හදන්නේ බෝම්බය පිට දමා මුළු රටටම බෝම්බයක් ඇටවීමටය.

මේ පනත අනුව ක්ෂණයකින් රටේ ඕනෑම පුරවැසියකු ත්‍රස්තවාදියෙකු කර ඔහු මත මර්දනය මුදාහළ හැකිය. ඊට දෙස් විදෙස් කොල්ලකරුවන්ට බිලිදී කොමිස්කුට්ටි ගිල දැමීමට වලිකන දේශපාලුවන්ට එරෙහිව නැගී සිටින රටේ වැඩකරන ජනයා ඇතුළු පීඩිත ජනයා මර්දනය කිරීමේ අරමුණෙන් ගෙනඒමට වලිකන මෙම පනතට රට පුරාම විරෝධය පළවෙමින් තිබේ. අන්තවාදී ත්‍රස්තයන් ආවේ බඩේ හෝ පිටේ බෝම්බ බැඳගෙනය. රනිල් එන්නේ තම කෝට් සාක්කුවේ බෝම්බය දමාගෙනය. වෙනස එයයි. මේ සියලු දෙනා බෝම්බකරුවන්ය. රට ගලවා ගත යුත්තේ ඔවුන්ගෙන්ය.

# චාම්ය. එහෙත් අභිමානවත්ය.




පසුගිය ඉස්ලාම් ආගමික උමතු අන්තවාදී ත්‍රස්ත ප්‍රහාරයත් සමග අක්‍රීය වූ රට තවමත් ඇත්තේ අයාලේ යන ස්වරූපයකිනි. ත්‍රස්ත ප්‍රහාරයත් සමග එය දඩමීමා කරගත් ආණ්ඩුව මැයි දින සැමරුම් වාරණයක්ද පනවන ලදී. එහිදී සියලු පක්ෂ සහ සංවිධාන විසින් මහජන ආරක්ෂාව වෙනුවෙන් මැයි දින සැමරුමට ස්වයං වාරණයක් දමා ගන්නා ලදී. පසුව ජ.වි.පෙ. චාම් මැයි දින සැමරුමක් සංවිධානය කළ විට ඒ සඳහා ශාලාවක් ලබා නොදීමට ආණ්ඩුව වගබලා ගෙන තිබිණි. එහෙත් ඒ සියලු බාධක පරයා ජ.වි.පෙ. විසින් තම පක්ෂයේ ප්‍රධාන කාර්යාලයේදී චාම් එහෙත් අභිමානවත් මැයි දින සැමරුමක් සිදුකරන ලදී.

ජාතිවාදයෙන් සහ ආගමික අන්තවාදයෙන් හිස් තෝන්තු කර සිටි ලාංකේය සමාජයට එහිදී වැදගත් පණිවුඩයක් ලබා දෙනු ලැබිණි. එනම් ලෝකයේ මෙවන් අන්තවාදයන් පරාජය කළේ සමාජවාදය ජයගත් රටවල් විසින් බවයි. එනම් වැඩකරන ජනතාවගේ නායකත්වයෙන් සමාජවාදී සමාජ පරිවර්තනයකින් තොරව මෙම අන්තවාදයන් පරාජය කළ නොහැකි බව එම රටවල් විසින් ඔප්පු කර සිටි බවයි. ඒ අනුව මෙම සියලු අන්තවාදයන් පරාජය කළ හැක්කේ සංවිධානාත්මක වැඩකරන ජනතා ව්‍යාපාරයක ජයග්‍රහණයෙන් බවයි. වැඩකරන ජනතාවට රටක්, ආගමක්, ජාතියක් නොමැති බවත් ඔවුන් ලෝක පුරවැසියන් බවත් ඔවුන් ලොව දෙස බැලිය යුත්තේ වැඩකරන ජනතා දෘෂ්ටියෙන් මිස, ජාතිවාදී සහ ආගමික අන්තවාදී දෘෂ්ටියකින් නොවන බවට මාක්ස් මීට සියවස් එකහමාරකටත් පෙර අවධාරණය කළ සත්‍යය අද මොනවට ඔප්පු වී නොතිබේද? මෙවර ජවිපෙ මැයි දින සැමරුමෙන් ලබාදුන් පණිවුඩයද එයයි.

# පොලිටිකල් පංතිය

එක උදේක පොලිටික්ක තනියම කතා කර කර කොරිඩෝව දිගේ එනව ළමයි දෙතුන් දෙනෙක් දැකල තිබුණා. උන් දුවල ඇවිල්ල පංතියට ගින්න දුන්න. පොලිටික්ක හම් මල්ල අරන් දොරෙන් ඇතුල් වෙනකොටත් ගින්න පැතිරිලා ඉවරයි.

"ගුඩ් මෝනිං... ස...ර්" වසන්තිය කිවුවෙ ටිකක් බර කරල.

"වෙරි ගුඩ් මෝනිං සර්..." අනුරුද්ධියත් එහෙම කියන්න ගිහින් 'ර්' සද්දෙ වැඩි වෙලා බළල් පාට් එකක් ආව.

"ගුඩ් මෝනිං ළමයිනේ...මොකද පුරු... පුරු ගාන්නෙ... දන්න විදිහට ආයුබෝවන් කිවුවනම් ඉවරනෙ" පොලිටික්ක බොහොම සාමකාමී ආරම්භයක් ගත්ත.

"ආයු...බෝ...වන් කියල කටක් ඇරලා කියන්නෙ කොහොමද තව ජීවත් වෙන එකම අවුලක්නෙ..." මංජුව කනියගෙ කනට කෙඳිරුවටම වටේ දෙතුන් දෙනෙකුටම ඔකස් ගාල හිනා ගියා.

"මොකද ළමයිනේ හිනාව..." පොලිටික්ක කනියලෑ පැත්තට රබර් ඇහැ දැම්ම. "රටේ තියෙන්නෙ හදිසි නීති තත්වයක්. හැම දේකටම කරුණු පැහැදිලි කරන්න වෙයි" හිනා වුණේ ඇයි කියල පොලිටික්ක වෙන වචනවලින් ඇහුව.

"එහෙනම් සර් එන ගමන් මොනවද තනියම කියෝ කියෝ ආවෙ ඇයි කියලත් ළමයින්ට කියන්න වෙයි" මංජුව පොල්ලෙන් ගහන්න වගේ ඇහුවම පොලිටික්ක හොල්මන් වුණා.

"මම... මම... මම හිතුවෙ..." ගෝඨට බලේට එන්න හොඳම වෙලාව මේක තමයි කියල පොලිටික්ක ඇත්තටම හිතපු දේ හැඟුව... දැම්ම කිවුවොත් අවුල් වෙයි කියල හිතල. "...මම මටම කිය කිය ආවේ මේ රටේ දේශපාලකයො ඔක්කොම එකයි කියන එක. මුන්ගෙන් රටට වැඩක් නෑ බරක් මිසක්..."

"සර්ට එහෙම හිතෙන එක හරි" කනිය බොක්කෙම්ම එකතු වුණා.

"ඔව් ඔව් සර්ට... සර්ට එහෙම හිතෙන එක හරි" මංජුවත් එකෙන්ම තහවුරු කළා.

"ඇයි ළමයිනේ මට විතරක්ද ඇයි ඔයාලට එහෙම හිතෙන්නෙ නැද්ද?" පොලිටික්ක තනිවෙලා වගේ වටපිට බැලුව. "ඇයි ඔය ළමයි කියන්නෙ මේ දේශපාලුවො දෙසිය විසිපහ රටට කරපු දේ හරි කියලද? මුං තමයි රට නැති කළේ. ඔයගොල්ල මොනාද දන්නෙ?" පොලිටික්ක රැඩිකල් විග්‍රහයකට ගියා.

"සර්ට එහෙම හිතෙන එක හරි. මොකද ඒක සර් දන්න සර් ආශ්‍රය කරන අය දිහා බලල ගත්ත තීරණයක් හින්ද" සමන කතාව පටන් ගත්ත. "සර් දන්න ඔක්කොම හොරු තක්කඩි. මිනීමරුවො. ඒ හැමෝම වගේ රට කරවපු අය. එතකොට සර් හිතන්නෙ දෙසිය විසිපහම එහෙම තමයි කියල. සර් හිතන්නෙ 21 පහර දෙන එක දෙසිය විසිපහම දැනන් හිටිය කියල. නැහැ අපි දන්න හයක් එහෙම නැහැ. එතකොට ඒක සංශෝධනේ වෙන්න ඕනෙ දෙසිය දහනමයකට කියල. අනික ඒ හය රට කරවපු අය නෙමෙයි. රට කරන්න ඉල්ලන අය. රට කාපු ආයෙත් රට කන්න ඉල්ලන අයගෙන් වෙනස්. එයාලා ආණ්ඩුවෙන් බොඩි ගාඩ්ලා අරන් නැති නිසා 21 ගැන දන්නෙත් නැහැ..."

"නැහැ සමන් මං කිවුවෙ... මං කියන්න හැදුවෙ ගෝ..." පොලිටික්ක මොකද්ද කියන්න හැදුවත් සමන අතින් නැවැත්තුව.

"හෝව් පොඩ්ඩක් ඉන්න සර්... කතාව ඉවර නැහැ... දැන් සර් නෙමෙයි... සමහරු කියන්න හදනව දේශපාලකයො හොඳ නෑ, ගෝඨා හොඳයි. ගෝඨා දේශපාලකයෙක් නෙමෙයි කියල. මොන බොරුවක්ද? මහින්ද මහත්තයගේ දේශපාලනේනෙ එයා තල්ලු කරන් ගියේ. ඡන්දෙ ඉල්ලුවෙ නැති එක විතරයි. බලය මෙහෙයෙව්වෙ එයානෙ. එහෙම නෙමෙයිනම් හිඟන්නො තමන්ගෙම ඔළුවලට බ්ලොක් ගල් අතෑරගත්ත, තාජුඩීන්ම කාරෙක තාප්පෙ හප්පගෙන මැරුණ, රතුපස්වලදි-කටුනායකදි-හලාවතදි කියන දේ අහන් නැති තුවක්කුවලින් උණ්ඩ එළියට පැන්න. ඇවන්ගාඩ් සමාගම තිතටම රජයට බදු ගෙව්ව. මිග් යානා ගනුදෙනුවෙ වංචාව ඔප්පු කරගන්න බැරුව ලසන්ත දිවි නහගත්ත. මෙහෙව් ... පුතාල හදපු දෙමව්පියො සිහි කරන්න මිනිස්සුම කෝටි ගණන් වියදම් කරල සොහොන් බැන්ද..."

"මුන් ඔක්කොම එකයි සමන්" පොලිටික්ක තාප්පෙට හිරවේගෙන වගේ යනකොට කියාගත්ත.


"ඔක්කොම එක නෑ සර්. මිනිස්සුන්ට තාම වෙනස හොයාගන්න බැරිවෙලා තියෙනව. එච්චරයි" පොලිටික්ක මොකද්ද හොයන්න වගේ මල්ලට ඔළුව ඔබා ගන්න අතරෙ සමන කියල දැම්ම.

## දේශපාලන 'ඔළුබක්කන්'...

03 පිටුවෙන්

ධනපති දේශපාලන පක්ෂ ප්‍රතික්ෂේප වනවිට එම ස්ථානය ගැනීම සඳහා විවිධ වර්ගයේ පුද්ගල චරිත මතුකිරීමට සමහරු උත්සාහ දරති. එම චරිතද තමන්ම මතුවීමටද උත්සාහ දරති. පසුගිය කාලයේ මතුවූ විවිධ පුද්ගල චරිතවලින් කියැවෙන්නේ එයයි. මේ වන විට මේ චරිත අතරට චම්පික රණවකද එක්වීමට උත්සාහ කරමින් සිටියි.

සංකීර්ණ සමාජ අර්බුද විසඳීමට තනි පුද්ගල චරිතවලට නොහැක. එවැනි දේ දැකිය හැක්කේ සිනමා පටවලය. තථ්‍ය ලෝකයේ එවැනි දේ කළ නොහැක. අර්බුදයට පත් ලාංකේය සමාජය විසින් දැන් සැබැවින්ම ඉල්ලා සිටින්නේ ප්‍රගතිශීලී වෙනසකි; සමාජවාදය දෙසට වන වෙනසකි. එය ප්‍රමාදවීම විසින් සිදුකරන්නේ ජනතා පීඩනය ජාතිවාදී හෝ ආගමික අන්තවාදී අන්තයන්ගෙන් පුපුරා යාමය. ජාතිවාදය, අන්තවාදය ක්ෂණිකව සේවය කරන්නේ ධනපති පක්ෂවලටය. ඔවුන් ජාතිවාදය අවුළුවන්නේද ඒ සඳහාමය. එහෙත් සමාජ දේහයේ ගැඹුරේ ඇති තියුණු අර්බුදයට ඒවා පිළියම් නොව, එම අර්බුදය තව තවත් තීව්‍ර කරන සාධකය.



එබැවින් දැන් ලාංකේය දේශපාලනයේ සැබෑ හිඩැස ඇත්තේ වම මූලික කරගත් ප්‍රගතිශීලී හා ප්‍රජාතන්ත්‍රවාදී මහජන ව්‍යාපාරයක් සඳහාය. එය ගොඩනැගෙන තුරු ඒ වෙනුවට විවිධ ඔළුබක්කන් කරළියට එනු ඇත. තනි තනි 'ඔළුබක්කන්' රංගනය නිමා කළ හැක්කේද ප්‍රබල මහජන ව්‍යාපාරයක් ගොඩනැගීමෙනි. මේ මොහොතේ වමේ ප්‍රගතිශීලී හා ප්‍රජාතන්ත්‍රවාදී, මානවවාදී, ජාතිවාද විරෝධී සැමගේ වගකීම එම පුළුල් ජනතා ව්‍යාපාරය ගොඩනැගීමට වහ වහා කටයුතු කිරීමය, ඊට දායකවීමය.

## රටේ අභියෝග...

05 පිටුවෙන්

එකතුකර ගත් පුළුල් ජනතා මධ්‍යස්ථානයක් ගොඩනගන්න අපි බලාපොරොත්තු වෙනවා. එළඹෙන ජනාධිපතිවරණයේදී ජනතා විමුක්ති පෙරමුණ තරග වැදීමට නියමිතව තිබෙන්නේ එවැනි පුළුල් ජනතා මධ්‍යස්ථානයක් මගිනුයි. මේ රටේ දේශපාලන බලයක් අත්පත් කරගැනීමේ අරමුණින් එය ක්‍රියාත්මක වෙනවා. එය ජයග්‍රාහී ලෙස ඉදිරියට ගෙනයාමට හැකි වේයැයි අපි විශ්වාස කරනවා.

## අන්තවාදී ප්‍රහාරයෙන්...

07 පිටුවෙන්

එම වෙළඳාමේ ආදේශක අතරමැදියන් කිසිවක් යෝජනා නොකර හුදු විරෝධතාවයක් ක්ෂණිකව ඇති කිරීමෙන් පාඩු සිදුවන්නේ කාහටද? විශේෂයෙන් එම විරෝධතාවය ආගම්වාදී, ජාතිවාදී ස්වරූපයක් සහිත වූ විටදී එය යළි පෙරළා වාසි සලසන්නේ ආර්ථිකයට නොව අන්තවාදී ආගම්වාදී, ජාතිවාදී කඳවුරටම පමණි.

මෙම 4-21 ප්‍රහාරයට කලින් සිටම බදු බරින්, ණය බරින්, පීඩා විඳිමින් සිටි සාමාන්‍ය ජනතාවට දැන් ජාතිවාදී 'රණකාමීන්ගේ' උමතුවේ 'පරිප්පුවද' කන්නට සිදුවී ඇත. රැකියා විරහිත තරුණයාට උපාධිධාරියාට, අද රැකියා ඉල්ලා පාරට බහින්නට බැරිකර ඇත්තේ 'ජාතික ආරක්ෂාවයි.' ආණ්ඩුව ජාතික ආරක්ෂාවේ වුවමනාව මගින් තමන්ගේ නිල නිවාස ඉදිරිපිට පාර වසා බංකර හදා ගන්නවාට අමතරව, ආර්ථික ප්‍රශ්න යට ගැසීමටද ජාතික ආරක්ෂාව පාවිච්චි කරන බව නොරහසකි. දැන් ඊටත් අමතරව වෙළඳාම වර්ජනය නිසා තමන් නිෂ්පාදනය කරගන්නා දේ විකුණා ගත නොහැකි වන ජනතාවක් මෙන්ම, එම ව්‍යාපාරවලට ආදේශක ව්‍යාපාර නොමැති නිසාම රැකියාවලින් මහපාරට ඇද වැටෙන තවත් ජනතාවක්ද බිහි වෙමින් තිබේ. ඔවුන් මේ මොහොතේ ත්‍රිල් එකට කඩ ගිනි තැබීමේ ක්ෂණික 'මෙහෙයුම්වල' නියැලෙන අතරම වැඩක් නැති නිසාම, ආදායම් මාර්ග සොයා පාතාලයට කුඩු, මත්ද්‍රව්‍ය වෙළඳාමට බැසීමේ ඉඩකඩද ඇති බව මේ ජාතිවාදී ගිනි අවුලවන්නන්ට තේරුම් ගැනීමට නොහැකිය. පටු වාසි නිසා එවැනි දුර දැකීමක් ඔවුන්ට අවශ්‍යද නැත.

### ආර්ථික හානියේ දිග-පළල

දැනට ගණනය කර ඇති තරමට මෙම 4-21 ප්‍රහාරයේ ඍජු ආර්ථික හානිය ඇමෙරිකානු ඩොලර් මිලියන 1500ක් (ඩොලර් කෝටි 150) පමණ වනු ඇතැයි විශ්වාස කෙරේ. මෙහි විශේෂය වන්නේ මේ ප්‍රමාණයද සංචාරක කර්මාන්තය හැර ගණනය කර තිබීමයි. සංචාරක කර්මාන්තය ඍජු ලෙසම වාර්ෂිකව



ඩොලර් බිලියන 4ක ආදායමකි. එහි පාඩුව තව කොපමණ කලක් දක්වාදැයි අප කාටවත් අනාවැකි කිව නොහැකිය. සංචාරක ක්ෂේත්‍රයේ පමණක් ඍජු හා වක්‍ර රැකියා බලපෑම ලක්ෂ 04කට වැඩිවේ.

දැන් ආර්ථිකය හාන්සිය. එය අමතක කරනු සඳහා ජාතිවාදයෙන් ජනතාව පිනවීමේ අපායේ ඉන්ටවල් කාලය පාලකයන් විසින් උදාකර දී ඇත. ජාතිවාදී මඩගොහොරුවේ ගිලී එක්කෝ ඇණ කොටාගෙන අප සැම මිය යා යුතුය. නැතහොත් මේ නරුම නරකාදියෙන් ගැලවීමට අධිෂ්ඨාන කරන අපි හැම ජාතිවාදය පිටුදැක සැබෑ යථාර්ථයට මුහුණ දිය යුතු වෙමු.

## රටේ අනාරක්ෂිතභාවයට...

16 පිටුවෙන්

යුතුයි. මොකද, ඔහුට අත්අඩංගුවට ගෙන පරීක්ෂණ පවත්වා වහා දඬුවම් ලබාදිය යුතුයි. පසුගියදා හදපු තාවකලික ආණ්ඩුවට රිෂාඩ් බදූර්දීන් ඇමතිවරයාගේ පක්ෂයේ මන්ත්‍රීවරු හය දෙනාගේ සහාය ලබාගන්න මහින්ද රාජපක්ෂ කීසැරයක් ඔහුට කතා කරන්න උත්සාහ කළාද කියලා මේ රටට හෙළි කළ යුතුයි. එස්.බී. දිසානායක ඇමතිවරයා කී සැරයක් ඔහුට කතා කළාද? මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා රිෂාඩ් බදූර්දීන්ගේ සහය ලබාගන්න කොයි තරම් උත්සාහ කළාද? එදා රිෂාඩ් බදූර්දීන් ඔවුන්ගේ පැත්තට ආවා නම් ඔහු කොයි තරම් දේශප්‍රේමීද? රිෂාඩ් බදූර්දීන්ගේ මෙම දේශපාලනය පෝෂණය කළේත් මහින්ද රාජපක්ෂ ඇතුළු කණ්ඩායමයි. එනිසා ඔවුන්ගේ තලගෙ ායා කබරගොයා කරන දේශපාලනයට ජනතා විමුක්ති පෙරමුණ සහාය දෙන්නේ නැහැ. රිෂාඩ් බදූර්දීන් තමන්ගේ පැත්තට එනකොට බදා වැළඳගැනීමේත් අනෙක් පිලට යනකොට ඔහුට එරෙහිව ප්‍රහාර එල්ල කිරීමේත් කුමන්ත්‍රණ දේශපාලනයට ජවිපෙ සහාය දෙන්නේ



නැහැ. කෙසේවෙතත් රිෂාඩ් බදූර්දීන්ට එල්ලවෙන චෝදනාවලට ඔහු වැරදිකරු නම් අපි විශ්වාසභංගයට සහාය දෙනවා. ඒ වාගේම ඔහු අත්අඩංගුවට ගෙන නඩු පවරා දඬුවම් ලබාදිය යුතු බවත් අපි ප්‍රකාශ කරනවා."

## මහජන ආරක්ෂාව...

16 පිටුවෙන්

ඉන්න අයට මෙම ගැටුම් අවශ්‍යයි.

ජනතා විමුක්ති පෙරමුණ හැමදාමත් ජාතික සමගිය විශ්වාස කරන පක්ෂයක්. ජාතික සමගිය විනාශ වෙන්න ඉඩ හදන්න එපා. නැවතත් අපේ රටට කළු පැල්ලම් එපා. අපකීර්තිය එපා. ජාතිවාදී ලේ වැගිරීම් එපා. අපි සියලුම දේශපාලන පක්ෂවලින් ඉල්ලනවා, තමන්ගේ ස්ථාවරය පැහැදිලිව රටට කියන්න කියලා. ජනතා විමුක්ති පෙරමුණේ අපි අපේ සාමාජිකයින්ට අපේ ස්ථාවරය පැහැදිලි කරලා තිබෙනවා. පහුගිය කාලයේ අපේ සාමාජිකයින් හමුවෙලා අපි මේ සම්බන්ධයෙන් කරුණු සාකච්ඡා කළා. ඒ වගේ හැම නායකයෙක්ටම තමන්ගේ සාමාජිකයාට තම ස්ථාවරය කියන්න පුළුවන් නම් මෙම බොහෝ ගැටුම් වළක්වාගන්න පුළුවන්. නමුත් අපේ රටේ ඇතැම් නායකයින් මතුපිටින් ජාතික සමගිය ගැන කතා කරමින් යටින් ජාතිවාදය අවුස්සනවා. 21වැනිදා ගලා ගිය ලේ කඳුළු වෙනුවට නැවතත් වෙන වර්ගයක ලේ කඳුළු ඕන නැහැ. සියලු ලේ වැගිරීම් නතර කළ යුතුයි. ඒ නිසා අපි ජනතාවගෙන් ඉල්ලනවා, ජාතිවාදී උගුල්වලට අහුවෙන්න එපා කියලා. ජාතිවාදී ගැටුම්වලින් 'ආතල්' ගන්න එපා. එහි ප්‍රතිඵලය ඉතාම භයානකයි. ජාතිවාදී ගැටුම් මගින් නැවතත් රට තුළ ගැටුම්වලට සරු පසක් හදන්න එපා. රට තුළ නැවතත්



මරාගෙන මැරෙන බෝම්බකරුවන් හදන්න දායක වෙන්න එපා. මෙම ජාතිවාදී ගැටුම් ඇතිවීම වැළැක්වීම සඳහා ජනතා විමුක්ති පෙරමුණ ගත හැකි සියලු ක්‍රියාමාර්ග ගන්නවා."

මෙම අවස්ථාවට ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කමිටු සාමාජික වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයාද සහභාගි විය.

## පසුගිය 21වැනි දින...

13 පිටුවෙන්

**නොකිරිමේ සහ එකී සිද්ධීන් මැඩ පැවැත්වීම සඳහා ගතයුතු නිසි ක්‍රමවේදයන් අනුගමනය නොකිරීම මත ජනතාව සම්බන්ධයෙන් රජය විසින් ඉටුකළ යුතු යුතුකම් වගකීම් නිසි ආකාරයෙන් ඉෂ්ට කිරීම පැහැර හැරීමෙන් සහ 2019.04.21 වන දින ප්‍රහාර මාලාවෙන් පසුව රටෙහි විවිධ ජනවර්ගයන් අතර නොසන්සුන්කාරී තත්වයන් සහ ප්‍රහාරයන්වලට යොමු වීමේ ප්‍රවණතාවයක් තිබියෙදී එකී ප්‍රහාරයන් වළක්වා ගැනීමට කටයුතු නොකළ හෙයින්ද,**

5. එකී පාස්කු ඉරිදා දින ප්‍රහාරයෙන් මසක් ගතවී තිබියෙදී රටෙහි සාමාන්‍ය ආර්ථික ක්‍රියාවලිය නැවත ගොඩනැගීමට අසමත් වී ඇති හෙයින්ද, රටෙහි පාසල් සහ සරසවි අධ්‍යාපන ක්‍රියාවලිය නැවත ගොඩනැගීමට අසමත් වී ඇති හෙයින්ද රාජ්‍ය සහ පුද්ගලික අංශයේ ක්‍රියාකාරීත්වය නැවත යථා තත්වයට පත් කිරීමට අසමත් වී ඇති බැවින්ද ආණ්ඩුවක් වශයෙන් රටෙහි ජනතාව වෙත තමන් විසින් ඉටුකළ යුතු වගකීම් සහ වගවීම් පැහැර හැර ඇති බැවින්ද,

6. 2019.04.21 වන දින ප්‍රහාර මාලාව වැළැක්වීමට අසමත් වූ නිසා මෙන්ම ඉන් පසුවද රටේ ආරක්ෂක තත්වය සහ සිවිල් ජනජීවිතය යථා තත්වයට පත් නොකිරීම නිසා ඇති වී තිබෙන අරාජික තත්වය මත රටේ අභ්‍යන්තර කටයුතුවලට මැදිහත් වීමට විදේශ රාජ්‍යයන්ට ඉඩකඩ හරිමින් ක්‍රියා කර ඇති බැවින්ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සම්බන්ධයෙන් තවදුරටත් විශ්වාස භංගත්වයට පත්ව ඇති බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

1. අනුර දිසානායක
2. විජිත හේරත්
3. නිහාල් ගලප්පත්ති
4. සුනිල් හඳුන්නෙත්ති
5. බිමල් රත්නායක
6. නලින්ද ජයතිස්ස

## මේ මොහොතේ නිවැරදිම...

තරම්වත් නොසලකපු රාජ්‍යයක් බවට මේ පාලකයෝ මේ රාජ්‍ය පත් කළා. ඒ නිසාම මෙම ඝාතනයේ අත් හළ නොහැකි අපරාධකරුවන් ජනාධිපතිවරයා, අග්‍රාමාත්‍යවරයා සහ ආණ්ඩුවයි. මෙය තොරතුරු නොසැපයීම, බුද්ධි අංශයේ දුබලතාව නිසා නොවෙයි ඇති වුණේ. මේක මහා රහස්‍ය ප්‍රහාරයක් නොවෙයි. මේ මතුපිට තලයේ ඕනෑවටත් වඩා වැඩියෙන් සාකච්ඡාවට බඳුන් වෙමින් තිබුණු, ඕනෑවටත් වඩා වැඩියෙන් වඩා වැඩියෙන් තොරතුරු එක් රැස් වී තිබුණු, ඝාතනයක් නිදැල්ලේ ඉටුවන්නට මේ පාලකයෝ ඉඩ දුන්නා. ඒක මේ රටේ ජනතාව තේරුම් ගත යුතුයි.

දෙවෙනි කාරණය, මේ ප්‍රහාරයේ අපරාධකරුවන්, මම විශේෂයෙන් මුස්ලිම් නායකයන්ටයි කියන්නේ. ඔයගොල්ල මුස්ලිම් ජනතාවත් සමග දේශපාලනය කළේ නැහැ. ඔයගොල්ල ආණ්ඩුත් සමග බිස්නස් කළා. එහෙම කළේ නැද්ද? මේකයි කළේ. ඔයගොල්ල මුස්ලිම් ජනතාවගේ ඡන්දයෙන් බිස්නස් කළා. ඔයගොල්ලන්ට මුස්ලිම් ජනතාවත් සමග දේශපාලනයක් තිබුණාද? කොහොමද ජාතික ඒකාග්‍රතාව නිර්මාණය කර ගන්නේ? කොහොමද අපි එක රටක ජීවත් වෙන්නේ? කොහොමද අපි ජාතික සමගිය නිර්මාණය කරන්නේ? ඒ සඳහා මුස්ලිම් ජනතාවගේ පාර්ශ්වයේ වගකීම මොකක්ද? ඒ සඳහා මුස්ලිම් ජනතාව මෙහෙය විය යුත්තේ කෙසේද කියන කාරණා ඔබ ඉටු කළ යුතුව තිබුණා. ඔබ එය ඉටු කළේ නැහැ. ඔබ බිස්නස් කළා. ඔබ මුස්ලිම් ජනතාව එහෙට මෙහෙට විකුණන, තමන්ගේ ඡන්ද මල්ලට දමාගෙන shopping යන මෙවලමක් බවට විතරක් පත් වුණා. ඒ අනුව මුස්ලිම් ජනතාව වෙත ගෙන යා යුතු නිවැරදි දේශපාලනය ගියේ නැහැ. ඒ වෙනුවට ඔබ තමන්ගේ බලය වෙනුවෙන් විටෙක ජාතිවාදය වැපිරුවා.

ඒ ජාතිවාදය තමන්ටත් මෙහෙයවා ගන්නට බැරි තරම දක්වා තරුණ කණ්ඩායම් අතර ව්‍යාප්ත වුණා. දැන් තමන්ටත් මෙහෙයවා ගන්නට බැහැ. තමන් විසින්ම කැඳවන ලද භූතයා තමන්ටම බෝතලයට දමා ගන්න බැරි තත්වයට තමයි රවුෆ් හකීම් අමාත්‍යවරයාත්, රිසාඩ් බදියුදීන් අමාත්‍යවරයාත් අද පත්වී සිටින්නේ. මේ භූතයා කැඳෙව්වේ තමන්. මේ භූතයාට ආරක්ෂාව දුන්නේ තමන්. මේ භූතයා බෝතලෙයන් එළියට ගත්තේ තමන්. හැබැයි, දැන් තමන්ටත් මේ භූතයා බෝතලයට දමා ගන්න බැහැ. මම අද කියන්නම්. පටන් ගත්තේ කතෝලික, ක්‍රිස්තියානි ජන කොට්ඨාසය ඉලක්ක කරගෙන වෙන්න පුළුවන්. හැබැයි, මේක කෙළවර වන්නේ තමුන්නාන්සේලාත් පොඩි පට්ටම් කරගෙන බව මතක තබා ගන්න.

මුස්ලිම් සමාජය තීරණය කරන්න ඕනෑ. මේ විකෘති, උමතු කලලයට වර්ධනය වෙන්න දෙනවාද, විනාශ කරනවාද කියලා. ඒක ඔබ තීරණය කරන්න. මේක කිසිසේත්ම ආරක්ෂක ක්‍රියාවලියකින් විතරක්, අනෙකුත් පොදු ජනතාවගේ මැදිහත්වීමකින් විතරක් පාලනය කරන්න බැහැ. මේක විනාශ කළ හැකි වන්නේ, එය නිර්මාණය කරන ලද ගර්භාෂයේම අයිතිකරුවන් සූදානම් නම් විතරයි. මා කිසිසේත්ම යෝජනා කරන්නේ නැහැ, ගර්භාෂය විනාශ කරන්න කියා. බැහැයි මම යෝජනා කරන්නේ, ඒ ගර්භාෂයේ සිටින විකෘති කලලය, උමතු කලලය විනාශ කළ යුතුයි කියායි. ඒ විකෘති, උමතු කලලය විනාශ කරන්න මුස්ලිම් සමාජයටත් අත්හළ නොහැකි වගකීමක් තිබෙනවා කියා මා විශ්වාස කරනවා.

ඊළඟට පොදු සමාජයටත් වගකීමක් තිබෙනවා. මේ වෙලාවේ ජනප්‍රියතම දේශපාලනය මොකක්ද? හැමදාමත් ජනප්‍රියතම දේශපාලනය නිවැරදි දේශපාලනය වෙන්නේ නැහැ. දැන් ජාතිවාදය ජනප්‍රියතම දේශපාලනය බවට පත් වෙමින් තිබෙනවා. ඒකට දැන් පොරයක් තිබෙනවා. සිංහල ජන ප්‍රජාව ඇතුළේ ජනප්‍රියම දේශපාලනය සිංහල ජාතිවාදයයි. ඒ වාගේම, දෙමළ ප්‍රජාව ඇතුළේ ජනප්‍රියම දේශපාලනය දෙමළ ජාතිවාදයයි. මුස්ලිම් ප්‍රජාව ඇතුළේ ජනප්‍රියතම දේශපාලනය මුස්ලිම් ජාතිවාදයයි. අද ජාතිවාදය මේ සැම ජන කොට්ඨාසයක් ඇතුළේම ජනප්‍රියතම දේශපාලනය බවට පත් වෙමින් තිබෙනවා. හැබැයි, එක් අන්තවාදයක් පරාජයට පත් කළ හැකි වන්නේ තවත් අන්තවාදයක් පෝෂණය කිරීමෙන් නොවයි. අන්තවාදයකට පිළිතුර අන්තවාදය නොවෙයි. මේ නිශ්චිත මොහොතේ අසීරුතම, අමාරුම දේශපාලනය තමයි, ජාතික සමගිය. ඒ අසීරුතම අවධියේ වුණත්, ජාතික සමගියත්, සියලු ප්‍රජාවන්ගේ ආරක්ෂාවත්, සියලු ප්‍රජාවන්ගේ අයිතීන් වෙනුවෙනුත් ජනතා විමුක්ති පෙරමුණේ අපි පෙනී සිටින්න සූදානම්. එතැනට අපි පොදු ජනයා ගෙන යා යුතුයි.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com


# රටේ අනාරක්ෂිතභාවයට මෛත්‍රී-රනිල් ආණ්ඩුව වගකිව යුතුයි

## ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා

ජනාධිපතිවරයා, අගමැතිවරයා, කැබිනට් මණ්ඩය ප්‍රමුඛ පාලකයින්ට තවදුරටත් රට පාලනය කිරීමට සදාචාරාත්මක අයිතියක් නොමැති බවටත් ජනතාව ගැන කිසිදු වගකීමක් නැති පාලකයින් කණ්ඩායමක් රට පාලනය කිරීම රටේ ජනතාවට හිතකර නොවන බවටත් චෝදනා කළ ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා එම තත්වය තුළ පාස්කු දින ත්‍රස්ත ප්‍රහාරයට මාසයක් පිරෙන දින ආණ්ඩුවට එරෙහි විශ්වාසභංගයක් පාර්ලිමේන්තුවට භාරදීමට පියවර ගන්නා බව ප්‍රකාශ කළේය.

ඔහු මේ බව පැවසුවේ පසුගිය 20වැනි දින පැලවත්ත ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය සාකච්ඡාවකදීය. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර දිසානායක සහෝදරයා මෙසේද කියා සිටියේය.

"රටේ අනාරක්ෂිතභාවයක් ඇතිකිරීම පිළිබඳවත් 21 ප්‍රහාරයෙන් පසුව රට මේ වනතෙක් ස්ථාවර කිරීමට නොහැකි වීම පිළිබඳවත් මෛත්‍රී-රනිල් ඇතුළු ආණ්ඩුව සම්පූර්ණයෙන් වගකිව යුතුයි. ඒ වගේම මේ ආණ්ඩුව තවදුරටත් රට පාලනය නොකළ යුතු බවට සමාජයේ කතාබහක් ඇතිවෙලා ඉවරයි. එම නිසා අපි සියලුම දේශපාලන පක්ෂවලින් පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු මන්ත්‍රීවරුන්ගෙන් මෙම විශ්වාසභංගයට සහාය ලබාදෙන්න කියලා ඉල්ලීමක් කරනවා."

මෙහිදී මාධ්‍යවේදීන් නැගූ ප්‍රශ්නවලට



පිළිතුරු ලබාදෙමින් අනුර දිසානායක සහෝදරයා මෙසේ පැවසීය.

"රිෂාඩ් බදුර්දීන් ඇමතිවරයාට එරෙහිව ගෙන එන චෝදනා සත්‍ය නම් ඒවා විශ්වාසභංගයකට පමණක් සීමා විය යුතු නැහැ. විශ්වාසභංගය ඉදිරිපත් කරන කණ්ඩායම ඔහුට එරෙහිව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිල්ලකුත් කළ 15 වැනි පිටුවට

# මහජන ආරක්ෂාව තහවුරු වන්නේ ජාතික සමගියෙන් පමණයි

## ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා

රටේ ජනතාව තවමත් භීතියෙන් සහ අනාරක්ෂිතභාවයෙන් පසුවන බවත් ඔවුනට සැකය ඉවත් කර සාමාන්‍ය පරිදි ජීවත් වීමට අවශ්‍ය වී ඇති බවත් පෙන්වා දුන් ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ සියලුම ජනතාව අතර සහ සියලු ආගම් අතර සමගිය ගොඩනැගිය හැක්කේත් මහජන ආරක්ෂාව තහවුරු කළ හැක්කේත් ජාතික සමගිය ගොඩනැගීමෙන් පමණක් යැයි අවධාරණය කළේය.

ටිල්වින් සිල්වා සහෝදරයා මෙම අදහස් පළ කළේ ප්‍රදේශ කිහිපයක පැතිර ගිය ජාතිවාදී ගැටුම් පිළිබඳව කරුණු දැක්වීම සඳහා පසුගිය 14වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුවේදීය. ටිල්වින් සිල්වා සහෝදරයා එහිදී වැඩිදුරටත් මෙසේද පැවසීය.

"ඇතැම් ජාතිවාදීන් ජනතාව කුපිත කරන්න ප්‍රවෘත්ති නිර්මාණය කරනවා. ඇතැම් දේශපාලඥයන් තමනගේ පටු අරමුණු වෙනුවෙන් බොරු ප්‍රවෘත්ති නිර්මාණය කරනවා. ඇතැම් මාධ්‍ය තමන්ගේ දේශපාලන ව්‍යාපෘති වෙනුවෙන් විවිධ ප්‍රවෘත්ති පළ කරනවා. ආණ්ඩුව කළ යුත්තේ නිවැරදි සත්‍ය තොරතුරු ජනතාවට ලබා දීමයි. ආණ්ඩුව තමන්ගේ වගකීම නිවැරදි ලෙස ඉටු නොකළ නිසා තමයි සති තුනක් ගතවීමෙන් පසුවත් තත්වය



සාමාන්‍ය වෙන්න තිබියෙදී නැවත ගැටුම් නිර්මාණය වෙන්නේ. ඒ වගේම මෙම ජාතිවාදී ගැටුම් අවශ්‍ය පිරිසක් ඉන්නවා. තමන්ගේ දේශපාලන අරමුණු ඉටුකරගන්න, රට අරාජිකයි කියලා පෙන්වන්න, ඊළඟ තමන්ගේ බලය තහවුරු කර ගන්න බලාපොරොත්තුවෙන් 15 වැනි පිටුවට

# අප්‍රේල් 21 ප්‍රහාරයෙන් පසුවත් ආණ්ඩුවේ නාස්තිකාර වියදම්වල අඩුවක් නැහැ

## ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා

අප්‍රේල් 21 ප්‍රහාරයෙන් පසුව ජනතාව තමන්ගේ ආර්ථික අපහසුතා දරාගෙන සිටියෙදී ආණ්ඩුව ඇමතිවරුන්ගේ නාස්තිකාර වියදම් හා අනවශ්‍ය උත්සව වියදම් කපා හැරිය යුතුව තිබෙන නමුත් ආණ්ඩුව තමන්ගේ පුරුදු නාස්තිකාර වියදම් එලෙසම කරගෙන යන බවට ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා චෝදනා කළේය.

ඔහු මේ බව කියා සිටියේ පසුගිය 27වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලද මාධ්‍ය හමුවකට එක්වෙමිනි. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ විජිත හේරත් සහෝදරයා මෙසේද පැවසීය.

"ආණ්ඩුව අලුත් පවුල් ලක්ෂ හයකට සමෘද්ධි සහන ලබාදීමේ ව්‍යාපෘතියක් සැලසුම් කර තිබෙනවා. මේ වනවිටත් රටේ සමෘද්ධි පවුල් ලක්ෂ 14ක් ඉන්නවා. ආණ්ඩුවේ ව්‍යාපෘතියෙන් පෙනෙන දේ තමයි රටේ දුප්පත්කම තවත් වැඩිවෙලා කියන එක. රටේ ආර්ථිකය හොඳනම් දුප්පත්කම තුරන් වෙනවා නම් සමෘද්ධි ලබන පවුල් ගණන අඩුවිය යුතුයි. ජනාධිපතිවරයා ඇතුළු ආණ්ඩුව පහුගිය වසර දිළිඳුකම පිටුදැකීමේ වසර කියලා නම් කළා. ඇත්තටම සිදුවෙලා තිබෙන්නේ දිළිඳුකම වැඩිවීමයි. ඒ නිසා තවත් පවුල් ලක්ෂ හයක් සමෘද්ධිලාභී පවුල් අතරට එකතු වෙලා. ඒ සඳහා ආණ්ඩුව ගත්ත ණයවලින් රුපියල් බිලියන 10ක් වෙන්කරලා තිබෙනවා.


ආණ්ඩුව මෙම සමෘද්ධි ප්‍රතිලාභ බෙදාදීමට සැලසුම් කොට තිබෙන ක්‍රමවේදය මගින් නාස්තිකාර වියදම් වැඩිවෙලා. මේ උත්සව වියදම රු. මිලියන 300ක් වෙනවා. මෙහි රාජ්‍ය උත්සවය අම්පාරේදී මැයි 30වැනිදා පැවැත්වීමට නියමිතයි. ඊට සමගාමීව උත්සව 25ක් දිස්ත්‍රික්කවල සැලසුම් කොට තිබෙනවා. එම උත්සවවල එක වේදිකාවකට පමණක් ලක්ෂ 42ක් ඇස්තමේන්තු කොට තිබෙනවා. එනම් එම උත්සවවල වේදිකාවලට පමණක් ලක්ෂ 1,000ක මුදලක් වැයවෙනවා. ටීෂර්ට්වලට රුපියල් ලක්ෂ 700ක මුදලක්ද වැයවෙලා. මෙම උත්සවයේ උපදෙස් පත්‍රිකා, සහතික පත්‍ර මුද්‍රණයට, ප්‍රචාරක සහ සංග්‍රහ වියදම් සියල්ලටම රුපියල් මිලියන 180ක් වෙන්කොට තිබුණත් දැන් එම මිලියන 180 ප්‍රමාණවත් නොවන බව කියලා තවත් මුදලක් වෙන්කරගන්න නියමිතයි. එම මුදල් ලැබෙන තුරු සමාජ ආරක්ෂණ අරමුදලෙන් මුදල් ලබාගන්න ආණ්ඩුව උපදෙස් දීලා තිබෙනවා. සමාජ ආරක්ෂණ අරමුදල කියන්නේත් සමෘද්ධි ප්‍රතිලාභීන්ගෙන් රුපියල් සියයක මුදලක් නැවත ආණ්ඩුවට අයකරගෙන ස්ථාපිත කර ඇති අරමුදලක්. දැන් මේ ආණ්ඩුව මේ නාස්තිකාර වියදම් සඳහා යොදා ගන්නේ සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ අරමුදලයි. ඒ නිසා මෙම නාස්තිකාර වියදම් වහාම නතර කළ යුතුයි.

එදා වගේම අදත් කරන්නේ මේ වගේ නාස්තිකාර වියදම්. එදා බැසිල් රාජපක්ෂලා සමෘද්ධි බැංකුවල අරමුණුවලට පටහැණිව විශාල නාස්තියක් සිදුකර තිබෙන බව විගණන වාර්තාවල පැහැදිලිව සඳහන් වෙනවා.

මෙම සමෘද්ධි ප්‍රතිලාභ ලබාදීම සිදු කරන්නේ එක්සත් ජාතික පක්ෂය ඉදිරියේ පැවැත්වෙන ජනාධිපතිවරණය ඉලක්ක කරගනිමින්. ලක්ෂ්මන් කිරිඇල්ල



මන්ත්‍රීවරයා පාර්ලිමේන්තුවේදී පිළිගත්තා පහුගිය ආණ්ඩුව ඒ අයගේ ඡන්දදායකයින්ට සමෘද්ධි ලබාදුන්න නිසා දැන් එ.ජා.ප. පාක්ෂිකයින්ට සමෘද්ධි ලබාදෙනවා කියලා. තමන්ගේ පක්ෂයේ අයට බෙදාගන්න එකද සමෘද්ධි ප්‍රතිලාභවලින් කරන්නේ? එතකොට එක්සත් ජාතික පක්ෂයේ විතරද දුප්පත් අය ඉන්නේ? මේක සදාචාර විරෝධී අයුක්තිසහගත වැඩක්."






ජාතික සමඟිය වෙනුවෙන් රොද බැඳ... - කළුතරදී



ආණ්ඩුවට එරෙහි විශ්වාසභංගය භාරදී...




ජාතික සමඟිය වෙනුවෙන් සත්‍යග්‍රහයක - කොළඹදී...



නැගෙනහිර දමිළ සංවිධාන සමඟ සකච්ඡා...



මුස්ලිම් සංවිධාන සමඟ සකච්ඡා...




දැයේ දරුවන්ගේ නෙත් පාදමින්...


බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.